# කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ජාතික රූපවාහිනිය හරහා විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරය : කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්

එම්.ඩී. සුසිලා ලූර්දු
ආර්.එල්.එන්. ජයතිස්ස



8·4

HARTI

2015/11

# කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ජාතික රූපවාහිනිය හරහා විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරය : කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්

එම්.ඩී. සුසිලා ලුර්දු

ආර්.එල්.එන්. ජයතිස්ස

MFN 11524

සිංහල පර්යේෂණ වාර්තා : අංක 52 2013 ජනවාරි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ – 07.

24092

24092

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

ප්‍රථම මුද්‍රණය : 2013 ජනවාරි

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි

ISBN :978-955-612-140-7

කවර නිර්මාණය හා පිටු සැකසුම : ඒ.පී. උදේනි කරුණාරත්න

# පෙරවදන

කෘෂිකර්මාන්තයේ නියැළෙන්නන් හට කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ලබාදීමත්, කෘෂිකාර්මික අංශය සඳහා පෙළඹුමක් ඇති කිරීමත් අරමුණු කරගනිමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ජාතික රූපවාහිනිය හරහා කෘෂිකාර්මික වැඩසටහන් සම්පාදනය කර ඉදිරිපත් කෙරේ.

කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරය සොයා බැලීමේ අරමුණ ඇතිව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදු කළ මෙම අධ්‍යයනය හරහා ගොවි ප්‍රජාව විසින් කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ ද, එසේ නැරඹීමෙන් ඔවුන්ගේ වගා කටයුතු සඳහා යම් ප්‍රයෝජනයක් ලබා ගන්නේ ද, එසේ ම මෙම වැඩසටහන් හි අන්තර්ගතය පිළිබඳ ගොවීන්ගේ කැමැත්ත කෙසේ ද හා නව වැඩසටහන් සඳහා ගොවීන්ගේ යෝජනා කවරේ ද යන්න පිළිබඳව පර්යේෂණාත්මක ව විමර්ශනය කර ඇත.

විවිධ බෝග වගා කරන ගොවීන්ගේ ප්‍රතිචාරයන් ලබාගැනීමේ අරමුණ සහ මෙම වැඩසටහන් වඩාත් හොඳින් දර්ශනය වීම යන කාරණා සැපිරෙන පරිදි අධ්‍යයනය සඳහා දත්ත සපයා ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරා ගෙන ඇති අතර අධ්‍යයන දත්ත තුළින් අනාවරණය වන පරිදි ප්‍රදේශයේ රූපවාහිනිය නරඹන ගොවීන්ගෙන් 75%ක් ම කෘෂිකාර්මික වැඩසටහන් නරඹා තම ගොවිතැන් කටයුතු සඳහා ඉන් ප්‍රයෝජන ලබාගෙන ඇත. නමුත් මෙම වැඩසටහන් විකාශය වන වේලාවත්, කාල පරාසයත්, පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරය යහපත් නොවන අතර එය වැඩසටහන් නැරඹීමට පවතින බාධාවක් ද වී ඇත.

ගොවීන් දෛනික කාර්ය බහුලත්වයෙන් මිදෙන වේලාවන් හි වැඩසටහන් විකාශය කිරීමත්, විකාශන කාල පරාසය දීර්ඝ කිරීමත්, ජාතික නාලිකාවේ කෘෂි වැඩසටහන් විකාශය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් කළ යුතු බවටත් විකාශන කාලය තුළ ප්‍රේක්ෂක අවධානය සිඳෙන වාතාවරණයන් අවම කිරීමත් තුළින් කෘෂිකාර්මික වැඩසටහන් හි ප්‍රයෝජනවත්භාවය තවදුරටත් තීව්‍ර කරගත හැකි බවත්, එසේම අන්තර්ගතය සඳහා නවාංග ඇතුළත් කිරීම හරහා ගොවීන් තවදුරටත් ආකර්ෂණය කර ගැනීමේ ක්‍රමයක් සකස් කර ගත යුතු බවටත්, අධ්‍යයනය විසින් නිර්දේශ කරනු ලබන අතර කෘෂිකාර්මික සන්නිවේදනය සඳහා සිදු කෙරෙන ප්‍රතිපත්තිමය කාර්යයන් සම්පාදනය සඳහා මෙම අධ්‍යයන වාර්තාව විසින් අනාවරණය කර ඇති ගොවීන්ගේ ප්‍රතිචාරයන් වඩාත් ඉවහල් වනු ඇතැයි මම අපේක්ෂා කරමි.

**නීතිඥ ලලිත් කාන්ත ජයසේකර**
**අධ්‍යක්ෂ**

## ස්තුතිය

මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා මූල්‍ය හා ආයතනික ප්‍රතිපාදනයන් සපයා දුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ, නීතීඥ ලලිත් කාන්ත ජයසේකර මහතාටත්, පර්යේෂණය සිදු කිරීමේදීත්, එය ප්‍රකාශනයක් ලෙසින් එළිදැක්වීමේදීත් ඊට අවැසි පරිපාලනමය පහසුකිරීම් සපයමින් අප දිරිමත් කළ අතිරේක අධ්‍යක්ෂ(පර්යේෂණ) ආචාර්ය එල්. පී. රූපසේන මහතාටත්, නිරන්තර ව අවශ්‍ය උපදෙස් හා සහයෝගය ලබා දුන් කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම් අංශයේ ප්‍රධාන, අධිපර්යේෂක, ජේ .කේ. එම්. ඩී. චන්ද්‍රසිරි මහතාටත්, අපගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමේ.

විෂයානුබද්ධ දැනුම සපයමින් වාර්තාව කියවා බලා සදොස් තැන් නිදොස් කළ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී පී.ආර්.වීරක්කොඩි මහත්මියටත් පර්යේෂණය සාර්ථක කරගැනීමට නන් අයුරින් සහයෝගය සැපයූ එස්. ඇපාසිංහ මහතාත් ස්තුති පූර්වකව සිහිපත් කෙරේ.

කොළඹ විශ්ව විද්‍යාලයේ, ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ඩබ්. විමලරතන හිමියන් විසින් අධ්‍යයනයේ අවසන් කෙටුම්පත සඳහා අදහස් හා යෝජනා ලබා දෙමින් දැක් වූ සහායට ද අපගේ කෘතඥතාවය හිමි වේ.

ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කිරීමේ දී පැවරූ රාජකාරිය ඉතාමත් වගකීමෙන් නොපිරිහෙළා ඉටුකරමින් තම උපරිම දායකත්වය සැපයූ සංඛ්‍යාන නිලධාරිණී සන්ධ්‍යා සේනානායක මහත්මියට අපගේ හෘද්‍යාංගම ස්තුතිය පිදෙන අතර ක්ෂේත්‍රයේ තොරතුරු රැස්කිරීමෙහි නියැළුණු පර්යේෂණ සහකාර, දත්ත සැකසුම් අංශයේ එස්.ජේ.එස්. රෝසා, අනියම් විමර්ශිකාවක් වන සඳමාලි හේරත් සහ හිරන්‍යා ද සිල්වා යන මහත්ම මහත්මීන්ටත්, අපගේ ස්තුතිය පිරිනැමේ.

දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කිරීමේ දී සහය ලබාදුන් ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන සහ දත්ත විශ්ලේෂක එම්.එල්.ඩී. සෙනරත් මහතාටත්, නිරෝෂා ප්‍රේමවර්ධන මහත්මියටත් අපගේ ස්තුතිය පිරිනැමේ. වාර්තාවේ පරිගණක කටයුතු සිදු කළ උදේනි කරුණාරත්න සහ මනෝජා තුෂාරි යන මහත්මීන්ටත් වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කළ ප්‍රකාශන ඒකකයේ වැඩබලන ඒකක ප්‍රධාන සී.යූ සේනානායක මහතාටත්, වාර්තාව මුද්‍රණය කිරීම සිදු කළ මුද්‍රණ ඒකකයේ කාර්ය මණ්ඩලයටත්, අපගේ ස්තුතිය පුද කෙරේ.

**එම්.ඩී. සුසිලා ලුර්දු**
**ආර්.එල්.එන්. ජයතිස්ස**



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

## සංක්ෂේපය


කෘෂිකර්මාන්තයේ නියැළෙන්නන් හට ජනමාධ්‍ය භාවිතා කරමින් කෘෂි දැනුම හා තොරතුරු ලබාදීම අරමුණු කර ගනිමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රව්‍ය-දෘශ්‍ය යන දෙයාකාරයෙන් යුත් රූපවාහිනිය හරහා කෘෂිකාර්මික වැඩසටහන් දෙකක් ඉදිරිපත් කෙරේ. ගොවි ප්‍රජාවට මෙන් ම ගොවිතැනට උනන්දුවක් දක්වන පුද්ගලයින් හට කෘෂිකර්මාන්තය තුළ දිනෙන් දින ජනනය වන නව තාක්ෂණික දැනුමත්, කාලීනව වැදගත්වන කෘෂිකාර්මික තොරතුරුත්, අදාළ කාලය තුළදී ම ලබාදීමත්, එසේ ම ස්වකීය දැනුමත්, කෘෂිකාර්මික ආයතන හරහා ලබාගත් දැනුමත් ඒකරාශී කරගනිමින් කෘෂිකර්මාන්තය තුළ සාර්ථකත්වයට පත් වූ පුද්ගලයින්ගේ අත්දැකීම් ගොවි ප්‍රජාව වෙත ලබාදීම හරහා කෘෂිකර්මාන්තය කෙරෙහි පෙළඹවීමක් ඇති කිරීමත්, මෙම කෘෂිකාර්මික වැඩසටහන් තුළින් අපේක්ෂා කෙරේ. වාර්ෂික ව ඉහළ මූල්‍ය පිරිවැයක් දරමින් ගොවී ප්‍රජාව වෙනුවෙන් සිදු කෙරෙන මෙම කාර්යය පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර, විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය මත ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන “ගොවි බිමට අරුණළු” සහ “මිහිකත දිනුවෝ” යන කෘෂිකාර්මික වැඩසටහන් පාදක කරගනිමින්, ගොවීන්ගෙන් කෙතරම් ප්‍රමාණයක් මෙම වැඩසටහන් නරඹන්නේ ද, එසේ ම වැඩසටහන් ඉදිරිපත් කෙරෙන ආකාරය පිළිබඳ ගොවීන්ගේ කැමැත්ත කුමනාකාර ද, වැඩසටහන් හරහා ගොවීන් ලබාගත් දැනුමේ ප්‍රයෝජනවත්භාවය, කෙසේ ද, වැඩසටහන් නැරඹීමේ දී පවතින බාධාවන් කවරේ ද, එමෙන් ම මෙම වැඩසටහන් ඵලදායකවීමට ගොවීන්ගේ යෝජනා කවරේ ද, යන්න පිළිබඳව ගොවි ප්‍රතිචාර විමසා බැලීම අධ්‍යයනයේ අරමුණු විය.

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ගොවීන්ගේ ප්‍රතිචාරයන් හා සම්බන්ධ වන බැවින් ජාතික රූපවාහිනිය වඩාත් හොඳින් දර්ශනය වන හා විවිධ දේශගුණික තත්ත්වයන් සහිත විවිධ බෝග වගා කළ හැකි යන නිර්ණායකයන් පිළිබඳ සැලකිලිමත් වෙමින් කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරාගෙන ඇති අතර එයට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 11ක් ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා උපයෝගී කරගන්නා ලදි, බහු පියවර නියැදි ක්‍රමයට නියැදිය තෝරාගත් අතර අදාළ දිස්ත්‍රික්කයේ දේශගුණික කලාප තුනට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාවට සමානුපාතික වන සේ තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 11ක කෘ.ප.නි.ස. වසම් 22කට අයත් ගොවීන් 330න් සමන්විත වූ නියැදියක් වෙත ඉදිරිපත් කරන ලද ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් අධ්‍යයනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත සපයා ගන්නා ලදී,

ද්විතියික දත්ත සඳහා සාහිත්‍ය විමර්ශනය හා කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කිරීම හා සම්බන්ධ නිලධාරීන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකයට අයත් වෙනත් අදාළ නිලධාරීන් හා සිදු කළ සාකච්ඡා තුළින් තොරතුරු සපයා ගන්නා ලදී,

අධ්‍යයනයෙන් හෙළි වූ කරුණුවලට අනුව, ප්‍රදේශයේ ජාතික රූපවාහිනී නාලිකාව නරඹන ගොවීන්ගෙන් 75%ක් ම කෘෂිකාර්මික වැඩසටහන් නරඹති. වැඩසටහන් නරඹන්නේ නැති ගොවීන්ගෙන් 78%ක් ඊට දැක් වූ ප්‍රධාන හේතුව වූයේ, නිවසේ සහ දරුවන්ගේ කටයුතුවලට බාධා වන බැවින් රූපවාහිනී වැඩසටහන් නැරඹීමෙන් වැළකී සිටින බවයි. වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 86%ක් ම මෙම වැඩසටහන් පිළිබඳ මුළින් ම දැනුවත් වී ඇත්තේ, වෙනත් වැඩසටහන් නැරඹීමට රූපවාහිනිය ක්‍රියාත්මක කරන විට

අහම්බෙන් වන අතර, ප්‍රදේශයේ කෘ.ප.නි.ස.වරයාගෙන් සහ අසල්වැසි ගොවීන්ගෙන් දැනුවත් වූ ගොවීන් ද සිටියහ.

කෘෂිකාර්මික වැඩසටහන් "නිතරම"(33%) සහ "කලාතුරකින්" (26%) නරඹන ගොවීන්ට සාපේක්ෂව "ඉඳහිට" නරඹන සංඛ්‍යාව(41%) ඉහළ ය. එසේ ම වැඩසටහන් අතරින් "ගොවි බිමට අරුණළු" වැඩසටහන සමස්ත ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් (34%) නරඹති.

මෙම වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරය විමසීමේ දී ගොවීන්ගෙන් 80%ක් සඳහන් කළේ, වැඩසටහන් හි භාවිතා කරන භාෂා ශෛලිය, ඉදිරිපත් කරන කරුණු, ඉදිරිපත් කිරීමේ විලාසය වඩාත් සුදුසු බවයි. වැඩසටහන් තුළ සංශෝධනයට ලක් කළ යුතු අංගයන් ලෙසින් ගොවීන් වැඩි ප්‍රතිචාරයක් දැක්වූයේ වැඩසටහන් හි විකාශන වේලාව හා විකාශන කාල පරාසයයි. එනම් පිළිවෙළින් "ගොවි බිමට අරුණළු" සඳහා 76%ක් ද "මිහිකත දිනුවෝ" සඳහා 84%ක් ද වශයෙනි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයක් නොමැති වුවත් ජාතික රූපවාහිනිය හරහා විකාශය වන බැවින් හා ගොවීන්ගේ ප්‍රතිචාර පැවති බැවින් ඉහත සඳහන් කළ ප්‍රධාන කෘෂි වැඩසටහන් දෙකට අමතරව විකාශය වන වැඩසටහන් දෙකක් ගැන ද ගොවි ප්‍රතිචාර විමසා බැලිණි. ඒ අනුව, "රිවිදින අරුණැල්ල" සහ "සැගවුණු කතාවනු" යන වැඩසටහන් දෙකෙහි ද වේලාව හා කාල පරාසය සංශෝධනය කළ යුතු බවට පිළිවෙළින් "රිවිදින අරුණැල්ල" සඳහා 69%ක් ද සහ "සැගවුණු කතාවනු" සඳහා 71%ක් ද වශයෙන් ප්‍රතිචාර දක්වා තිබිණි.

ප්‍රතිචාර දැක් වූ ගොවීන් සියලුදෙනාට ම එය ප්‍රයෝජනවත් වී ඇති අතර "වඩාත් ප්‍රයෝජනවත්" යැයි කියූ පිරිස 35%ක් වන අතර "ප්‍රයෝජනවත්" යැයි කියූ පිරිස 65%කි. ප්‍රයෝජනවත් වූ ආකාරය විමසීමේ දී බෝග වගා කිරීමේ දී විවිධ වූ වගා ක්‍රමයන් අත්හදා බැලීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත් මෙම වැඩසටහන් නැරඹීමෙන් ලද දැනුම ප්‍රයෝජනවත් වූ බවට ගොවීන්ගෙන් 88%ක් ප්‍රතිචාර දැක් වූ අතර, කාබනික පොහොර නිෂ්පාදනය හා යෙදීම පිළිබඳ දැනුම ලැබුණු බවට 75%ක් සහ වගාවන්ට වැළඳෙන පළිබෝධ හා රෝග පාලනය සඳහා දැනුම ලැබුණු බවට 69%ක් ප්‍රතිචාර දැක්වූහ.

වැඩසටහන් විකාශය වන වේලාවන්හි නිවසේ කාර්ය බහුලභාවය වැඩිවීම නිසා වැඩසටහන් නැරඹීමට අවකාශ නොලැබීම(96%), දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවලට බාධා වීම(91%), අතරතුර කාලයේ වෙළඳ දැන්වීම් ප්‍රචාරය(74%) වැනි කරුණු වැඩසටහන් නැරඹීමේ දී පවතින බාධාවන් ලෙස ගොවීහු සඳහන් කළහ.

ගොවීන්ගෙන් 98%ක ගේ අදහස වූයේ, වැඩසටහන් ඵලදායක වීමට නම් එම වැඩසටහන් රාත්‍රී 9.00-10.00 අතර විකාශය වීම සුදුසු බවයි. එසේ ම 95%ක් සඳහන් කළේ, කාලපරාසය ද විනාඩි 15 ට වඩා දීර්ඝ කළ යුතු බවයි.

අධ්‍යයන සොයා ගැනීම් අනුව නිගමනය කළ හැකි වන්නේ, අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන් වැඩි පිරිසක් කෘෂිකාර්මික වැඩසටහන් නරඹන බවත් එසේ නරඹා තම ගොවිතැන් කටයුතු සඳහා දැනුම හා තොරතුරු ලබා ගන්නා බවත් ය. නමුත් වැඩසටහන් හි විකාශන වේලාව හා කාල පරාසය පිළිබඳ ගොවීන් තෘප්තිමත් නොවන අතර, වැඩසටහන් ගැන ගොවීන් අහම්බෙන් දැනුවත් වීමක් මිස ඔවුන් ව දැනුවත් කිරීමේ ක්‍රමයක් ද නොපවතින බව පෙනුණි. එසේ ම ගොවීන්ගේ පාර්ශවයෙන් ඔවුන්ට මෙම වැඩසටහන් නැරඹිය හැකි වේලාව නුසුදුසු බවත් අතරතුර කාලයේ වෙළෙඳ දැන්වීම් නිසා බාධාවන් සිදු වන බවත් අනාවරණය විය. මෙම තත්වයන් සඳහා පිළියම් යෙදීම මගින් වැඩසටහන් හි ඵලදායකත්වය වර්ධනය කරගැනීමේ හැකියාවක් පවතින බව ද අනාවරණය විය. මේ සඳහා අධ්‍යයනය විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කෙරේ. එනම් ගොවීන්ට සුදුසු හා ඔවුන් අපේක්ෂා කරන වේලාවක කෘෂිකාර්මික වැඩසටහන් විකාශය කිරීම, වැඩසටහන් හි කාල පරාසය දීර්ඝ කිරීම, වැඩසටහන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ පුළුල් ප්‍රචාරක ක්‍රමයක් අනුගමනය කිරීම, වැඩසටහන් විකාශය වන කාල පරාසය තුළ වෙළෙඳ දැන්වීම් සඳහා වන කාලය අවම කිරීම සහ අන්තර්ගතය සඳහා නවාංග ඇතුළත් කිරීම හරහා ගොවීන් තව දුරටත් ආකර්ශනය කරගැනීමේ ක්‍රමයක් සකස් කිරීමත් වේ.

## පටුන


පිටු අංකය

| | |
|---|---|
| පෙරවදන | ii |
| ස්තුතිය | iii |
| සංක්ෂේපය | iv |
| පටුන | vii |
| වගු සටහන් | ix |
| ප්‍රස්තාර සටහන් | x |

**පළමු වැනි පරිච්ඡේදය**

හැඳින්වීම

| | | |
|---|---|---|
| 1.1 | අධ්‍යයනයේ පසුබිම | 01 |
| 1.2 | පර්යේෂණ ගැටලුව හා එහි වැදගත්කම | 01 |
| 1.3 | අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ | 02 |
| 1.4 | පර්යේෂණ ක්‍රමවේදය | 03 |
| 1.5 | අධ්‍යයනයේ සීමා | 05 |
| 1.6 | වාර්තාවේ සැකැස්ම | 06 |

**දෙවැනි පරිච්ඡේදය**

සාහිත්‍ය විමර්ශනය

| | | |
|---|---|---|
| 2.1 | හැඳින්වීම | 07 |
| 2.2 | කෘෂිකාර්මික ව්‍යාප්තිය | 07 |
| 2.3 | සන්නිවේදනය හා කෘෂිකාර්මික සන්නිවේදනය | 08 |
| 2.4 | ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යය | 11 |
| 2.5 | ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යය හා කෘෂිකාර්මික ව්‍යාප්තියට එයින් ලැබෙන දායකත්වය | 13 |
| 2.6 | ලෝකයේ වෙනත් රටවල ජනමාධ්‍යය හා කෘෂිකර්මාන්තය අතර සබඳතාවය | 16 |
| 2.7 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් හි අරමුණු සහ ක්‍රියාකාරීත්වය | 17 |
| 2.7.1 | ගොවිබිමට අරුනළු කෘෂිකාර්මික වැඩසටහන | 17 |
| 2.7.2 | මිහිකත දිනුවෝ කෘෂිකාර්මික වැඩසටහන | 18 |
| 2.7.3 | කෘෂිකාර්මික වැඩසටහන් සඳහා වන පිරිවැය | 19 |



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

**තෙවැනි පරිච්ඡේදය**

අධ්‍යයන ප්‍රදේශයේ භෞතික, සමාජ, ආර්ථික හා කෘෂිකාර්මික පසුබිම


| | | |
|---|---|---|
| 3.1 | හැඳින්වීම | 21 |
| 3.2 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටීම | 21 |
| 3.3 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ භෞතික, සමාජ, ආර්ථික හා කෘෂිකාර්මික පසුබිම | 21 |
| 3.4 | අධ්‍යයනය සඳහා තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන | 24 |


**සිව් වැනි පරිච්ඡේදය**

ප්‍රතිඵල හා සාකච්ඡා

කෘෂිකාර්මික වැඩසටහන් සඳහා ගොවීන්ගේ නැඹුරුව


| | | |
|---|---|---|
| 4.1 | හැඳින්වීම | 25 |
| 4.2 | ජාතික නාලිකාවේ කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් සංඛ්‍යාව | 25 |
| 4.3 | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් ඒ පිළිබඳ දැනුවත් වී ඇති ආකාරය | 26 |
| 4.4 | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගේ අධ්‍යාපනික මට්ටම | 27 |
| 4.5 | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන්ගේ වයස් මට්ටම් | 28 |
| 4.6 | ගොවීන් වැඩි වශයෙන් අපේක්ෂා කරන දැනුම හා තොරතුරු | 29 |
| 4.7 | ගොවීන් නැරඹීමට වඩාත් කැමති රූපවාහිනී වැඩසටහන | 30 |


**පස්වැනි පරිච්ඡේදය**

රූපවාහිනී කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ ස්වභාවය, ඉදිරිපත් කරන ආකාරය,
ප්‍රයෝජනවත්භාවය හා බාධාවන් පිළිබඳ ගොවි ප්‍රතිචාර


| | | |
|---|---|---|
| 5.1 | හැඳින්වීම | 31 |
| 5.2 | ගොවීන්ගේ කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ ස්වභාවය | 31 |
| 5.3 | රූපවාහිනී කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට පුරුදුව සිටින කාලවකවානුව | 33 |
| 5.4 | කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර | 34 |
| 5.4.1 | ගොවිබිමට අරුණළු වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර | 34 |
| 5.4.2 | මිහිකත දිනුවෝ වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර | 35 |
| 5.4.3 | රිවිදින අරුනැල්ල වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර | 36 |
| 5.4.4 | සැඟවුණු කහවනු වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර | 36 |
| 5.5 | කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ප්‍රයෝජනවත් භාවයෙහි ස්වභාවය | 37 |
| 5.6 | කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමෙන් ලැබූ ප්‍රයෝජන | 38 |
| 5.7 | කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී ගොවීන්ට පවතින බාධාවන් | 41 |
| 5.8 | කෘෂිකාර්මික වැඩසටහන් ඵලදායකවීම සඳහා ගොවීන්ගේ අදහස් හා යෝජනා | 44 |

**හයවැනි පරිච්ඡේදය**

සොයා ගැනීම්, නිගමන හා යෝජනා


| | | |
|---|---|---|
| 6.1 | හැඳින්වීම | 47 |
| 6.2 | සොයා ගැනීම් | 47 |
| 6.3 | නිගමන | 49 |
| 6.4 | යෝජනා | 50 |
| **ආශ්‍රිත ග්‍රන්ථ** | | 52 |


## වගු සටහන්

**පිටු අංකය**


| | | |
|---|---|---|
| 1.1 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරා ගනු ලැබූ ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව, කෘ.ප.නි.ස. වසම් සංඛ්‍යාව හා ගොවි නියැදිය | 04 |
| 2.1 | ශ්‍රී ලංකාවේ පවතින ගුවන්විදුලි නාලිකා | 12 |
| 2.2 | ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන රූපවාහිනී නාලිකා | 13 |
| 2.3 | කෘෂිකාර්මික වැඩසටහන් සඳහා වන වාර්ෂික පිරිවැය | 19 |
| 3.1 | විවිධ වර්ෂවල කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධනය | 22 |
| 3.2 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ත්‍රී හා පුරුෂ ජනගහන සංඛ්‍යාව | 22 |
| 3.3 | දේශගුණික කලාපයන්ට සමානුපාතිකව තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ඒවායෙහි භෝග ව්‍යාප්තිය | 24 |
| 4.1 | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන්ගේ ව්‍යාප්තිය | 25 |
| 4.2 | ජාතික නාලිකාව/කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැතිවීමට හේතු වූ කරුණු | 26 |
| 4.3 | කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ දැනුවත් වූ ආකාරය | 26 |
| 4.4 | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන් අධ්‍යාපන මට්ටම අනුව ව්‍යාප්තව සිටින ආකාරය | 27 |
| 4.5 | වයස් මට්ටම් අනුව ව්‍යාප්තව සිටින ආකාරය | 28 |
| 4.6 | ගොවීන්ට වැඩි වශයෙන් අවශ්‍ය වන දැනුම් ක්ෂේත්‍රයන් | 29 |
| 4.7 | ගොවීන් නැරඹීමට වඩාත් කැමති රූපවාහිනී වැඩසටහන් | 30 |
| 5.1 | ගොවීන් වැඩසටහන් නැරඹීමේ ස්වභාවය | 32 |
| 5.2 | කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට පුරුදුව සිටින කාලවකවානුව | 33 |
| 5.3 | ගොවි බිමට අරුනළු වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර | 35 |
| 5.4 | මිහිකත දිනුවෝ වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර | 35 |
| 5.5 | ප්‍රයෝජනවත්භාවයෙ හි ස්වභාවය පිළිබඳ ප්‍රතිචාර | 37 |
| 5.6 | කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමෙන් ලැබූ ප්‍රයෝජන | 38 |
| 5.7 | කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී බාධකයන්ට මුහුණදීමේ තත්ත්වය | 42 |
| 5.8 | කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී ගොවීන් මුහුණ දෙන දෙන බාධාවන් | 43 |
| 5.9 | කෘෂිකාර්මික වැඩසටහන් ඵලදායකවීම සඳහා ගොවීන්ගේ අදහස් හා යෝජනා | 44 |

## ප්‍රස්තාර සටහන්

පිටු අංකය


| | | |
|---|---|---|
| 3.1 | විවිධ වර්ෂවල මහ කන්නයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී වගා කළ බිම් ප්‍රමාණය හා වී නිෂ්පාදනය | 23 |
| 4.1 | රූපවාහිනී වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන් | 25 |
| 4.2 | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගේ වයස් මට්ටම් | 28 |
| 5.1 | ගොවීන්ගේ වැඩසටහන් නැරඹීමේ ස්වභාවය | 32 |
| 5.2 | ප්‍රයෝජනවත්භාවයෙහි ස්වභාවය පිළිබඳ ප්‍රතිචාර | 37 |
| 5.3 | වැඩසටහන් නැරඹීමේ දී බාධාවන්ට මුහුණදීමේ තත්ත්වය | 42 |


## සිතියම්


| | | |
|---|---|---|
| 1.1 | අධ්‍යයන ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම සහ තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල පිහිටීම | 06 |

පළමුවැනි පරිච්ඡේදය

# හැඳින්වීම

## 1. අධ්‍යයනයේ පසුබිම

වර්තමානයේ "තොරතුරු" යන්න ඉතා ප්‍රබලව ඉස්මතු වන සංකල්පයකි. තොරතුරු සමාජයක් තුළ වෙසෙමින් තොරතුරු මත පදනම් ව සියලු අර්ථ ක්‍රමයන් හි සංවර්ධනයක් අපේක්ෂා කෙරෙන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රය ද ඉන් අත්මිදී නොමැත. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ දැනුම තොරතුරු හා පණිවිඩ හුවමාරුවේ දී කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ඉටුකරනු ලබන්නේ ප්‍රධාන කාර්යභාරයකි. එනම්, ගොවින්ගේ නිෂ්පාදනය හා අලෙවිය වැඩි වර්ධනය කරගැනීම සඳහා උපදේශනයෙන් හා මග පෙන්වීමෙන් සහය වීම කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයෙන් සිදු කෙරේ (Adams, 1982). එය වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයක් වන අතර විවිධ ක්‍රමයන් හා මාධ්‍යයන් යටතේ මෙම සේවාව ලබාදීම සිදු කෙරේ.

අකාර්යක්ෂම ව පවතින ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය කාර්යක්ෂම කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් විවිධ ව්‍යාප්ති ක්‍රමෝපායයන් හඳුන්වා දී ඇති අතර මෙම ක්‍රමයන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. පරිගණකය, අන්තර්ජාලය, ජංගම දුරකතන වැනි නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් මෙන් ම රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, සඟරා, වාර ප්‍රකාශන, වැනි සාම්ප්‍රදායික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් ද උපයෝගී කරගනිමින් ගොවීන් වෙත තොරතුරු හා දැනුම ලබා දීම සිදු කරනු ලබයි.

මෙම සාම්ප්‍රදායික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් අතර ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යයක් ලෙසින් රූපවාහිනී මාධ්‍ය විශේෂ වන අතර ගෘහස්ත ආදායම් සහ වියදම් සමීක්ෂණ වාර්තාවට (2009/2010) අනුව ද ග්‍රාමීය කුටුම්භයන්ගෙන් 80%කට රූපවාහිනියක් තිබීම නිසා එය වඩාත් උචිත සන්නිවේදන මාධ්‍යයක් ලෙසින් වැදගත් වන අතර, දිස්ත්‍රික්ක මට්ටමින් සැලකීමේ දී ද සෑම දිස්ත්‍රික්කයක ම 60%ට වැඩි පිරිසකට රූපවාහිනියක් ඇත.

වර්තමානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් රූපවාහිනී මාධ්‍ය හරහා ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය කාර්යක්ෂම ව සිදුකිරීමේ අරමුණින් ගොවීන් අරමුණු කොට ගත් කෘෂිකාර්මික වැඩසටහන් දෙකක් (1. ගොවිබිමට අරුණළු, 2. මිහිකත දිනුවෝ) විකාශනය කරනු ලබයි. සමස්ත ගොවිජනතාව ඉලක්ක කොට ගනිමින් මෙම වැඩසටහන් සම්පාදනය කෙරෙන අතර තාක්ෂණික දැනුම හා තොරතුරු ලබා දීමෙන් ගොවියා දැනුවත් කිරීමත්, උපදේශනය හා ආදර්ශනය මගින් කෘෂිකර්මාන්තය කෙරෙහි ගොවියා පෙළඹවීමත්, උනන්දුව ඇති කිරීමත්, එම වැඩසටහන්හි මූලික අරමුණු වී ඇත.

## 1.2 පර්යේෂණ ගැටලුව සහ එහි වැදගත්කම

මෙම වැඩසටහන් සම්පාදනය කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වාර්ෂිකව විශාල මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කෙරේ. එසේ වුව ද, **මෙම වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරයන් කුමන ආකාරයේ ද? මෙම වැඩසටහන් හරහා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සිදුකෙරෙන දායකත්වය කෙතරම් ප්‍රතිඵලදායක ද යන්න පිළිබඳ ගැඹුරින් විමර්ශනයට ලක් කර නොමැති බව පෙනේ.** එසේ ම, දැනුම හා තොරතුරු ලබා ගැනීමේ දී දිනෙන් දින නවතාවයට පත්වන



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

සන්නිවේදන ක්ෂේත්‍රය තුළ රූපවාහිනී කෘෂිකාර්මික වැඩසටහන් සඳහා ගොවීන්ගේ පවතින නැඹුරුතාව කොතරම් ද, එම වැඩසටහන් හරහා ගොවීන් ලබා ගන්නා දැනුම හා තොරතුරු ඔවුන්ට ප්‍රයෝජනවත් ද යන්න පිළිබඳ ව ද පර්යේෂණාත්මකව හා විධිමත්ව අධ්‍යයනයට ලක් වී නොමැත.

දැනුම පාදක කොටගත් ගොවි සමාජයක් බිහිකිරීම මහින්ද චින්තනයේ ප්‍රධාන අරමුණක් වන අතර ඒ සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ සහය ලබා ගැනීම පිළිබඳවත් ආර්ථික සංවර්ධන අභිලාෂයන් සාක්ෂාත් කරගැනීම සඳහා ජනමාධ්‍යන්හි පුළුල් දායකත්වය ලබා ගැනීම පිළිබඳවත් මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටු අංක (81) හි සඳහන් කර ඇත. දිනෙන් දින ඉහළ යන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ අභියෝගයන් හමුවේ පහළ සිට ඉහළට ගමන් කෙරෙන සංවර්ධන අපේක්ෂාවන් ඉටු කර ගැනීමට නම් ග්‍රාමීය මට්ටමේ පවතින සංවර්ධන ක්‍රමෝපායයන් හි ද ක්‍රමික වර්ධනයක් හා ප්‍රතිඵල දායකත්වයක් ඇති විය යුතු ය. එසේ නොවුනහොත් රටේ සංවර්ධනය සඳහා වැය කෙරෙන මූල්‍ය ප්‍රතිපාදනයන් හි ඵලදායකත්වයක් අපේක්ෂා කළ නොහැකි වේ. ඒ අනුව ඉතාමත් පහළ මට්ටමේ වුව ද සංවර්ධනාපේක්ෂාවන් පෙරදැරිව සිදුකෙරෙන කටයුතු පිළිබඳව විධිමත්ව කරුණු ගවේෂනය කර ඇගැයීමට ලක් කිරීම වඩාත් උචිත වන අතර ග්‍රාමීය ගොවි ප්‍රජාවන් වෙත කෘෂිකාර්මික තොරතුරු හා දැනුම සැපයීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ජාතික රූපවාහිනිය හරහා ප්‍රචාරය කෙරෙන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ක්‍රමානුකූලව ඇගයීමක් සිදුකර ගොවීන්ගේ ප්‍රතිචාරයන් සොයා බැලීම සඳහා මෙවැනි අධ්‍යයනයක් සිදුකිරීම වඩාත් කාලෝචිත බැව් වුවකි.

## 1.3 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ ප්‍රතිචාරය ඇගැයීමට ලක් කිරීම තුළින් ඒවා කෙතරම් ඵලදායී ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. අනෙකුත් විශේෂිත අරමුණු පහත පරිදි වේ.

1. ගොවීන්ගෙන් කෙතරම් ප්‍රමාණයක් මෙම වැඩසටහන් නරඹන්නේ ද යන්න අධ්‍යයනය කිරීම
2. කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවීන්ගේ කැමැත්ත විමසා බැලීම
3. වැඩසටහන් තුළින් ගොවීන් ලබා ගත් දැනුම කෙතරම් දුරට උපයෝගී කරගන්නේ ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම.
4. වැඩසටහන් නැරඹීමේ දී ගොවීන්ට පවතින බාධාවන් සොයා බැලීම.
5. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් තොරව ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ප්‍රතිචාරයන් ද සොයා බැලීම.
6. වැඩසටහන් තවදුරටත් ඵලදායක කරගැනීම සඳහා ගොවීන්ගේ අදහස් විමසීම.

## 1.4 පර්යේෂණ ක්‍රමවේදය

### (අ) අධ්‍යයන ප්‍රදේශය හා නියැදිය තෝරා ගැනීම

අධ්‍යයන ප්‍රදේශය සහ නියැදිය තෝරා ගැනීමේ දී බහු-පියවර නියැදි ක්‍රමය (Multi-stage random sampling technique) අනුගමනය කර ඇත. පළමු පියවර ලෙසින් ජාතික රූපවාහිනිය වඩාත් හොඳින් දර්ශනය වන දිස්ත්‍රික්කයන් අතරින් විවිධ දේශගුණික කලාප (තෙත්, අතරමැදි හා වියළි) ඇතුළත් හා විවිධ බෝග (වී, එළවළු හා ක්ෂේත්‍ර බෝග) වගා කිරීමේ හැකියාව පවතින යන නිර්ණායක සැලකිල්ලට ගනිමින් කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරා ගන්නා ලදී.

දිස්ත්‍රික්කයට අයත් මුළු ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව 55ක් වන අතර එම සංඛ්‍යාව දිස්ත්‍රික්කයට අයත් ප්‍රධාන දේශගුණික කලාපවලට බෙදී ගොස් ඇති ආකාරයට සමානුපාතිකව (Proportionatly) 20%ක ගොවිජන සේවා මධ්‍යස්ථාන නියැදියක් තෝරා ගැනීම දෙවන පියවර වූ අතර ඒ අනුව දේශගුණික කලාප 3ට සමානුපාතිකව තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල එකතුව 11ක් විය. තෙවන පියවර ලෙසින් ඒ සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකින් ම අහඹු ලෙස කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් 2 තෝරා ගත් අතර එක් වසමකින් ගොවීන් 15 බැගින් වූ ගොවීන් නියැදියක් ගොවි නාමලේඛනය භාවිතා කරමින් අහඹු ලෙස තෝරා ගන්නා ලදී. ඒ අනුව, මුළු දිස්ත්‍රික්කය ම ආවරණය වන සේ අධ්‍යයනය සඳහා ගොවීන් 330ක් ඇතුළත් විය.

අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ ගොවිජන සේවා මධ්‍යස්ථානයන්, එම මධ්‍යස්ථානයන්ට අදාළ ව අහඹු ලෙස තෝරා ගැනුණු කෘ.ප.නි.ස. වසම් සහ ගොවීන් සංඛ්‍යාවත් පහත වගු අංක 1.1 න් පැහැදිලි කෙරේ.

වගු අංක 1.1: කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරා ගනු ලැබූ ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව,

කෘ.ප.නි.ස. වසම් සංඛ්‍යාව හා ගොවි නියැදිය

| දේශගුණික කලාප | ගොවිජන සේවා මධ්‍යස්ථාන | කෘ.ප.නි.ස. වසම | ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| තෙත් කලාපය | 1. අලව්ව | 1. මැදවල | 15 |
| | | 2. කැප්පෙටිවලාන | 15 |
| | 2. පොතුහැර | 3. වදාකඩ | 15 |
| | | 4. තලවත්තේගෙදර | 15 |
| වියළි කලාපය | 3. රාජාංගනය ව/ඉවුර | 5. සදගල | 15 |
| | | 6. පතනේවැව | 15 |
| | 4. ගල්ගමුව | 7. කුඹුක්වැව | 15 |
| | | 8. මැදගම | 15 |
| | 5. රඹේ | 9. හේනැව | 15 |
| | | 10. දෙල්කදවල | 15 |
| | 6. මහව | 11. යද්දීගම | 15 |
| | | 12. උදාගම | 15 |
| අතරමැදි කලාපය | 7. කුලියාපිටිය | 13. තුංමෝදර | 15 |
| | | 14. වීරඹුව | 15 |
| | 8. වාරියපොළ | 15. ඇඹව | 15 |
| | | 16. හෙට්ටිගෙදර | 15 |
| | 9. දොඩම්ගස්ලන්ද | 17. ආදාපොළ | 15 |
| | | 18. කොස්වත්ත | 15 |
| | 10. පඩුවස්නුවර | 19. මදුල්ල | 15 |
| | | 20. කහටවිල | 15 |
| | 11. මැල්සිරිපුර | 21. නාබැට | 15 |
| | | 22. නෙල්ලිය | 15 |
| මුළු ගණන | 11 | 22 | 330 |

### (ආ) දත්ත හා තොරතුරු රැස් කිරීම

මෙම අධ්‍යයනය ප්‍රාථමික හා ද්විතියික දත්ත මත පදනම් විය. අධ්‍යයනයේ අරමුණුවලට අදාළ වන පරිදි විස්තරාත්මක සාහිත්‍ය විමර්ශනය, කණ්ඩායම් සාකච්ඡා, අදාළ නිලධාරීන් සමග කෙරෙන සම්මුඛ සාකච්ඡා සහ ව්‍යුහගත ප්‍රශ්නාවලි සමීක්ෂණය වැනි ක්‍රමයන් යටතේ දත්ත හා තොරතුරු රැස් කිරීම සිදු විය.

#### 1. විස්තරාත්මක සාහිත්‍ය විමර්ශනය (ද්විතියික දත්ත)

තොරතුරු හා සන්නිවේදන ක්‍රමෝපායයන් අතර ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයක් ලෙසින් වැදගත් වූ රූපවාහිනී මාධ්‍ය හරහා කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සැපයීම පිළිබඳ ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල සිදු කෙරුණු පර්යේෂණයන් හා අධ්‍යයනයන් තුළින් ද විෂයයට අදාළ ග්‍රන්ථ, සඟරා හා ලිපි ලේඛන පරිශීලනයෙන් ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයේ ඇති වාර්තා ආදියෙන් ද කෙරුණු සාහිත්‍ය විමර්ශනයෙන් සපයා ගත් තොරතුරු ද්විතියික දත්ත වශයෙන් උපයෝගී කර ගන්නා ලදී.

#### 2. කණ්ඩායම් සාකච්ඡා සහ අදාළ නිලධාරීන් හා කෙරුණු සම්මුඛ සාකච්ඡා

ජාතික රූපවාහිනිය හරහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් ගොවීන් වෙත කෘෂිකාර්මික තොරතුරු හා දැනුම ලබාදීමේ කෘෂි වැඩසටහන් හා සම්බන්ධ නිලධාරීන්, ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකයේ වෙනත් අදාළ නිලධාරීන් හා සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා තුළින් ද, තොරතුරු සපයා ගන්නා ලදී.

#### 3. ව්‍යුහගත ප්‍රශ්නාවලී සමීක්ෂණය

අධ්‍යයනයට අදාළ ප්‍රාථමික දත්ත රැස් කිරීම, ගොවිජන සේවා මධ්‍යස්ථාන 11 ට අදාළ කෘ.ප.නි.ස.වසම් 22 හි ජාතික රූපවාහිනිය නරඹන ගොවීන් වෙත ඉදිරිපත් කෙරුණු ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ආශ්‍රිතව සිදු කෙරිණි. මෙම ප්‍රශ්නාවලිය හරහා කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීම සඳහා ගොවීන්ගේ ඇති නැඹුරුව, කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කෙරෙන ආකාරය පිළිබඳ ගොවීන්ගේ ඇති කැමැත්ත, එසේ ම ඔවුන් ලබා ගන්නා දැනුමෙහි ඇති ප්‍රයෝජනවත් භාවය හා වැඩසටහන් තවදුරටත් ඵලදායක ලෙස වර්ධනය කිරීමේ පවතින හැකියාව කෙසේ ද යන්න පිළිබඳවත් තොරතුරු රැස් කිරීම සිදු විය.

### (ඇ) දත්ත විශ්ලේෂණය

දත්ත හා තොරතුරු පරිගණක ගත කර වගු සටහන් හා ප්‍රස්තාර ඇතුළත් වූ සරල සංඛ්‍යානමය

විධික්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදි.

## 1.5 අධ්‍යයනයේ සීමා


කුරුණෑගල දිස්ත්‍රික්කයේ නගරය මධ්‍යයේ ඇති කුරුණෑගල ගල අවට ගොවිජන සේවා මධ්‍යස්ථාන වූ මීගලෑව, කුරුණෑගල, කුඩා ගල්ගමුව, කරඳගොල්ල සහ මාවතගම යන මධ්‍යස්ථාන අයත් ප්‍රදේශවලට ජාතික රූපවාහිනිය පැහැදිළිව නො පෙනෙන බව ජාතික රූපවාහිනී සංස්ථාව විසින් සඳහන් කළ බැවින් අධ්‍යයනය සඳහා එම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අයත් ප්‍රදේශවලින් තොරතුරු ලබා ගැනීම

නිෂ්ප්‍රයෝජන වූ නිසා නියැදිය තෝරා ගැනීමේ දී එම ප්‍රදේශ අත්හැර දැමීමට වග බලා ගැනිණි. එය මෙම අධ්‍යයනයට අදාළ වූ සීමාවක් විය.


### 1.6 වාර්තාවේ සැකැස්ම

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය අධ්‍යයනයට ප්‍රවේශයක් සපයමින් එහි පසුබිම, අරමුණු හා ක්‍රමවේදයන් පැහැදිළි කරයි. දෙවැනි පරිච්ඡේදය කෘෂිකාර්මික ව්‍යාප්තිය, සන්නිවේදනය හා කෘෂිකාර්මික සන්නිවේදනය පිළිබඳවත්, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා එය කෘෂිකාර්මික ව්‍යාප්තියට ලබාදෙන දායකත්වය පිළිබඳවත් සාකච්ඡා කරනු ලබයි. අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ භෞතික, සමාජීය, ආර්ථික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳවත්, තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල ස්වභාවය පිළිබඳවත් තෙවැනි පරිච්ඡේදයේ දී විග්‍රහයට ලක් වේ. හතරවැනි, පස්වැනි පරිච්ඡේදයන් අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ එක් රැස් කර ගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණයෙන් ලත් සොයා ගැනීම් සවිස්තරාත්මකව ඉදිරිපත් කරන අතර අවසන් පරිච්ඡේදය නිගමන හා නිර්දේශ සඳහා වෙන් කර ඇත.

**සිතියම් අංක 1: අධ්‍යයන ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම සහ තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල පිහිටීම**



මූලාශ්‍රය: කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම් අංශය




පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

## දෙවැනි පරිච්ඡේදය

# සාහිත්‍ය විමර්ශනය


### 2.1 හැඳින්වීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ඇතිව ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර සොයා බැලීම පිළිබඳව සිදු කෙරෙන මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දෙවැනි පරිච්ඡේදය, එම අධ්‍යයනය සඳහා අවැසි සාහිත්‍ය විමර්ශනය වෙනුවෙන් වෙන් කර ඇත. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පිළිබඳවත්, සන්නිවේදනය හා කෘෂිකාර්මික සන්නිවේදනය පිළිබඳවත්, ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල ජනමාධ්‍ය හා කෘෂි ව්‍යාප්ති සේවය අතර සබඳතාවය පිළිබඳවත්, තොරතුරු මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙන අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ඇති රූපවාහිනී කාෂිකාර්මික වැඩසටහන් පිළිබඳව ද සැකෙවින් සාකච්ඡා කෙරේ.

### 2.2 කෘෂිකාර්මික ව්‍යාප්තිය

ශ්‍රී ලංකාව වැනි ග්‍රාමීය ආර්ථිකය මුළුමනින් ම පාහේ යැපුම් කෘෂිකර්මාන්තය මත පදනම් වන රටක තවමත් කෘෂිකර්ම ක්ෂේත්‍රය නිසි දියුණුවකට ලක් නොවීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ කෘෂි ප්‍රජාවේ දැනුම් ඌනතාවයයි. කෘෂි ප්‍රජාව වෙත දැනුම ගෙන යාමටත්, ඔවුන්ගේ ප්‍රතිපෝෂණය ලබා ගැනීමටත් ස්ථාපිත විධිමත් ක්‍රමවේදය කෘෂිකාර්මික ව්‍යාප්තියයි.

කෘෂිකාර්මික ව්‍යාප්තිය යනුවෙන් සඳහන් වන්නේ විධිමත් ආකෘතියක් හා වැඩපිළිවෙළක් යටතේ, කෘෂි කාර්මික පර්යේෂණයන්ගේ ප්‍රතිඵල, නව සොයා ගැනීම් හා දැනුම, නිර්දේශිත කෘෂිකාර්මික පිළිවෙත් ක්ෂේත්‍රය වෙත සන්නිවේදනය කිරීමයි. වෙනත් අයුරකින් සඳහන් කරන්නේ නම් කෘෂිකාර්මික ව්‍යාප්තිය යනු, කෘෂිකාර්මික ජීවනෝපායක් සහිත ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කරලීම පිණිස නව දැනුම, අදහස් හා තොරතුරු ග්‍රාමීය ප්‍රදේශවලට හඳුන්වා දීමේ ක්‍රියාවලියයි. මෙහි ඇති වඩාත් ම වටිනා අදහස නම් ග්‍රාමීය ප්‍රදේශවල කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය වන තොරතුරු හා වෙනත් තාක්ෂණික සහාය ඔවුන් වෙත ගලා යාමට සැලැස්වීම යන්නයි. (Mahaliyanarachchi, 2003).




කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් දෙයාකාර වූ ප්‍රධාන අරමුණුවලින් යුක්ත වේ.

1 සන්නිවේදන ක්‍රමෝපායයන් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය ප්‍රජාවගේ හැසිරීමෙහි වෙනසක් ඇති කිරීම
2 සන්නිවේදන ක්‍රමෝපායයන් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය ප්‍රජාවගේ දැනුම් මට්ටමේ වෙනසක් ඇති කිරීම.

මිනිසාගේ හැසිරීම් රටාවත්, ඔහු සතු දැනුමත් අතර ඇත්තේ ඉතා සමීප වූ සම්බන්ධතාවයකි. ගොවීන් මෙන් ම අනෙකුත් ග්‍රාමීය ප්‍රජාව තුළින් ම පැණ නැගෙන අවශ්‍යතාවයන් මත ව්‍යාප්ති සේවය ලබා

ගැනීමට ඇතිවන කැමැත්ත හරහා ඔවුනගේ දැනුම අනිවාර්ය වෙනසකට ලක් වේ. මෙම දැනුම, ගොවීන්ගේ වගා කටයුතු සඳහා නිවැරදි තීරණ ගැනීමට ඉතාමත් ඉහළ මට්ටමේ සහයක් සපයනු ලබයි. ප්‍රතිඵලදායක තොරතුරු හා තාක්ෂණය භාවිතා කිරීමෙන් කුසලතා හා ආකල්පයන් වෙනස් කිරීමටත්, අත්‍යාවශ්‍ය දැනුම ලබා ගැනීමටත්, තොරතුරු ගොවීන් වෙත සැපයීමටත් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය අඛණ්ඩ වූ ක්‍රියාවලියක් ලෙස පැවතිය යුතු වේ (Mahaliyanarachchi, 2003). ගොවීන් වෙත දැනුම හා තාක්ෂණය ලබා දීම සඳහා ව්‍යාප්ති සේවකයින් විසින් විවිධ වර්ගයේ ව්‍යාප්ති ක්‍රමවේදයන් භාවිතා කරනු ලබයි. පර්යේෂකයින් සහ තාක්ෂණවේදීන් විසින් ජනනය කරනු ලබන නව දැනුම හා තාක්ෂණය කෘෂිකර්මික නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා ගොවීන් වෙත ලබා දීමේ දී කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට ඇත්තේ ප්‍රධාන කාර්ය භාරයකි.

වර්තමානයේ, කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා අංශය තුළ වෙනස් වීම් සිදු වෙමින් පවතින අතර ගොවි ප්‍රජාවට තොරතුරු හා දැනුම ලබා ගැනීමට පහසු ආකාරයේ ක්‍රමවේදයන් පිළිබඳ අවධානය යොමු වෙමින් පවතී. එය තිරසාර වූ කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා අත්‍යාවශ්‍ය වූ කාරණයක් බවට පත් වී තිබේ.

එසේ වුව ද විවිධ සමාජ, දේශපාලනික, ආයතනික හා තාක්ෂණික සාධක හේතුවෙන් කෘෂි ව්‍යාප්තිය උපරිම ඵලදායිතාවයෙන් ඈත් ව තිබෙනු දැකිය හැකිය. සම්ප්‍රදායික සමාජ ක්‍රමය තුළ කෘෂිකාර්මික තොරතුරු සන්නිවේදනය සඳහා පැවති ක්‍රමවේද වර්තමානයේ ප්‍රමාණවත් නොවන්නේ කෘෂි ඵලදායිතාවය තීරණාත්මක ලෙසින් වෙනස් විය යුතු බැවිනි. එයට පිළියම ගොවියා තොරතුරුවලින් සංතෘප්ත කිරීම නම් ඒ සඳහා තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණික විකල්පයන් වෙත යොමු විය යුතු ය.

## 2.3 සන්නිවේදනය හා කෘෂිකාර්මික සන්නිවේදනය

### සන්නිවේදනය

සන්නිවේදනය යන්න පුළුල් විෂය පරාසයකි. මෙම මාතෘකාව පිළිබඳව විවිධ සමාජ විද්‍යාඥයින් මෙන් ම සන්නිවේදනවේදීන් අදහස් ඉදිරිපත් කොට තිබේ. සන්නිවේදනය යනු මානව පැවැත්මේ හා සමාජ ක්‍රියාවලියේ අනිවාර්ය අංගයකි. සන්නිවේදනයට අන්‍යෝන්‍ය වශයෙන් සිදුවන පුද්ගලාන්තර බලපෑම්, මාර්ග සියල්ල ම ඇතුළත්ය. සන්නිවේදනය යනු සමාජ වාහකයෙකි. සන්නිවේදනය මානව සමූහයා අතර සිදුවන අන්තර් ක්‍රියා පහසු කරවනවා පමණක් නොව, මිනිසුන් හට සමාජ සත්වයන් ලෙස ජීවත් වීමට ද අවස්ථාව සලසයි. ඉහත නිර්වචනය මඟින් සන්නිවේදනයේ සමාජීය කාර්ය භාරය මැනවින් විග්‍රහයට බඳුන් වී තිබේ. එහි දී විශේෂයෙන් ම මානව පැවැත්ම සඳහා සන්නිවේදනය යොදා ගන්නා ආකාරය මෙන් ම සමාජ සමූහයා අතර නිරන්තරයෙන් සිදුවන අන්තර් ක්‍රියා පහසු කර වීමට හා සමාජීය සත්වයෙක් වශයෙන් ජීවත් වීමට අවශ්‍ය යම් යම් කොන්දේසි සපුරා ගැනීමට උපයෝගී කර ගත හැකි අයුරු පෙන්වා දී තිබේ (කරුණානායක නන්දන, 2003).

සන්නිවේදනය යනු අරමුණු ගත ගනුදෙනු ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලියේ දී එක් පුද්ගලයකු විසින් තමන්ට සවන් දෙන්නන්ගේ සිත් තුළ අර්ථය ජනිත කර වීමට ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය යොදා ගනී. මෙම නිර්වචනයෙන් පැහැදිලි වන්නේ සන්නිවේදනය තුළ අරමුණක් අන්තර්ගත වීම මෙන් ම ඒ හරහා ග්‍රාහක

පිරිසට බලාපොරොත්තු ආකාරයෙන් ම අර්ථය ලබා දීමට ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය මාධ්‍යයන් යොදා ගන්නා ආකාරයයි.

සන්නිවේදනය කාර්යය තුළින් පුද්ගලයා තුළට අදහස්, තොරතුරු, දැනුම, අත්දැකීම්, හැඟීම්, ආකල්ප, විකල්ප, ආදිය සංක්‍රමණය වීම මෙන් ම එහා මෙහා යාම මෙමගින් සිදු වේ. මෙහි දී වඩා ම වැදගත් වන්නේ හුවමාරුව යන්නයි. එමගින් ගම්‍ය වන්නේ මිනිස් ක්‍රියාකාරීත්වයේ මානසික බැඳීමයි. සමාජීය සත්වයෙක් වන මිනිසාට නිරන්තරයෙන් තොරතුරු දැන ගැනීම, දැනුම ලැබීම යනාදිය සිදු වන්නේ සන්නිවේදනය හරහා ය. සන්නිවේදනයේ දී පණිවුඩ යවන්නා සන්නිවේදකයා වන අතර මෙය ලබා ගන්නා ග්‍රාහකයා වශයෙන් හඳුනා ගනී. සන්නිවේදකයා, ග්‍රාහකයා වෙත පණිවුඩය යැවීමේ දී ශ්‍රව්‍ය මාධ්‍ය, දෘශ්‍ය මාධ්‍ය, ලිඛිත මාධ්‍ය, වාචික හෝ අවාචික වශයෙන් විවිධ මාධ්‍යයන් භාවිතයට ගනී.

මෙහි දී, ග්‍රාහකයා වෙත ලබා දෙන පණිවුඩය මගින් ග්‍රාහක කණ්ඩායම සෑහීමට පත් වීම අවශ්‍ය වන අතර ඒ හරහා සන්නිවේදන කාර්ය සාර්ථක කර ගැනීමට හැකි වේ. මේ තත්වය විශේෂයෙන් ම වැදගත් වන්නේ සංවර්ධන සන්නිවේදනයේදී ය. සංවර්ධන සන්නිවේදනය වශයෙන් සාමාන්‍යයෙන් හඳුනා ගන්නේ සංවර්ධනය උදෙසා රටක ජනතාවගේ මානසික ස්වභාවය වෙනස් කිරීමට විධිමත් සන්නිවේදන ක්‍රමයක් උපයෝගි කර ගැනීමයි. සංවර්ධන සන්නිවේදනය සඳහා රටක සංවර්ධනයට ක්‍රියාත්මක වන ක්‍රියාදාමයන්ගෙන් ඵල ලැබීමට මෙන් ම මීට අවශ්‍ය ජනතාවගේ මානසික විප්ලවය හා ආකල්පමය වෙනස ඇති කිරීමට හේතු වේ (Mahaliyanarachchi, 2003).

එමෙන් ම ග්‍රාමීය සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදා ගැනීමේ වැදගත් කම ද මෙහි දී සාකච්ඡාවට බඳුන් වීම ප්‍රයෝජනවත් ය. ග්‍රාමීය ප්‍රජාව තුළ ආකල්ප හා හැසිරීම වෙනස් වීමෙන් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කර ගැනීම අපහසු වේ. මෙහි දී ගැටලු හා එවාට විසඳුම් ලබා ගැනීමේ විකල්ප ද සම්මුතියකට අරමුණු ඇතිව තොරතුරු රැස් කර ගැනීම හා එවා සියලු දෙනා අතර හුවමාරු වීම ද අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව සහ බොහෝමයක් රටවල් මුහුණ පා තිබෙන ප්‍රධාන ම ගැටලු දෙකක් වන්නේ විරැකියාව හා ග්‍රාමීය ජනතාව නගරයට සංක්‍රමණය වීම යන්නයි. මෙම ගැටලුවේ දි කුඩා කර්මාන්ත පරිශ්‍රම සංයෝජනය ඉතා වැදගත් වේ. මානව සම්පත උපරිම ලෙස ප්‍රයෝජනයට ගත හැකි ආකාරයෙන් ග්‍රාමීය කර්මාන්ත ඇති කිරීමට මෙන් ම ස්වයං රැකියා අවස්ථා දියුණු කිරීමට ද ක්‍රියා කිරීම අවශ්‍ය වේ. මේ නිසා, ග්‍රාමීය ප්‍රදේශ සඳහා ද සංවර්ධන සන්නිවේදනය අතිශයින් ම වැදගත් වේ. විශේෂයෙන් ම සාක්ෂරතාවයක් නොමැති ග්‍රාමීය බහුතරයකට ප්‍රයෝජනයට ගත හැකි වීම අනිවාර්ය අංගයකි (Mahaliyanarachchi, 2003).

**කෘෂිකාර්මික සන්නිවේදනය**

සන්නිවේදනය තුළින් පැනනගින තවත් පාර්ශවික අංගයක් ලෙස කෘෂිකාර්මික සන්නිවේදනය හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙ හි කෘෂිකර්මාන්තය ඉතා වැදගත් අංශයක් වන්නේ, රටේ සමස්ත ජනගහණයෙන් 78%ක පමණ ප්‍රතිශතයක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත වතු හා ග්‍රාමීය අංශයන්හි ජීවත් වීමත් එයින් 35.7%ක ප්‍රතිශතයක් කුමන හෝ ආකාරයකින් කෘෂිකර්මාන්තයට අදාළ අංශයන් හි සේවා නියුක්තිකයන් වීමත් නිසාවෙනි. මේ නිසා කෘෂිකර්මාන්තය අරභයා ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම

අත්‍යවශ්‍ය සාධකයක් වේ. කෘෂිකාර්මික කටයුතු සැලකීමේ දී බිම් සැකසීමේ සිට, අස්වනු අලෙවිය දක්වා වන සෑම කටයුත්තක් කෙරෙහි ම සන්නිවේදනය නිරන්තර දායකත්වයක් ලබා දෙයි. කෘෂිකාර්මික දැනුම ගොවියා වෙත සම්ප්‍රේෂණය කිරීමත්, කාලගුණික දත්ත හා වෙළෙඳපොළ තොරතුරු පිළිබඳව අදාළ අංශයන් දැනුවත් කිරීමත්, ගොවීන්ගේ අවශ්‍යතා පිළිබඳව අදාළ අංශයන් වෙත තොරතුරු පරිවහනය කිරීමත්, කෘෂිකර්මාන්තය පිළිබඳ අනපනත් හා රෙගුලාසි ක්‍රියාවේ යෙදවීමත් යන කරුණු සඳහා සන්නිවේදනය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී තීරණාත්මක සාධකයක් වී තිබේ.

නව කාර්මික දැනුම හා තාක්ෂණික දැනුම, පර්යේෂණ මට්ටමේ සිට ගොවීන්ගේ ක්ෂේත්‍ර මට්ටම දක්වා පරිවහනය කිරීම අරමුණු කර ගත් කාර්යාවලියක් වන කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාවලිය තුළ ද සන්නිවේදන සංකල්ප හා මෙවලම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වේ. එවැනි සන්නිවේදන සංකල්ප හා ශිල්පීය ක්‍රම කෙතරම් සාර්ථක ලෙස කුමන ප්‍රවේශයන් ඔස්සේ භාවිතා කරනවා ද යන්න මත කෘෂිකාර්මික සංවර්ධනය හා එහි චිරස්ථායි බව තීරණය වේ.

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළ සන්නිවේදනය භාවිතා කිරීම හරහා සිදු කිරීමට අපේක්ෂිත අරමුණු අනුව කෘෂි සන්නිවේදනය වර්ගීකරණය කළ හැකි ය.

- සහභාගිත්ව සැලසුම්කරණය හා සමාජ ආකල්ප වෙනස් කිරීම අරමුණු කර ගත් සමාජීය සන්නිවේදනය (Social Communication)
- ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශයන් හි, පුහුණු වීම් හා ව්‍යාප්ති කටයුතු සඳහා සහාය වන අධ්‍යාපනික සන්නිවේදනය (Educational Communication)
- ගොවීන් හා ආයතන අතර සම්බන්ධීකරණය හා කළමණාකරණය අරමුණු කර ගත් ආයතනික සන්නිවේදනය (Institutional Communication)

කෘෂිකර්මාන්ත ක්ෂේත්‍ර තුළ දී, නව කෘෂි දැනුම හා තාක්ෂණය ගොවීන් වෙත ලබා දීම සඳහා සන්නිවේදන ක්‍රමෝපායයන් හෝ ඉගෙනුම් ක්‍රම රාශියක් භාවිතා කරනු ලබයි. කෘෂි ව්‍යාප්ති සේවකයාගේ හැකියාව, ඉලක්ක, ගොවි ජනතාවගේ සමාජයීය හා ආර්ථික මට්ටම, ලබා දිය යුතු පණිවුඩයේ ස්වභාවය හා එහි වැදගත්කම හා පවතින පහසුකම් මෙන් ම අනෙකුත් තාක්ෂණික දැනුම හා මූල්‍ය ශක්තිය මත එක් එක් අවස්ථාවන්හි දී භාවිතා වන සන්නිවේදන ක්‍රමෝපායයන් වෙනස් වේ(අත්තනායක, බන්දුල, 1999).

කෘෂිකාර්මික ව්‍යාප්තියේ දී, කෘෂි සන්නිවේදනය හරහා ලබා දෙන නව දැනුම, තාක්ෂණය හා වෙනත් අදාළ තොරතුරු ගොවි ප්‍රජාව වෙත විවිධ සන්නිවේදන ක්‍රම හා විවිධ ඉගෙනුම් ක්‍රම හරහා ප්‍රචලිත කළ යුතු වේ. එම ප්‍රචලිත කෙරෙන දැනුම හා තාක්ෂණික තොරතුරු "නව්‍යතාවයන්" ලෙස හැඳින්වෙන අතර එම තොරතුරු ගොවි ජනතාව අතර විවිධ ක්‍රම හරහා ප්‍රචලිත වීම "නව්‍යතාවය විසරණය වීම" නම් වේ. එලෙස ගොවීන් අතර විසරණය වූ යම් නව්‍යතාවයක් ගොවීන් විසින් භාවිතා කිරීම හෝ එයට අදාළව නව දැනුම හෝ තාක්ෂණය ප්‍රායෝගිකව තම වගා කටයුතු සඳහා යොදා ගැනීම, "නව්‍යතාවයන් සඳහා අනුවර්තනය වීම" නම් වේ. මෙසේ ගොවීන් විසින් අනුවර්තනය වනු ලබන නව්‍යතාවයන් සතු ගුණාංග පහත පරිදි වේ.

- සාපේක්ෂ වාසි
- අනුකූලතාවය
- නව්‍යතාවයේ සංකීර්ණ බව
- අත්හදා බැලිය හැකි වීම
- නිරීක්ෂණය කිරීමේ හැකියාව

කෙසේ වුව ද, කෘෂි සන්නිවේදනය වඩාත් සාර්ථක හා ඵලදායි කර ගැනීමට සන්නිවේදනයට අයත් ප්‍රධාන අංග වන පණිවුඩය යවන්නා, පණිවුඩය, සන්නිවේදන මාධ්‍යය, එය ලබන්නා යන සියලු කොටස් කෙරෙහි ප්‍රධාන සැලකිල්ල යොමු විය යුතු වේ. මෙහි දී, ප්‍රධාන වශයෙන් ම සන්නිවේදකයා ලෙස කෘෂි ව්‍යාප්ති සේවකයා වෙත විශාල කාර්ය භාරයක් පැවරී ඇති අතර අදාළ ක්ෂේත්‍රය තුළ ඔහුගේ හෝ ඇයගේ නිපුණත්වය කෘෂි සන්නිවේදනය ඵලදායි වීම සඳහා විශාල වශයෙන් දායක වේ. කෘෂි සන්නිවේදනය වඩාත් සාර්ථක හා ඵලදායි වීම යනු ප්‍රශස්ත තාක්ෂණය ගොවීන් අතර ප්‍රචලිත වීමත්, ඒ ඔස්සේ අඩු නිෂ්පාදන පිරිවැය තුළින් වැඩි කෘෂි නිෂ්පාදනයක් ලබා ගැනීමත් වෙළෙඳපොළ තොරතුරු සන්නිවේදනය හරහා නිෂ්පාදනය සඳහා නියමිත මිලක් ලබා ගැනීමත් මඟින් කෘෂි ආර්ථිකය වර්ධනය කිරීම මෙන් ම ගොවි ප්‍රජාවගේ මානව සංවර්ධනය ළඟා කර ගැනීමත් වේ (ලියනගේ, විමල, 2010).

## 2.4 ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය

ලෝකයේ බහුතරයක් රටවල ජනතාවගේ ප්‍රධාන ජීවන අවශ්‍යතා අතරට වර්තමානයේ ජනමාධ්‍ය භාවිතය ද බෙහෙවින් එක් වී තිබේ. ජනමාධ්‍ය නිවැරදිව භාවිතා කිරීම තුළින් රටක සංවර්ධනයට දිය හැකි දායකත්වය අති මහත් ය. එමෙන් ම රටක ජනතාගේ දැක්ම සඳහා ආස්වාදය සඳහා, ජීවනෝපාය සඳහා, අධ්‍යාපනය සඳහා යනා දි වශයෙන් විවිධ අරමුණු ජනමාධ්‍ය ඔස්සේ සපුරා ගත හැකි වේ. ජනමාධ්‍ය ලෙස ප්‍රධාන වශයෙන් හැඳින්වෙන්නේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් ය. විද්‍යුත් මාධ්‍යයන් ලෙස ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් ම හැඳින්විය හැක්කේ රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍යයන් වේ. මුද්‍රිත මාධ්‍යයන් වන්නේ පොත් පත්, සඟරා, පුවත්පත් යනාදිය යි.

මුද්‍රිත මාධ්‍යයන්ට සාපේක්ෂව විද්‍යුත් මාධ්‍යයන්ට මහජනතාව වෙත ඉතා ඉක්මණින් සමීප වීමට ඇති හැකියාව නිසා මේ වන විට ශ්‍රී ලාංකීය සමාජය තුළ විද්‍යුත් මාධ්‍යයන් සඳහා වැඩි වැදගත්කමක් ලැබී ඇත. ලෝකයේ සංවර්ධිත රටවලට සාපේක්ෂව තුන්වෙනි ලෝකයේ බොහෝ රටවල තාක්ෂණික වශයෙන් නො දියුණු මට්ටමක් පෙන්නුම් කරන අතර මෙම තත්ත්වය අප රටට ද සාධාරණීකරණය කළ හැක. විද්‍යුත් මාධ්‍ය හරහා නව දැනුම ජනනය කිරීමේ දී දියුණු තාක්ෂණික ඥානය ද ජනතාව වෙත විසරණය කළ හැකි වේ.

### රූපවාහිනී මාධ්‍ය

ශ්‍රී ලංකාවේ පළමු වන රූපවාහිනී ජාලය වන අයි.ටී.එන් නාලිකාව, 1979 අප්‍රේල් 13 වන දින ඇරඹි, ස්වාධීන රූපවාහිනී ජාලයට අයත් ව වර්තමානය දක්වා පැවතෙන්නකි. එසේ ඇරඹුණු එය පසුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව යටතට පත් කරන ලදි. 1992 වර්ෂය රූපවාහිනී ජනමාධ්‍යට සුවිශේෂී වන්නේ පෞද්ගලික නාලිකා ඇරඹීම සඳහා රජයේ අනුමැතිය ලැබීම යි. ඒ අනුව මහාරාජා රූපවාහිනී ජාලය, සිංගප්පූරු රූපවාහිනී සන්නිවේදන ජාලය වැනි රූපවාහිනී මාධ්‍යය ජාලයන් කිහිපයක් ම ආරම්භ වූ අතර වර්තමානයේ තවත් සැටලයිට් මාධ්‍ය ජාලයක් ද ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇත.

## ගුවන්විදුලි මාධ්‍යය

ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය ස්ථාපනය 1920 දශකය තරම් ඈතට දිවයයි. එසේ ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක පිහිට වූ පළමු ගුවන් විදුලි සේවය ලෙසින් ද එය ඉතිහාසයට එක් විය. 1922 වර්ෂයේ පිහිටවනු ලැබූ ලංකා වයර්ලස් සමාජයත්, එම වසරෙම අගට වන්නට පිහිටවනු ලැබූ ලංකා ආධුනික ගුවන්විදුලි සමාජයත් මෙරට ගුවන් විදුලි සේවා ආරම්භ කිරීමට පදනම විය. 1924 වසරේ ජූනි 24 වන දින ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි විකාශන උපදේශන මණ්ඩලයක් පත් වූ අතර පළමු ගුවන් විකාශනය 1949 ජූනි මස 27 වන දා සිදු විය. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි කටයුතු එතැන් පටන් සීඝ්‍ර දියුණුවකට නිරන්තරයෙන් පත් වූ අතර, එහි සංවර්ධන අවශ්‍යතා හා ගැටලු සොයා ගැනීමට විවිධ කොමිෂන් සභා පත් කෙරිණි.

වගු අංක 2.1: ශ්‍රී ලංකාවේ පවතින ගුවන් විදුලි නාලිකා

| නාලිකාව | හිමිකම | මාධ්‍ය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | රාජ්‍ය | සිංහල, දෙමළ |
| ටී.එන්.එල්. රොක්ස් (T.N.L Rox) | පෞද්ගලික | ඉංග්‍රීසි |
| සන්.එෆ්.එම් (Sun FM) | පෞද්ගලික | ඉංග්‍රීසි |
| සූරියන් එෆ්.එම්. | පෞද්ගලික | දෙමළ |
| හිරු.එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| යර්ස් එෆ්.එම් (Yes FM) | පෞද්ගලික | ඉංග්‍රීසි |
| සිරස එෆ්.එම්. | පෞද්ගලික | සිංහල |
| ශක්ති එෆ්.එම් | පෞද්ගලික | දෙමළ |
| ඊ එෆ්.එම් (E FM) | පෞද්ගලික | ඉංග්‍රීසි |
| ශ්‍රී එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| රන් එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| සියත එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| නෙත් එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| ලක්හඬ | රාජ්‍ය | සිංහල |
| වසන්තම් එෆ්.එම් | රාජ්‍ය | දෙමළ |
| සත් එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| දෙරණ එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| රිද්ම එෆ්.එම් | පෞද්ගලික | සිංහල |
| වයි එෆ්.එම් (Y FM) | පෞද්ගලික | සිංහල |
| යූත් එෆ්.එම් (Youth FM) | පෞද්ගලික | සිංහල |
| යුවර් රේඩියෝ (Your radio) | පෞද්ගලික | ඉංග්‍රීසි |

මූලාශ්‍රය: ගුවන් විදුලි සංස්ථාව, 2011

මෙයට අමතරව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව යටතේ ප්‍රධාන සේවාවන් වශයෙන් ස්වදේශීය සේවය,වෙළෙඳ සේවය, සිටි එෆ්.එම් ද, ප්‍රාදේශීය සේවාවන් වශයෙන් රජරට සේවය, රුහුණු සේවය, කඳුරට සේවය, හා වයඹ එෆ්.එම් ද, ප්‍රජා සේවාවන් ලෙස කොත්මලේ ප්‍රජා සේවය, ගිරාදුරු ප්‍රජා සේවය හා ඌව ප්‍රජා සේවය ද පවතී.

වගු අංක 2.2: ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන රූපවාහිනී නාලිකා

| නාලිකාව | හිමිකම | මාධ්‍ය |
|---|---|---|
| ජාතික රූපවාහිනිය | රාජ්‍ය | සිංහල |
| චැනල් අයි (Channel eye) | රාජ්‍ය | සිංහල |
| ස්වාධීන රූපවාහිනිය | රාජ්‍ය | සිංහල |
| සිරස ටී.වී | පෞද්ගලික | සිංහල |
| දෙරණ ටී.වී | පෞද්ගලික | සිංහල |
| ස්වර්ණවාහිණී | පෞද්ගලික | සිංහල |
| ටී.එන්.එල් (TNL) | පෞද්ගලික | සිංහල |
| එම්.ටී.වී (MTV) | පෞද්ගලික | ඉංග්‍රීසි |
| ඊ.ටී.වී (ETV) | පෞද්ගලික | ඉංග්‍රීසි |
| ශක්ති ටී.වී | පෞද්ගලික | දෙමළ |

මූලාශ්‍රය: රූපවාහිනී සංස්ථාව, 2011

## 2.5 ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා කෘෂිකාර්මික ව්‍යාප්තියට එමගින් ලැබෙන දායකත්වය

ශ්‍රී ලංකාවේ බහුතර ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂි කර්මාන්තය වුව ද, දේශීය කෘෂි නිෂ්පාදන මෙරට පරිභෝජනය සඳහා පවා වර්තමානයේ දී ප්‍රමාණවත් නොවේ. මෙරට කෘෂි කාර්මිකයන්ගේ තත්වය තිරසාර ලෙස වර්ධනය කර ගැනීම, සමස්ත රටෙහි ම මානව ජීවන තත්ව දර්ශකය ඉහළ අගයක් කරා ගෙන යාමට ඉවහල් වේ. කෘෂිකාර්මික සංවර්ධනය යථාර්ථයක් කර ගැනීමට නම් කෘෂි නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ ද, නිරන්තරයෙන් නවීකරණය වන තාක්ෂණික දැනුම ද, එම යෙදවුම් දේශීය වශයෙන් සුලභ වීම ද, ඒ සඳහා අවශ්‍ය වන දිරිගැන්වීම ද, යටිතල පහසුකම් ද සැපයිය යුතු වේ. මෙහිලා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය මගින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ හැකි වේ (Wickramasinghe I, 1979).

කෘෂිකාර්මික ව්‍යාප්තිය, කෘෂිකාර්මික සංවර්ධනයේ මූලිකාංගවලට අනුව සිදු වේ. එය අවිධිමත් ක්‍රමවේදයකි. ක්ෂේත්‍ර පුහුණු පාසල්, ක්ෂේත්‍ර දින, ක්ෂේත්‍ර චාරිකා, පුහුණු පංතිවල වගා ආදර්ශන, ශ්‍රව්‍ය දෘශ්‍ය සැසි සුලභ හා ජනප්‍රිය ක්‍රමවේදයන් වේ. කෘෂිකර්ම ව්‍යාප්ති සීමාවලින් ඔබ්බට යමින් කෘෂිකාර්මික ප්‍රජාව දිරි ගැන්වීම, අභිප්‍රේරණය, විනෝදාස්වාදය, අගය කිරීම් වැනි අභිමතාර්ථයන් ඉටුවන පරිදි ව්‍යාප්ති කටයුතු සංවර්ධනය කළ හැකිය. ඩැනියෙල් බෙනර්, ජේම්ස් කිව් හැරිසන්, මයිකල් බැක්ස්ටර් යන පර්යේෂකයන් විසින් 1984 දී පෙන්වා දුන් පරිදි කෘෂිකාර්මික ව්‍යාප්ති ක්ෂේත්‍රය තුළ සිටින කාර්ය මණ්ඩල පුහුණු කිරීමට ද, අභිප්‍රේරණයට ද, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ද ව්‍යාප්ති ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු බෙදා හැරීම ඉතා වැදගත් වේ. සාර්ථක ගොවීන් පිළිබඳ කතන්දර, ගොවීන්ගේ

24092



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

ප්‍රතිචාර, ව්‍යාප්ති සේවකයන්ගේ ජයග්‍රහණ, ඇගයීම් හා ක්ෂේත්‍ර පර්යේෂණවල ප්‍රතිඵල ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය, කෘෂි කාර්මික සංවර්ධනය සඳහා අතිශයින් ඉවහල් වන බව ඔවුහු පෙන්වා දෙති.

කෘෂි කාර්මික සංවර්ධනය සඳහා විධිමත් නව කාර්මික පර්යේෂණ ඉතා වැදගත් වේ. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර 1986 පෙන්වා දුන් පරිදි සංවර්ධන ක්‍රියාවලිය තුළ ව්‍යාප්ති සේවයක තොරතුරු ගලනය ආකාර දෙකකින් සිදු වේ. ඒ අනුව, පර්යේෂකයන් හා ක්ෂේත්‍ර සේවකයන් මඟින් බිම් මට්ටමේ තොරතුරු ඉහළට ගමන් කරන බවත්, ජනමාධ්‍ය ක්ෂේත්‍ර සේවකයන් හා සංවිධාන සතු ඒවාට ම ආවේනික රටා මඟින් තොරතුරු ඉහළ සිට පහළට ගමන් කරන ආකාරයක් පෙන්වා දී ඇත. කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ දී තොරතුරු විශාල මිනිසුන් පිරිසක් වෙත බෙදා හැරීම සඳහා ජනමාධ්‍ය උපයෝගී කර ගත හැකි වේ. ජන මාධ්‍ය පදනම් කර ගත් ව්‍යාප්ති ක්‍රමෝපායය, වේගය හා පිළිගැනීම අතින් ඉහළ අතර වියදම අඩු වේ. ඉතා විශාල භූගෝලීය ප්‍රදේශයක ජීවත් වන මිනිසුන් ක්ෂේත්‍රයකින් ආවරණය කිරීමේ හැකියාව ජනමාධ්‍ය සතු වේ. නව වෙනසකට වඩාත් දියුණු වන වගා රටාවකට ගොවීන් අනුගත කිරීමේ ක්‍රියාවලිවයේ පළමු පියවරයන් වන දැනුවත් භාවය ඇති කිරීම, උනන්දුව ජනනය කිරීම වැනි දේ සම්බන්ධයෙන් ජන මාධ්‍යයට සාධනීය මෙහෙයක් ඉටු කළ හැකි ය. කෘෂිකාර්මික සංවර්ධනය හා ප්‍රාදේශිය ගුවන් විදුලිය නම් ග්‍රන්ථයේ වම්ල ලියනගේ සඳහන් කරන පරිදි, කෘෂි කාර්මික ව්‍යාප්ති ක්‍රියාවලියේ දී ජනමාධ්‍ය පහත ආකාරයට දායක කර ගත හැකි වේ (ලියනගේ වම්ල, 2010).

- තොරතුරු හා නව සොයා ගැනීම් ප්‍රචාරණය.
- නව සොයා ගැනීම් පිළිබඳව ගොවීන් තුළ උනන්දුව ඇති කිරීම.
- ස්වාභාවික සම්පත්, පළිබෝධ උවදුරු, රෝග නියඟ ආදිය පිළිබඳව කාලීනව තොරතුරු සැපයීම
- ව්‍යාප්ති කටයුතුවල බලපෑම ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩි කිරීම (නව්‍ය සොයා ගැනීම් හා ඒවායේ සාර්ථක ප්‍රතිඵල පිළිබඳ තොරතුරු.) ජන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය.
- එක් ගොවි ප්‍රජාවක තොරතුරු හා අත්දැකීම් තවත් ගොවි ප්‍රජාවක් සමඟ බෙදා හදා ගැනීම(දේශීය හා විදේශීය).

ව්‍යාප්ති සේවකයන් හට කෘෂිකර්ම ව්‍යාප්තිය සඳහා මාධ්‍ය භාවිතය තනිව කළ හැක්කක් නොවේ. ජනමාධ්‍ය සංදේශ සැකසීම සඳහා ප්‍රවීණත්වයක් සහිත වෘත්තිකයන්ගේ සහාය අත්‍යාවශ්‍ය වේ. එසේ වුව ද ජනමාධ්‍ය වැඩ සටහන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දෙමින් ව්‍යාප්ති සේවකයන් හට ඊට දායක විය හැකි ය. එසේ ලබා දිය හැකි තොරතුරු වන්නේ ක්ෂේත්‍ර දත්ත, ඡායාරූප, පටිගත කළ සම්මුඛ සාකච්ඡා හා සංඛ්‍යාත්මක තොරතුරු වේ. කාලිංග ටියුඩර් සිල්වා, කෙයාර් ජාත්‍යන්තරය සමඟ 2006 දී කළ අධ්‍යයනයකින් පසුව සඳහන් කළේ කෘෂිකාර්මික ව්‍යාප්තිය සඳහා අදාළ තොරතුරු, පුවත්පත්, ප්‍රජා ගුවන් විදුලි සේවා, බිත්ති පුවත් පත් මඟින් ප්‍රචාරය කිරීම වඩාත් ප්‍රතිඵල දායක වන බවයි. එමෙන් ම වම්ල ලියනගේ ජනමාධ්‍ය හා කෘෂි කාර්මික සංවර්ධනය පිළිබඳව විශ්ලේෂණය කරමින් සිය "කෘෂිකාර්මික සංවර්ධනය හා ප්‍රාදේශිය ගුවන් විදුලිය" නම් කෘතියේ තව දුරටත් සඳහන් කළේ ජන මාධ්‍ය අතුරින් ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ව්‍යාප්තිය සඳහා වඩාත් ම යෝග්‍ය මාධ්‍ය වන්නේ ගුවන් විදුලිය වන බවයි. එයට හේතු වශයෙන් ඔහු සඳහන් කළේ ගුවන් විදුලි මාධ්‍ය භාවිතයේ පහසුව, අඩු පිරිවැය, අධ්‍යාපනිකව

ඉහළ සුදුසුකම් අවශ්‍ය නොවීම,හා තම වැඩ කටයුතුවල නියැළෙන අතර ම භාවිතා කළ හැකිවීම යන කරුණු වේ(ලියනගේ චමිල, 2010).

ශ්‍රී ලංකාව තුළ ජනමාධ්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණ සිදු නොවන තරම් ය. එසේ ම එම පර්යේෂණ තුළ කෘෂිකාර්මික සංවර්ධනය හා ජනමාධ්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණ ඉතා විරල වේ. ඩැනියෙල් බෙනර්, ජේම්ස් කිව් හැරිසන්, හා මයිකල් බැක්ස්ටර් යන පර්යේෂකයන් තවදුරටත් පෙන්වා දෙන්නේ ගොවීන් වෙත සාමාන්‍ය තාක්ෂණික තොරතුරු ලබා දෙමින් ද, පුවත්පත් ගුවන් විදුලි සේවා හා රූපවාහිනී සේවා වැනි රාජ්‍ය මාධ්‍යයන්ට ද කෘෂි ව්‍යාප්ති සේවා ඉහළ මට්ටමකට ගෙන ඒමට විශාල අනුබලයක් ලබා දිය හැකි බවයි. එවැනි විධිමත් සන්නිවේදන ක්‍රමෝපායක් අනුගමනය නො කරන්නේ නම් කෘෂිකර්ම ව්‍යාප්තිය අසාර්ථක සේවාවක් වනු ඇත. එය ජාතික මට්ටමේ, පළාත් මට්ටමේ නිලධාරීන් ද, පර්යේෂණ ආයතනවල පර්යේෂකයන් ද, දිස්ත්‍රික් මට්ටමේ කාර්ය මණ්ඩල ද, ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමේ විෂය භාර නිලධාරීන් හා කෘෂි උපදේශකවරුන් සිටි පමණින් සාර්ථක නොවේ.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ නියැළෙන ගොවි ජනතාව හා ඔවුන් භාවිතා කරන ජනමාධ්‍ය හා එම පාර්ශව දෙක අතර ඇති සබඳතාව පැහැදිළි කරන අධ්‍යයනයක් 1978 දී ශ්‍රී ලංකාවේ විවිධ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව සිදු කෙරී ඇත. දුව, කහපත්විල ගම, නාඩු ඔඩායි, හා උස්සන් යන ගම්මාන ආශ්‍රිතව සිදු කරන පර්යේෂණවල දී ජනතාව හා ජනමාධ්‍ය අතර සම්බන්ධතාව විවරණය කර තිබේ. උදාහරණ වශයෙන් එහි දී සොයා ගත් ආකාරයට 17%ක් පමණ ජනතාවකට ගුවන් විදුලිය අයත් ව තිබුණු අතර, එයින් 64%ක් පමණ දිනපතා ගුවන් විදුලියට සවන් දෙති. එසේ ම 4%ක් පමණ දිනපතා පුවත් පත් මිල දී ගනී (Wanigarathne, 1978). එමෙන් ම 1976 දී, ශ්‍රී ලංකාවේ ගම්මාන ආශ්‍රිතව ෂෙල්ටන් ගුණරත්න විසින් කරන ලද පර්යේෂණයක දී සොයා ගෙන ඇත්තේ එවකට ශ්‍රී ලාංකික කෘෂි ගම්මානවල ජනතාවගේ ප්‍රධාන දැනුම ලබා ගැනීමේ මාධ්‍යයන් වී ඇත්තේ ගුවන් වදුලිය හා පුවත් පත් වන බවයි. එහි දී, එම මාධ්‍යයන් භාවිතය පවා නගර ආශ්‍රිත ගම්මානයන් හි ඉහළ ප්‍රතිශතයක් ගන්නා බව පෙන්වා දී ඇති අතර වඩාත් පිටිසර ගම්මානවල දී එම භාවිතය ඉතා අඩු ප්‍රතිශතයකි. පිටිසර ගම්මානවල ජනතාවගේ දැනුම ලබා ගැනීමේ ප්‍රධානම මාධ්‍ය වී ඇත්තේ පාරම්පරික දැනීම හා සිය අත්දැකීම් ආශ්‍රිතව ගොඩනැගී ඇති කෘෂිකාර්මික දැනුම බව ද එහි දී පෙන්වා දී ඇත (Gunerathne Shelton, 1976). එමෙන් ම පී.සී. අතපත්තු හා සී. ප්‍රේමසිංහ විසින් "කෘෂිකර්ම ව්‍යාප්තිය සඳහා නව ඇරඹුමක්" යනුවෙන් සිදුකරන ලද සමීක්ෂණයක දී ,ජනමාධ්‍ය මගින් බෙදාහරින ලද දැනුම ගොවි ජනතාවට ප්‍රයෝජනවත් වන්නේ ද හා එම දැනුම ඔවුන්ගේ එදිනෙදා කටයුතු සඳහා ප්‍රායෝගික සහායක් ලබා දෙන්නේ ද යන ගැටලුවලට පිළිතුරු සොයාගෙන තිබේ.

Mohammad et, al 1975 විසින් එවැනි ම පර්යේෂණයක් සිදු කරමින් ගොවීන් ඉලක්ක කොට ගනිමින් කරන ලද වැඩසටහන්වල සාර්ථකත්වය හා එම දැනුම ලබා ගැනීමෙන් ඔවුන්ගේ වගා රටාවල සිදු වූ වෙනස්කම් අධ්‍යයනය කොට ඇත. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය මගින් කෘෂිකාර්මික ව්‍යාප්තිය සඳහා ලැබෙන දායකත්වය මිණුම් කිරීමේ දී "අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුඩාකුඹුක්ගොල්ලෑව කෘෂිකාර්මික ප්‍රජාවේ ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අපේක්ෂිත තොරතුරු අවශ්‍යතාවය පරිපූර්ණ කිරීමට ශ්‍රී ලංකා ගුවන් විදුලියේ රජරට සේවයෙන් ලැබෙන දායකත්වය" යන පර්යේෂණ තේමාව යටතේ චමිල ලියනගේ විසින් සිදු කරනු ලැබූ සමීක්ෂණය ජනමාධ්‍යක් වශයෙන් ගොවි ජනතාවගේ අවශ්‍යතා සැපිරීම

සඳහා ගුවන් විදුලියේ දායකත්වය විස්තර කෙරේ. මෙහි දී ක්ෂේත්‍ර අධ්‍යයනයට සහභාගි කරගත් පුද්ගලයන්ගෙන් ගුවන් විදුලියක් සතුව තිබුනේ 76%කට පමණි. එම පිරිසෙනුත් 76%ක් වඩාත් රජරට සේවයෙන් ගුණාත්මක කෘෂිකාර්මික තොරතුරු ලබා ගැනීම අපේක්ෂා කරයි. එයට සවන් දෙන්නන්ගෙන් 63%ක් ප්‍රකාශ කළේ, යම් ආකාරයක කෘෂිකාර්මික තොරතුරු ඔවුන්ට රජරට සේවයෙන් ලැබෙන බවයි. සමස්ත ප්‍රජාවෙන් 16%ක් රජ රට සේවයෙන් ලත් කෘෂිකාර්මික තොරතුරු මත සාර්ථකත්වයට පැමිණි ගොවීන් පිළිබඳව දැනුවත්ව සිටින බව සඳහන් විය.

ඉහත සමීක්ෂණ ප්‍රතිඵල අනුව පැහැදිළි වන ප්‍රධාන ම කරුණ වන්නේ, කෘෂිකාර්මික නව දැනුම, අදාළ පාර්ශවයන් වෙත සමීප කරලීම සඳහා ජනමාධ්‍යවල සහාය ලබා ගැනීමෙන් එම කාර්යය සාර්ථක වීමේ ඉහළ විභවක් පවතින බවයි. එම නිසා ජනමාධ්‍ය හා කෘෂි ව්‍යාප්තිය අතර සබඳතා තව තවත් විධිමත් හා කාර්යක්ෂම ලෙස සම්බන්ධ කළ යුතු බව පැහැදිළිය.

## 2.6 ලෝකයේ වෙනත් රටවල ජනමාධ්‍ය හා කෘෂිකර්මාන්තය අතර සබඳතාවය

ජනමාධ්‍ය භාවිතය නිවරදිව සිදුකළ හොත් එමගින් සාර්ථක ප්‍රතිඵල නෙළා ගත හැකි බව නිරන්තරයෙන් තහවුරු වන කරුණකි. ඉහත සඳහන් කළ ශ්‍රී ලාංකික නිදසුන් මෙන් ම ලෝකයේ වෙනත් බොහෝ රටවල් ද ජනමාධ්‍ය භාවිතය ගැන විවිධ පර්යේෂණ සිදුකොට ඇත. එමෙන් ම ජනමාධ්‍ය භාවිතයෙන් ගොවි ජනතාව ලබන පහසුකම් හා සංවර්ධනය පිළිබඳව ද නොයෙක් පර්යේෂණ පවතී.

ශ්‍රී ලංකාවේ මෙන් ම ලෝකයේ බොහෝ රටවල් වර්තමානයේ ජනමාධ්‍ය තම රටවල කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය සඳහා සාර්ථකව යොදාගන්නා බවට තහවුරු වී තිබේ. උදාහරණයක් ලෙස මහාචාර්ය රෝහණ මහලියනාරච්චි (2003)ට අනුව, පැසිෆික් කලාපයේ දූපත් වන කිරි බැටි, ටොන්ගා, ෆීජි, වැනි රටවල් කෘෂිකාර්මික තොරතුරු සන්නිවේදනයේ දී ගුවන් විදුලිය ඉතා කාර්යක්ෂම ව යොදාගනු ලබයි. ජනමාධ්‍ය භාවිතය නිවැරදි ආකාරයට යොදා ගනු ලබන්නේ නම් එය බෙහෙවින් ප්‍රයෝජනවත් ලෙස කෘෂිකාර්මික ව්‍යාප්තියට යොදා ගත හැකි ය. එපමණක් නොව, දියුණු වන ලෝකය සමග ජනමාධ්‍ය හා කෘෂිකර්මාන්තය බද්ධ කිරීමෙන් විශාල ධනාත්මක වෙනසක් සිදුකිරීමට හැකියාවක් ඇති බව එම්.ජී. දෙසායි, "Communicating with Rural India" නම් සිය ලිපියෙහි සඳහන් කොට ඇත.

ජනමාධ්‍ය භාවිතය ගැන Umeh, 2008 විසින් සිදුකරන ලද තවත් පර්යේෂණයක දී හෙළි වූයේ, නයිජීරියාවේ එක්තරා ප්‍රාන්තයක ජනතාව විසින් කෘෂි තොරතුරු සන්නිවේදනය සඳහා ගුවන් විදුලි මාධ්‍යය 66.7%කුත්, රූපවාහිනී මාධ්‍ය 20.8%කුත්, මුද්‍රිත මාධ්‍යයන් 12.5%කුත් යොදා ගන්නා බවයි. එමෙන් ම එහි දී පෙනී ගියේ, එසේ මාධ්‍ය භාවිතා කිරීම නිසා ඔවුන්ගේ භෝග ඵලදායීතාවය 70.8%කින් ඉහළ ගොස් ඇති බවයි.

විද්‍යුත් මාධ්‍ය මගින් හඳුන්වා දෙන නව තාක්ෂණික ක්‍රමවේදයන් ගොවි ජනතාවට සමීප වී ඇති ප්‍රතිශත ප්‍රමාණයන් ගැන පකිස්ථානයේ මධ්‍යම පන්ජාබ් ප්‍රදේශයේ සිදු කෙරුණු පරීක්ෂණයක දී හෙළි වූයේ 22.8% ක ගොවීන් ප්‍රමාණක් තමන්ට අවශ්‍ය කෘෂි තොරතුරු, විද්‍යුත් මාධ්‍යන් හි විකාශනය වන වැඩසටහන් හරහා ලබා ගන්නා ලද බවත්, එයින් 26.1%ක ප්‍රතිශතයක් කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් අනුගමනය කරන බවත්ය. මෙම ගොවීන්ගෙන් 91.1%ක් ම තරුණ ගොවීන් වීම ද විශේෂත්වයකි (Abbas M, et, al,

2001). කෙසේ වුව ද, මෙම ජන මාධ්‍ය භාවිතය බොහෝ සූක්ෂම ලෙස සිදු කළ යුතු ක්‍රියාවලියකි. මෙහි දී ග්‍රාහකයා හා සන්නිවේදකයා අතර පැවතිය යුතු සබඳතාවය මෙන් ම දීමට බලාපොරොත්තු වන පණිවුඩය බොහෝ සූක්ෂම ලෙස සිදු කළ යුතු ක්‍රියාවලියකි. මෙහි දී, ග්‍රාහකයා හා සන්නිවේදකයා අතර පැවතිය යුතු සබඳතාවය මෙන් ම දීමට බලාපොරොත්තු වන පණිවුඩය එම ආකාරයට ම ග්‍රහණය කර ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම කිසිසේත් නොවටින්නේ නොවේ. ඒ පිළිබඳව Singh සහ Hargue විසින් 1970 දී කරන ලද සමීක්ෂණයක සඳහන් වන්නේ කෘෂිකාර්මික දැනුම ගලනයේ දී එය ක්‍රමයෙන් වියැකෙමින් පහළ ග්‍රාහකයන් වෙත ලැබෙන ආකාරය පිළිබඳවයි. මෙහි දී සොයා ගත් පරිදි සම්පූර්ණ පණිවුඩයෙන් දිස්ත්‍රික් මට්ටමේ ග්‍රාහකයන් 55.27%ක ප්‍රතිශතයක් ග්‍රහණය කර ගනු ලබන අතර එය ගම් මට්ටමට යන විට ප්‍රතිග්‍රහන හැකියාව 28.7% තෙක් අඩු වී තිබෙනු දැකිය හැකි ය.

එමෙන් ම, කෘෂිකාර්මික සංවර්ධනයට ජනමාධ්‍ය භාවිතා කළ හැකි ආකාරය ගැන සිදුකෙරුණු පර්යේෂණයකින් (Egbule E. et, al 2003) පැහැදිලි වන්නේ එය, භෝග විවිධාංගිකරණය පිළිබඳ දැනුම වර්ධනයට 60.5%කින් ද, පොහොර යෙදීමේ දැනුම ලබා ගැනීමට 34.6%කින් ද, සැකසීමේ හා ගබඩා කිරීමේ දැනුම සඳහා 40.76%කින් ද, කෘමි පළිබෝධ මර්දනයට 20.65%කින් ද දායක වන බවයි.

## 2.7 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් හි අරමුණු සහ ක්‍රියාකාරීත්වය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවීන් සඳහා කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ලබාදීම සඳහා දැනට ජාතික රූපවාහිනිය හරහා කෘෂිකාර්මික වැඩසටහන් 2ක් විකාශනය කරනු ලබයි.

1. ගොවිබිමට අරුණළු
2. මිහිකත දිනුවෝ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දායකත්වයකින් තොරව "ඊවිදින අරුනැල්ල", "සැඟවුණු කතාවනු" යනුවෙන් වැඩසටහන් දෙකක් ද, ජාතික නාලිකාව හරහා විකාශනය වන අතර අධ්‍යයනයේ දී වඩාත් සැලකිලිමත් වූයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳව පමණි.

### 2.7.1 "ගොවි බිමට අරුණළු" කෘෂිකාර්මික වැඩසටහන

"ගොවි බිමට අරුණළු" කෘෂිකාර්මික වැඩසටහන ආරම්භ වන්නේ 1994 වර්ෂයේ දී මසකට එක් විකාශන වාරයක් ලෙසිනි. ආරම්භයේ දී විකාශන කාලය විනාඩි 30 ක් වූ අතර පසුකාලීනව විනාඩි 15 කට සීමා වී පස්වරු 6.00 – 7.00 අතර කාලය තුළ විකාශනය වීය. ආරම්භක අවධියේ දී බවර් සහ සමාගමේ අනුග්‍රාහක දායකත්වය ලැබී ඇති අතර 1998/1999 න් පසුව පූර්ණ ලෙසම රජයේ අනුග්‍රාහක දායකත්වයෙන යුත් කෘෂිකාර්මික වැඩසටහනක් ලෙස සතියකට එක් වරක් ලෙසින් විකාශනය වී ඇත.

අරමුණ

ගොවි බිමට අරුණළු කෘෂිකාර්මික වැඩසටහනෙහි අරමුණ වී ඇත්තේ, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ දිනෙන් දින ජනනය වන නව තාක්ෂණික දැනුම ගොවීන් හෝ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට උනන්දුවන ඕනෑම පුද්ගලයෙකු වෙත ලබා දීමයි. ඊට අමතරව කාලීනව වැදගත් වන කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතාවය මත අදාළ කාලය තුළ ම ගොවීන් වෙත ලබාදීම ද මෙහි අරමුණු අතර පවතී.

වැඩසටහන් ආකෘතිය

ආරම්භයේ දී මෙම වැඩසටහන නාට්‍යමය ස්වරූපයෙන් හා වීදි නාට්‍ය ස්වරූපයෙන් සිදු කළ ද වර්තමානයේ මේ සඳහා පවතින අධික පිරිවැය හේතුවෙන් එවැනි නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම අඩු වී ඇත. විකාශනය වන විනාඩි 15ක කාල පරාසය තුළ කෘෂිකර්මාන්තයට අදාළ විෂයානුබද්ධ කරුණු 03ක් පිළිබඳ සාකච්ඡා කෙරෙන අතර පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කරන්නේ නම්, එය අදාළ පර්යේෂකයා විසින් සජීවී ව වැඩසටහන හරහා ඉදිරිපත් කෙරේ. ඊට අමතරව දියුණු තාක්ෂණික දැනුම පිළිබඳ තොරතුරු ද ගොවියා වෙත ඉදිරිපත් කරනු ලබයි.

එසේ ම කාලීනව වැදගත් වන තොරතුරු ඒ අවස්ථාවේ දී ම සාකච්ඡා කර තොරතුරු ලබාදීම ද සිදු කෙරේ.. එනම් යම් ප්‍රදේශයක අසාමාන්‍ය ලෙස පැතිරෙන පළිබෝධ හෝ රෝග පැතිරීමක් පිළිබඳ තොරතුරු සොයා ඊට අදාළ විශේෂඥ දැනුම ඇත්තෙකු කැඳවා සාකච්ඡා කර ගොවීන් හට තොරතුරු ලබාදීම මෙහි දී සිදු කෙරේ.

මෙම වැඩසටහන විකාශය වීමෙන් අනතුරුව එම පටිගත කළ වැඩසටහන "ගොවි සහන සරණ" සේවය වෙත ලබාදෙන අතර එමඟින් ද ගොවීන්ට අවශ්‍ය පසු තොරතුරු ලබා ගැනීම පහසු කිරීම සිදු කෙරේ. ගොවි බිමට අරුණළු වැඩසටහනෙහි විශේෂත්වය වන්නේ නිරන්තරයෙන් ම "ගොවි සහන සරණ" සේවය හා පවත්වා ගනු ලබන සම්බන්ධතාවයයි. "ගොවි සහන සරණ" සේවය වෙත පැමිණෙන ලාංකීය ගොවි ගැටලු හා අදහස් පිළිබඳ සැලකිලිමත් වෙමින් ද ගොවීන් වැඩි පිරිසක් මුහුණ දෙන ගැටලු හඳුනා ගනිමින් ද ඒවාට පිළියම් ලැබෙන පරිදි ද මෙම වැඩසටහන නිෂ්පාදනය කෙරේ. සාමාන්‍යයෙන් වැඩසටහන සැලසුම් කිරීම මාසයකට පෙර සිදු කරනු ලබයි.

### 2.7.2 "මිහිකත දිනුවෝ" කෘෂිකාර්මික වැඩසටහන

මෙම කෘෂිකාර්මක වැඩසටහන 1998 වර්ෂයේ දී ආරම්භ වී මසකට එක් විකාශන වාරයක් ලෙසින් විකාශය වී පසුව සතියකට එක් වරක් විනාඩි 15ක විකාශන කාලයක් පුරා වර්තමානය තෙක් විකාශය වේ. මෙය රාජ්‍ය අනුග්‍රාහක දායකත්වය යටතේ විකාශය වන්නකි.

අරමුණ

"මිහිකත දිනුවෝ" කෘෂිකාර්මික වැඩසටහනෙහි අරමුණ වන්නේ, යම් ගොවියෙකු ස්වකීය දැනුමත්, කෘෂිකාර්මික ආයතන හරහා ලබාදෙන දැනුමත්, එසේ ම වෙනත් අදාළ අත්දැකීම් ද ඒකරාශී කර ගනිමින් කෘෂිකර්මාන්තය තුළ සාර්ථකත්වයට පත් වී ඇත්නම්, ඔහු පිළිබඳව රටට හඳුන්වාදීම හා ඒ මඟින් සෙසු ගොවීන් ද කෘෂිකර්මාන්තය කෙරෙහි පොළඹවා ගැනීමයි.

වැඩසටහන් ආකෘතිය

මෙම වැඩසටහන නිෂ්පාදනය කිරීමේ දී ඒ සඳහා ව්‍යාප්ති ජාලයක් පවතී. එනම්, යම් ප්‍රදේශයක සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, පළාත් මට්ටමේ අධ්‍යක්ෂවරු, කෘෂිකර්ම උපදේශක හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදක සහකාර යන නිලධාරීන් මෙම ජාලයට අයත් වේ. යම් වැඩසටහනකට සාර්ථක ගොවියෙකු තේරීමේ දී අදාළ ප්‍රදේශයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා, පළාත් නිලධාරීන්, කෘෂිකර්ම උපදේශක සහ කෘ.ප.නි.ස. යන නිලධාරීන් ඊට සම්බන්ධ වේ. ඔවුන්ගේ අනුදැනුම මත තෝරා ගනු ලබන ගොවියාගේ ක්‍රියාකාරකම් හා ප්‍රගතිය රටටම හඳුන්වා දෙනු ලබයි.

අදාළ ගොවියාගේ ගොවි බිමට ගොස්, ඔහුගේ කාර්යයන් පිළිබඳ ඇගයීමට ලක් කරමින් සාකච්ඡාමය ස්වරූපයෙන් වැඩසටහන ඉදිරිපත් වේ. එම ගොවියාගේ සාර්ථකත්වයට බලපෑ කරුණු පිළිවෙළින් සවිස්තරාත්මක වැඩසටහන හරහා දිග හැරෙන අතර එය නරඹන පුද්ගලයා තුළ කෘෂිකර්මාන්තයේ යෙදීමට ආශාවක් හා පෙළඹවීමක්, දිරියක් මෙයින් ලැබෙන අතර ම විවිධ ප්‍රදේශයන්ට ආවේණික වන වගා ක්‍රම ,පළිබෝධ හා රෝග පාලන ක්‍රම ද සාකච්ඡා කිරීම මඟින් ගොවීන් දැනුවත් කරනු ලබයි.

### 2.7.3 ඉහත කෘෂිකාර්මික වැඩසටහන් 02 සඳහා වන පිරිවැය

මෙම වැඩසටහන් හි පිරිවැය දෙයාකාර වේ. එනම්, බාහිර පිරිවැය හා අභ්‍යන්තර පිරිවැය වශයෙනි. බාහිර පිරිවැය යටතට අයත් වන්නේ, ජාතික රූපවාහිනී සේවයට විකාශන කාලය සඳහා ගෙවන මුදල වේ. සතියකට වැඩසටහන් දෙකක් විකාශනය වන අතර එක් වැඩසටහනකට වැට් බද්ද ද ඇතුළුව රු. 74,750.00ක මුදලක් ගෙවනු ලබයි. වැඩසටහන් දෙක ම සඳහා එක් දර්ශන වාරයකට රු. 149,500.00ක් වැය වේ. වාර්ෂික පිරිවැය ගණනය කළහොත් එය රු. 71,176,000 කි.

දැනට ලබාගත හැකි වූ දත්ත පහත දැක්වෙන අතර මෙම පිරිවැය වාර්ෂිකව වෙනස් විය හැකි බව ද සඳහන් විය.

වගු අංක 2.3: එක් වැඩසටහනක් සඳහා වන පිරිවැය (වාර්ෂිකව වෙනස් වේ).

| වර්ෂය | පිරිවැය | 15% වැට් බද්ද එකතු වූ පසු |
|---|---|---|
| 2004 | 22,500.00 | 25,875.00 |
| 2010 | 55,000.00 | 63,250.00 |
| 2011 | 65,000.00 | 74,750.00 |

මූලාශ්‍රය : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2011

අභ්‍යන්තර පිරිවැය යනු ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකය තුළ ආයතනික වශයෙන් වැයවන පිරිවැය වේ. මෙය වැඩසටහන නිෂ්පාදනය කිරීමෙහි ලා ආයතනික වශයෙන් දායකත්වය සපයන නිලධාරී පිරිස ගේ වැටුප් සහ අමතර දීමනා ද ඇතුළුව කැමරා සහ වෙනත් උපකරණ සඳහා වන පිරිවැයයි. එක් වැඩසටහන් වාරයක් පටිගත කිරීම සඳහා රු. 5200/- ක DV Cam. ටේප් නම් වූ පටිගත කිරීමේ උපකරණයක් අවශ්‍ය වේ. පටිගත කරන ලද වැඩසටහන ගබඩා කොට රූපවාහිනී සංස්ථාව වෙත යවන Beeta (B) Cam. Tape නමින් හඳුන්වන ටේප් පටයක් ද අවශ්‍ය වේ. එය රු. 2000/- වර්තමාන(2011) වටිනාකමින් යුක්ත වේ. මෙයට අමතරව ඉන්ධන ගාස්තු, නිලධාරීන්ගේ වැටුප්, අතිකාල දීමනා, ගමන්

වියදම් දීමනා, රියදුරු යැපීම් වියදම් සහ අතිකාල දීමනා, තාක්ෂණික නිලධාරීන්ට දීමනා වෙනුවෙන් රාජ්‍ය අනුමත ගාස්තු වැය වේ. මෙම එක් වැඩසටහන් වාරයක් සඳහා ඒ අනුව රු. 20,000/-ක් පමණ වැය වේ. දළ වශයෙන් එක් වැඩසටහනක වියදම, වැඩසටහන සඳහා තෝරා ගනු ලැබූ රූගත කිරීම් කරනු ලබන ප්‍රදේශය අනුව ද වෙනස් විය හැකිය. අභ්‍යන්තර සහ බාහිර පිරිවැය සඳහා වාර්ෂිකව මුදල් වෙන් වන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ව්‍යාපෘති හා පුහුණු අංශයේ ප්‍රතිපාදන මඟින් ය.

තෙවැනි පරිච්ඡේදය

# අධ්‍යයන ප්‍රදේශයේ භෞතික, සමාජ, ආර්ථික හා කෘෂිකාර්මික පසුබිම

## 3.1 හැඳින්වීම

යම් ප්‍රදේශයක් තුළ කිසියම් අධ්‍යයනයක් සිදු කිරීමේ දී, එම ප්‍රදේශයේ සමාජීය, ආර්ථික, දේශගුණික, දේශපාලනික භෞතික සාධකයන් පිළිබඳව මනා අවබෝධයක් පැවතිය යුතු බැවින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ භෞතික, දේශගුණික, සමාජ, ආර්ථික ලක්ෂණ පිළිබඳව සාරාංශගත තොරතුරු විවරණයක් මෙම පරිච්ඡේදයෙන් සිදු කෙරෙන අතර දිස්ත්‍රික්කය තුළ අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ ගොවිජන සේවා මධ්‍යස්ථාන පිළිබඳ වූ සංක්ෂිප්ත කරුණු ඉදිරිපත් කිරීමක් ද සිදු කෙරේ.

## 3.2 කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටීම

ශ්‍රී ලංකාවේ වයඹ පළාතට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කය රටේ අනෙකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේ දී විශාලත්වයෙන් දෙවන ස්ථානය හිමි කර ගනී. මුහුදු මට්ටමේ සිට මීටර 116ක් උසින් පිහිටා ඇති දිස්ත්‍රික්කය පුරා ශේෂ වූ විශාල පාෂාණයන්ගෙන් සමන්විත වීම කැපී පෙනෙන ලක්ෂණයකි.

## 3.3 කුරුණෑගල දිස්ත්‍රික්කයේ භෞතික, සමාජ හා ආර්ථික පසුබිම

දිස්ත්‍රික්කයේ දේශගුණික ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කිරීමේ දී තෙත්, වියළි හා අතරමැදි යන දේශගුණික ලක්ෂණ තුන ම හඳුනා ගැනීමට හැකියාව තිබේ. මෙම විශේෂතාවය නිසාම එම පරිසරයන්ට අනුකූලව ගොඩ නැගුණු විවිධ සමාජීය, ආර්ථික, කෘෂිකාර්මික හා සංස්කෘතික චර්යා රටාවන්ගේ එකතුවක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය හඳුනා ගැනීමට හැකි වේ. ප්‍රදේශයෙන් ප්‍රදේශයට දේශගුණය යම්තාක් දුරට විචලනය වුව ද දිස්ත්‍රික්කය පුරා බොහෝ දුරට උෂ්ණ කාලගුණික තත්ත්වයක් දක්නට ලැබේ. මෙහි දී උෂ්ණත්වය සෙල්සියස් අංශක 17.7 සිට සෙල්සියස් අංශක 29.25 අතර විචලනය වේ. කෙසේ වුව ද, අප්‍රේල් මාසය තුළ දී බොහෝ දුරට උෂ්ණත්වය සෙල්සියස් අංශක 35 දක්වා ද වෙනස් විය හැකිය. මෙම උෂ්ණත්ව විචලනයන් තුළ දී ප්‍රදේශයේ පවතින විශාල පාෂාණයන් සුවිසල් භූමිකාවක් ඉටු කරයි. ඊට හේතුව ඒවා දිවාකාලයේ උණුසුම රඳවාගෙන එම උෂ්ණත්වය ද ප්‍රදේශයට එක්කරන බැවිනි. ප්‍රදේශයේ ප්‍රධාන ම දේශගුණික වෙනස්කම් සිදුවන්නේ මෝසම් තත්ත්ව පවතින කාලයක් වන මැයි – අගෝස්තු හා ඔක්තෝම්බර් ජනවාරි දක්වා වේ. මෙම කාලයන් තුළ දී, විශාල වර්ෂාපතනයක් ද දැකිය හැකි වේ. ප්‍රදේශයේ වර්ෂාපතනය සාමාන්‍යයෙන් මසකට මි.මි 50 සිට මි.මි 882 දක්වා වෙනස් වේ. මෙහි දී සාමාන්‍ය වර්ෂාපතනයක් හා සාමාන්‍ය උෂ්ණත්වක් සහිත දේශගුණයක්, නොවැම්බර් සිට පෙබරවාරි මැද දක්වා දැකිය හැකි වේ.

කුරුණෑගල දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 30කින් සමන්විත වන අතර සාපේක්ෂව එහි විශාල ජනගහනයක් ද, දැකිය හැකි වේ. මෙම දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන වශයෙන් ම සිංහල ජනගහනයක් දැකිය හැකි අතර, සුළු වශයෙන් දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ ජාතිකයන්ද වේ. මෙම සුළු ජාතීන් ද දිස්ත්‍රික්කය පුරා විවිධ ප්‍රදේශවල පැතිරී ජීවත් වන අතර, සැලකිය යුතු දමිළ හා මුස්ලිම් ජනගහනයක්, තෙලියගොන්න හා විල්ගොඩ ප්‍රදේශයන්ගෙන් හඳුනා ගැනීමට හැකි වේ. එමෙන් ම විවිධ ආගම් අදහන ජනකොටස් මෙහි දී හඳුනා ගැනීමට හැකිවන අතර බහුතරය බෞද්ධ ආගමිකයන් වේ. ඉස්ලාම්, හින්දු,

හා කතෝලික ආගම්වල ජනතාව ද අන්තර් සහයෝගීතාවයෙන් යුක්තව කටයුතු කිරීම සුවිශේෂී ලක්ෂණයකි(http://en.wikipedia.org.).

**වගු අංක 3.1: විවිධ වර්ෂවල ශ්‍රී ලංකාවේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනගහනය හා ජනගහන වර්ධනයේ ප්‍රතිශතයන්**

| වර්ෂය | ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය | | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධනය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 1963 | 10582.00 | 31% | 852.60 | 36% |
| 1971 | 12689.90 | 20% | 1025.60 | 20% |
| 1981 | 14846.80 | 17% | 1211.80 | 18% |
| 2001 | 18728.70 | 26% | 1452.40 | 20% |
| 2008 | 20216.00 | 8% | 1535.00 | 6% |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,2010

**වගු අංක3.2: කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ත්‍රී සහ පුරුෂ ජනගහන සංඛ්‍යාවන්**

| අංශය | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| නාගරික | 33488 | 16585 | 16903 |
| ග්‍රාමීය | 1509485 | 747580 | 761905 |
| වතු | 7027 | 3480 | 3547 |
| එකතුව | 1550000 | 767645 | 782355 |


මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,2010

අධ්‍යයන ප්‍රදේශයේ ආර්ථික කටයුතු පිළිබඳව අවධානය යොමු කිරීමේ දී, විශේෂ වැදගත්කමක් හිමි වන්නේ කෘෂිකර්මාන්තය සඳහා ය. ඒ අනුව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුළු වගා බිම් අතුරින් පොල් වගාව 49%ක් ද, වී වගාව 23%ක් ද, වශයෙන් හඳුනා ගැනීමට හැකිවන අතර ඊට අමතරව අනෙකුත් බෝගයන් 27%ක් හා රබර් 1%ක් ද යනාදී වශයෙන් පෙන්වා දීමට හැකි වේ. ඉහත සඳහන් වූ වගාකරන ලද භූමි ප්‍රමාණයන් යල හා මහ කන්න අනුව වෙනස් වේ. හේන් ගොවිතැන වැඩි වශයෙන් ම හඳුනා ගැනීමට හැකිවන්නේ ග්‍රාමීය ප්‍රදේශයන් හි වන අතර ග්‍රාමීය ගොවි ආර්ථිකය නැංවීම සඳහා මෙමගින් විශාල දායකත්වක් ලබා දේ. අඹ, කෙසෙල්, දොඩම්, අන්නාසි, හා ගස්ලබු වැනි පලතුරු වර්ග වගාව ද මෙහි දී බෙහෙවින් දක්නට ලැබේ.

රටේ සහල් අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී වගාව හරහා සැපිරේ. මීට අමතරව පහත රට එළවළු වගාව මගින් ආදායම් ලබන ගොවි ප්‍රජාවක් ද හඳුනා ගැනිමට හැකි වන අතර හේන් ගොවිතැන බහුලව සිදු කෙරේ. විශේෂයෙන් මුං, කව්පි, බඩ ඉරිඟු, තල, උදු, වැනි ධාන්‍ය වගාවට යොමු වීම හේන් වගාව තුළ හඳුනා ගැනීමට හැකි වේ.

පුස්තකාලය
LIBRARY
...ශ්‍රී.ප.පු.ආ
...RTI

ප්‍රස්තාර අංක 3.1: විවිධ වර්ෂවල මහ කන්නයේ දී දිස්ත්‍රික්කයේ වී වගා කළ බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.2010

පාරිසරික වශයෙන් සලකා බලන විට වියළි දේශගුණික තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබුණ ද මෙහි දී තෙත් සහ අතරමැදි යන දේශගුණික තත්ත්වයන් ද දක්නට ලැබීම විශේෂත්වයකි. ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්කය පුරා වී ගොවිතැන සිදු කෙරෙන අතර වර්ෂා ජලය ඒකරාශි කර ගන්නා විශාල ග්‍රාමීය වැව් සංඛ්‍යාවකින් සමන්විත වාරි ජල පද්ධතියක් හිමි වී තිබීම ගොවි ප්‍රජාව ලද සුවිශේෂී භාග්‍යයකි. දැදුරු ඔය සංවර්ධන ව්‍යාපෘතිය හරහා කෘෂිකර්මාන්තය සඳහා විශාල දායකත්වයක් ලැබී තිබෙන අතර දිවයිනේ වැඩි ම වැව් ප්‍රමාණයකට හිමිකම් කියනු ලබන්නේ ද කුරුණෑගල දිස්ත්‍රික්කය යි.

ආර්ථික කටයුත්තක් වශයෙන් සත්ව පාලනය ද ව්‍යාපාරික වශයෙන් සිදු කෙරෙන අතර කුකුළන්, ඌරන්, එළුවන්, හා ගවයින් ඇති කිරීම ප්‍රධාන වන අතර කිරි ගොවියන් වැඩි වශයෙන් හඳුනා ගැනීමට හැකි වීම ග්‍රාමීය ගොවි ආර්ථිකයේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය.

දිස්ත්‍රික්කයේ ආර්ථික කටයුතු අතර මිරිදිය ධීවර කර්මාන්තය සඳහා යොමු වීම ද හඳුනා ගැනීමට හැකිවන අතර එය සිදුකෙරෙන්නේ ජලාශ්‍රයන් ආශ්‍රිතව ය. ඉඟිණිමිටිය ජලාශය කේන්ද්‍ර කොට ගත් විශාල ධීවර ප්‍රජාවක් හඳුනා ගැනීමට හැකි අතර, මාගල්ල වැව ආශ්‍රිතව ද ධීවර කටයුතු විශාල වශයෙන් සිදු කෙරේ. එපමණක් නොව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති මධ්‍යම ප්‍රමාණයේ වැව් හා ජලාශ ආශ්‍රිතව ද ධීවර කටයුතු සිදු වේ. එමගින් ධීවරයන්ට ආර්ථික ලාභ ප්‍රයෝජන මෙන් ම අවශේෂ ජනතාවගේ පෝෂණ අවශ්‍යතා ද සපුරා ගැනීමට හැකියාවක් ලැබී තිබේ.

පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ රැකියා නියුක්තිය පිළිබඳව සලකා බැලීමේ දී ඉහළ අධ්‍යාපනය ලද බොහෝ පිරිස් රාජ්‍ය අංශයට යොමු වීම වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර පහළ අධ්‍යාපන මට්ටම්වල තවත් බොහෝ පිරිසක් දිස්ත්‍රික්කය තුළ හා ඉන් පිටත ඇඟලුම් හා වෙනත් රැකියාවන්ට යොමු වී තිබේ. එසේ ම ව්‍යාපාරික වශයෙන් ප්‍රසිද්ධ වෙළෙඳ නගරයක් වශයෙන් ද කුරුණෑගල නගරය හඳුනා ගැනීමට හැකි වේ(http://en.wikipedia.org.).

## 3.4. අධ්‍යයනය සඳහා තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවතින විවිධ දේශගුණික කලාප ආවරණය වන අයුරින් මෙන් ම විවිධ බෝගයන් ආවරණය වන ආකාරයෙන් අධ්‍යයනය සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන තෝරා ගනු ලැබිණි. පහත දැක්වෙන්නේ අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ඒවායෙහි ප්‍රධාන වශයෙන් වගා කරනු ලබන බෝග වේ.

**වගු අංක 3.3: දේශගුණික කලාපයන්ට සමානුපාතිකව තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ඒවායේ බෝග ව්‍යාප්තිය**

| දේශගුණික කලාපය | ගොවි ජන සේවා බල ප්‍රදේශය | බෝග ව්‍යාප්තිය |
|---|---|---|
| තෙත් | අලව්ව<br>පොතුහැර | වී, පොල්,<br>කොකෝවා, වැනිලා<br>කෙසෙල්, අන්නාසි, රඹුටන්, අඹ, අලිපේර<br>මිරිස්, වම්බටු, තක්කාලි,<br>බුලත්, ගම්මිරිස්, ඉගුරු, කහ |
| අතරමැදි | මැල්සිරිපුර<br>කුලියාපිටිය<br>වාරියපොළ<br>දොඩංගස්ලන්ද | වී, පොල්,<br>කෙසෙල්, අන්නාසි,<br>මිරිස්, වම්බටු, තක්කාලි, බණ්ඩක්කා,<br>මැගි බෝග (මෑ, වැටකොළු, කරවිල, පතෝල)<br>බුලත්, ගම්මිරිස්, ඉගුරු, කහ |
| වියළි | මහව<br>රාජාංගනය වම් ඉවුර<br>ගල්ගමුව<br>පඩුවස්නුවර<br>රඹේ | වී, පොල්,<br>කජු, කෙසෙල්<br>මිරිස්, වම්බටු, තක්කාලි, කැකිරි, වට්ටක්කා, බණ්ඩක්කා, මකද්කෙදාක්කා<br>මැගි බෝග (මෑ, වැටකොළු, කරවිල, පතෝල)<br>මුං, කවුපි, රටකජු, තල, උඳු,<br>පැගිරි, ගර්කින්, ළූණු, බඩ ඉරිඟු |

මූලාශ්‍රය: (http:// en.wikipedia. org)

සිව්වැනි පරිච්ඡේදය

# ප්‍රතිඵල හා සාකච්ඡා

## කෘෂිකාර්මික වැඩසටහන් සඳහා ගොවීන්ගේ නැඹුරුව

### 4.1 හැඳින්වීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳව ගොවීන්ගේ ප්‍රතිචාරය සොයා බැලීම සඳහා අහඹු ලෙස තෝරාගත් ගොවි නියැදිය (330) තුළ ජාතික රූපවාහිනී නාලිකාව නරඹන ගොවීන් කොපමණ සංඛ්‍යාවක් සිටීදැයි සොයා බැලීමේ දී නියැදියෙන් බහුතර පිරිසක් (321)ක් එනම් 97%ක් ජාතික රූපවාහිනී නාලිකාව නරඹන බව අනාවරණය විය. සුළු පිරිසක් (09) එනම් 3%ක් ජාතික නාලිකාව නරඹන්නේ නැති බව තොරතුරු සමීක්ෂණයේ දී හෙළි විය. ඒ අනුව, ජාතික රූපවාහිනී නාලිකාව නරඹන ගොවීන් අතරින් කෙතරම් සංඛ්‍යාවක් කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ ද යන්න පිළිබඳවත් ජාතික රූපවාහිනී නාලිකාව මෙන් ම කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමෙන් වැළකී සිටීමට හේතු විමසීමත් මෙම පරිච්ඡේදයේ දී විග්‍රහ කෙරේ. ඊට අමතරව ගොවීන්ගේ වයස් මට්ටම, අධ්‍යාපනික මට්ටම පිළිබඳවත් සාකච්ඡා කෙරෙන අතර සමස්තයක් ලෙස අධ්‍යයනයට ලක් වු ගොවීන් වඩාත් කැමති රූපවාහිනී වැඩසටහන් කවරේ ද යන්නත්, ගොවිතැනෙහි යෙදීමේ දී ගොවීන්ට අත්‍යවශ්‍ය දැනුම් ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමත් සිදුකෙරේ.


### 4.2 ජාතික රූපවාහිනී නාලිකාවේ කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් සංඛ්‍යාව

වගු අංක 4.1: කෘෂිකාර්මික වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන්ගේ ව්‍යාප්තිය

| නැරඹීම/නරඹන්නේ නොමැතිවීම | ගොවීන්ගේ ප්‍රතිචාරය | |
|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් | 242 | 75% |
| කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැති ගොවීන් | 79 | 25% |
| එකතුව | 321 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011

ප්‍රස්තාර අංක 4.1: කෘෂිකාර්මික වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන්ගේ ව්‍යාප්තිය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත.2011

4.1 වගුව සහ 4.1 ප්‍රස්තාරය අනුව ජාතික රූපවාහිනී නාලිකාව නරඹන ගොවීන්ගෙන්(321) 75%ක් කෘෂිකාර්මික වැඩසටහන් නරඹති. 25%ක් කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැති බවට අනාවරණය විය. මෙසේ කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමෙන් බැහැරව සිටීමට හේතු අධ්‍යයනය විසින් සොයා බැලුණු අතර එම ගොවීන් ඊට හේතු කිහිපයක් පිළිබඳ ප්‍රතිචාර දක්වන ලදී. එය 4.2 වගුව මඟින් පෙන්වා දී ඇත.

**වගු අංක 4.2: ජාතික නාලිකාව/කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැතිවීමට හේතු වූ කරුණු**

| හේතු වූ කරුණු | ගොවීන්ගේ ප්‍රතිචාරය | |
|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| නිවසේ සහ දරුවන්ගේ කටයුතුවලට බාධාවන බැවින් වැඩසටහන් නැරඹීමෙන් බැහැරව සිටීම | 62 | 78% |
| දෛනික කාර්ය බහුලත්වය නිසා අදාළ කාලය වෙන් කර ගත නොහැකිවීම | 42 | 53% |
| කෘෂි වැඩසටහන් විකාශනය වන කාලය පිළිබඳ දැනුවත්භාවයක් නොමැතිවීම | 38 | 48% |
| කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට ප්‍රියතාවයක් නොමැතිවීම | 11 | 14% |
| කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ අවශ්‍යතාවයක් නොමැතිවීම | 10 | 13% |

ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාව අනුව ප්‍රතිශතය ගණනය කර ඇති බැවින් ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011

නිවෙස්වල කටයුතු සහ අධ්‍යාපනය ලබන දරුවන්ගේ කටයුතුවලට බාධා වන බැවින් පුරුද්දක් ලෙස රූපවාහිනිය හා එහි වැඩසටහන් නැරඹීමෙන් වැළකී සිටින බව 78%ක් සඳහන් කළහ.දෛනික කාර්යබහුලභාවය නිසා අදාළ කාලය වෙන් කර ගැනීමට අපහසු බව 53%ක් සඳහන් කළ අතර කෘෂි වැඩසටහන් විකාශනය වන කාලය පිළිබඳ දැනුවත් නොමැති බව 48%ක් සඳහන් කළහ. මේ අනුව කෘෂි වැඩසටහන් විකාශනය වන කාලය පිළිබඳ දැනුවත් කිරීමේ අවශ්‍යතාවක් ද පවතින බව පෙනී යයි. එයට අමතරව කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට ප්‍රියතාවයක් නොමැති සහ කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට අවශ්‍යතාවක් නොමැති බව සඳහන් කළ පිරිසක් ද විය.

## 4.3 කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් ඒ පිළිබඳ දැනුවත් වී ඇති ආකාරය

ජාතික රූපවාහිනී නාලිකාව හරහා විකාශනය වන කෘෂිකාර්මක වැඩසටහන් නරඹන ගොවීන් මෙම වැඩසටහන් පිළිබඳ දැනුවත් වී ඇති ආකාරය විමසීමේ දී එය මාර්ග කිහිපයකින් සිදු වී ඇති බව පෙනුණි. එය ප්‍රතිශත විශ්ලේෂණයක් ලෙසින් 4.3 වගුවෙන් පෙන්නුම් කෙරේ.

**වගු අංක 4.3: කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ දැනුවත් වූ ආකාරය**

| දැනුවත් වූ ආකාර | ගොවීන්ගේ ප්‍රතිචාරය **n=242** | |
|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අහම්බෙන් දැනුවත්වීම | 208 | 86% |
| කෘ.ප.නි.ස. නිලධාරී මාර්ගයෙන් | 20 | 8% |
| අසල්වැසි ගොවි මහතුන් සහ ගොවි සංවිධාන නිලධාරීන් මඟින් | 16 | 7% |
| පවුලේ දු දරුවන් මඟින් | 07 | 3% |
| කෘෂිකාර්මික පුහුණු වැඩසටහන්වලට සහභාගීවීමේ දී | 13 | 5% |

ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාව අනුව ප්‍රතිශතය ගණනය කර ඇති බැවින් ප්‍රතිශතය එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

4.3 වගුව අනුව, කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ 86%ක් දැනවත් වී ඇත්තේ අහම්බෙනි. මෙවැනි වැඩසටහන් ජාතික රූපවාහිනියේ විකාශනය වන බව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් දැනුවත් කළ බව 8%ක් සඳහන් කරන ලදී. ඊට අමතරව, අසල්වැසි ගොවි මහතුන් සහ ගොවි සංවිධාන නිලධාරීන් මඟින් ද එම වැඩසටහන් පිළිබඳ දැනුවත් වූ පවුලේ දූ දරුවන් මාර්ගයෙන් ද දැනුවත් වී ඇත. විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගීවීමේ දී දැනුවත් වූ බව 5%ක් ප්‍රතිචාර දක්වන ලදී. මෙයට ඉහත දී සඳහන් කළ ආකාරයට ම කෘෂිකාර්මික වැඩසටහන් ප්‍රචාරයවීම පිළිබඳ තවදුරටත් දැනුවත් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව පෙනී යයි. එම දැනුවත් කිරීමේ මාර්ගයන් ලෙස කෘ.ප.නි.ස.වරයා, ගොවි සංවිධාන නිලධාරීන් හා කෘෂිකාර්මික පුහුණු වැඩසටහන් යන මාර්ගයන් ඉහළ මට්ටමින් භාවිතා කිරීම හරහා දැනුවත් කිරීමේ හැකියාව පවතින බව ගම්‍ය වේ.

### 4.4 කෘෂිකාර්මික වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන්ගේ අධ්‍යාපනික මට්ටම

අධ්‍යයන නියැදිය තුළ කෘෂිකාර්මික වැඩසටහන් නරඹන සහ නරඹන්නේ නැති ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අදහස් කළේ, කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට යොමු වී සිටින ගොවීන් කුමන අධ්‍යාපන මට්ටම්වලට අයත් වුවන් ද යන්න පැහැදිලි කර ගැනීමයි. වගු අංක 4.4න් ඒ බව පෙන්නුම් කෙරේ.

**වගු අංක 4.4: කෘෂිකාර්මික වැඩසටහන් නරඹන/නරඹන්නේ නැති ගොවීන් අධ්‍යාපන මට්ටම් අනුව ව්‍යාප්තව සිටින ආකාරය**

| අධ්‍යාපන මට්ටම | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන | | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැති | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පාසල් නොගිය | 02 | 0.1% | 02 | 3% |
| අ.පො.ස. (සා.පෙළ) දක්වා | 137 | 57% | 58 | 73% |
| අ.පො.ස. (සා.පෙළ) සමත් | 24 | 10% | 05 | 6% |
| අ.පො.ස. (උ.පෙළ) දක්වා | 38 | 16% | 08 | 10% |
| අ.පො.ස. (උ.පෙළ) සමත් | 30 | 12% | 04 | 5% |
| උපාධිධාරී/ඩිප්ලෝමා | 11 | 04% | 02 | 3% |
| එකතුව | 242 | 100.0 | 79 | 100.0 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත,2011

කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 57%ක් අයත් වන්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ මට්ටම දක්වා අධ්‍යාපනය ලැබූ කාණ්ඩයට වේ. සාමාන්‍ය පෙළ මට්ටම සමත් වූ ගොවීන්ගේ සහ උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ ගොවීන්ගේ ද (10%+16%) කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ යම් ප්‍රවණතාවක් පවතින බව පෙනී යයි. කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් අතර උපාධිධාරීන් සහ ඩිප්ලෝමාලාභීන් සිටින්නේ 4%ක් වැනි ප්‍රමාණයකි.

## 4.5 කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගේ වයස


කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් ගේ වයස පරාසයන් පිළිබඳ විමසීමේ දී වැඩි පිරිසක් වයස අවු. 30ට වඩා වැඩි වයස් මට්ටම්වල පසු වන්නන් බව පැහැදිළි විය. එය වගු අංක 4.5න් සහ ප්‍රස්තාර අංක 4.2න් විග්‍රහ වේ.

වගු අංක 4.5: වයස අනුව ව්‍යාප්තව සිටින ආකාරය

| වයස පරාසය | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන | | කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැති | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| <30 | 22 | 09% | 18 | 23% |
| 30-45 | 55 | 23% | 30 | 38% |
| 45-60 | 78 | 32% | 25 | 32% |
| 60< | 87 | 36% | 06 | 07% |
| එකතුව | 242 | 100.0 | 79 | 100.0 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

ප්‍රස්තාර අංක 4.2: කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගේ වයස




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

අධ්‍යයනය සඳහා තෝරා ගත් ගොවීන් අතර සිටින කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් වැඩි පිරිසක් අයත් වූයේ වයස අවු. 30ට වැඩි කාණ්ඩයට වේ. මෙහි දී, අවු.30ට අඩු තරුණ පිරිස 9%කි. වයස අවු.45-60 අතර කාණ්ඩයටත් 60ට වැඩි කාණ්ඩයටත් අයත් වූ ගොවීන් 68%කි (32%+36%). එයින් ද, අවු. 60ට වැඩි පිරිස ඉහළ ය. සමස්තයක් ලෙස වයස අවුරුදු 60ට වැඩි වූවන්ට කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට වැඩි නිදහසක් පැවතීම එයට හේතු වී ඇත. දූ දරුවන් විවාහ වී සිටීමත් විශ්‍රාමික වයසේ පසුවන්නන් වීමත් හේතුවෙන් වැඩසටහන් විකාශය වීමේ දී කාලය වෙන් කර ගැනීමේ අපහසුවක් නොමැති බව සඳහන් විය.

## 4.6 ගොවීන් වැඩි වශයෙන් අපේක්ෂා කරන දැනුම හා තොරතුරු

අධ්‍යයනයට යොමු වූ සියලු ගොවීන්ගේ වගා කටයුතුවල නියැළීමේ ප්‍රධාන පරමාර්ථය වී තිබුනේ අලෙවිය හා පාරිභෝජනය යන අරමුණු සපුරා ගැනීමයි. අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් 92%ක් එසේ සඳහන් කළහ. පරිභෝජනයට පමණක් වගා කටයුතුවල නියැළෙන ගොවීන් ද සුළු පිරිසක්(8%) හමු විය. කෙසේ වුව ද මෙම ප්‍රදේශය තුළ පාරිභෝජනය සේ ම අලෙවි පරමාර්ථ ද වැඩි බව පෙනුණි. අලෙවි පරමාර්ථ හා පාරිභෝජනය යන අරමුණු මත වගා කටයුතුවල නිරත වන ගොවීන්ට කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳ දිනෙන් දින නවයතාවයට පත්වන දැනුම මෙන් ම තොරතුරුවල අවශ්‍යතාව ද දැඩි බව අධ්‍යයනයේ දී පැහැදිළි වූ අතර ගොවීන් වැඩි වශයෙන් අපේක්ෂා කරන තොරතුරු හා දැනුම ක්ෂේත්‍රයන් කවරේ ද යන්න පිළිබඳව අධ්‍යයනයට සහභාගී වූ සියලු ගොවීන්ගෙන් විමසීමක් කරන ලදී.

**වගු අංක 4.6: ගොවීන්ට වැඩි වශයෙන් අවශ්‍ය වන දැනුම් ක්ෂේත්‍රයන් (ප්‍රතිචාර දැක් වූ අනුපිළිවළ අනුව දක්වා ඇත)**

| දැනුම හා තොරතුරු | ගොවීන් සංඛ්‍යාව n=330 | |
|---|---|---|
| | ප්‍රතිචාර සංඛ්‍යාව | % |
| පළිබෝධ පාලනය කිරීම පිළිබඳ දැනුම | 173 | 52.4 |
| විවිධ වගා ක්‍රම පිළිබඳ දැනුම | 164 | 50.0 |
| කාබනික පොහොර නිෂ්පාදනය හා යෙදීම පිළිබඳ දැනුම | 147 | 45.0 |
| නිර්දේශිත නව බීජ ප්‍රභේද භාවිතයට අවශ්‍ය දැනුම | 130 | 39.3 |
| නිෂ්පාදනවල මිල හා වෙළඳපළ තොරතුරු | 122 | 37.0 |
| ජල කළමනාකරණය පිළිබඳ දැනුම | 42 | 13.0 |
| ණය මූලාශ්‍රයන් හි තොරතුරු | 38 | 12.0 |
| කාලගුණික තොරතුරු | 21 | 6.3 |
| යන්ත්‍ර සූත්‍ර භාවිතයට අවශ්‍ය දැනුම | 18 | 5.0 |
| ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය හා ලබා ගැනීම පිළිබඳ දැනුම හා තොරතුරු | 15 | 4.5 |

*ප්‍රතිශතය ගණනය කර ඇත්තේ ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාව අනුව ය. එබැවින්, ප්‍රතිශත එකතුව 100 ට සමාන නොවේ.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

ගොවීන්ට වඩාත් අවශ්‍ය වන දැනුම ක්ෂේත්‍රයන් ලෙස වැඩි ප්‍රතිචාර දක්වා ඇත්තේ පළිබෝධ පාලනය, විවිධ වූ වගා ක්‍රමයන්, කාබනික පොහොර පිළිබඳ, නිර්දේශිත බීජ ප්‍රභේද ආදිය පිළිබඳව බව පෙනී යයි. එසේ ම, නිෂ්පාදන මිල හා වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ දැනුම අවශ්‍ය බැව් 37%ක් ප්‍රතිචාර දක්වා ඇත. වර්තමානයේ මිල තොරතුරු විවිධ මාර්ගයන් ඔස්සේ ගොවීන් අතරට යැවීමේ ක්‍රමෝපායයන්

පැවතිය ද එම ක්‍රමෝපායයන් තවදුරටත් වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ අවශ්‍යතාවක් පවතින බව පැහැදිළි වේ.

### 4.7: ගොවීන් නැරඹීමට වඩාත් කැමති රූපවාහිනී වැඩසටහන

සමස්තයක් ලෙස ගොවීන් විසින් වැඩි කැමැත්තක් දක්වන්නේ කුමන රූපවාහිනී වැඩසටහන් නැරඹීමට දැයි අධ්‍යයනයේ දී අවධානය යොමු කරන ලදී, එමගින් අපේක්ෂා කරන ලද්දේ, වඩාත් කැමති රූපවාහිනී වැඩසටහන හඳුනා ගැනීම හරහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ යම් තොරතුරක් හෝ දැනුමක් එම වැඩසටහන හරහා ගොවියා වෙත ලබාදීමේ හැකියාවක් පවතී ද යන්න හඳුනා ගැනීමයි. අධ්‍යයනයට යොමු වූ ජාතික නාලිකාව නරඹන ගොවීන් ඒ පිළිබඳ දැක් වූ ප්‍රතිචර පහත 4.7 වගුවෙන් පැහැදළි කෙරේ.

වගු අංක 4.7 : නැරඹීමට වඩාත් කැමති රූපවාහිනී වැඩසටහන් (ප්‍රතිචාර දැක් වූ අනුපිළිවෙළ අනුව දක්වා ඇත)

| වැඩසටහන් | ගොවීන් සංඛ්‍යාව n=321 | |
|---|---|---|
| | ප්‍රතිචාර සංඛ්‍යාව | % |
| ප්‍රවෘත්ති | 311 | 97.0 |
| ටෙලිනාට්‍ය සහ විනෝදාස්වාදය සපයන වෙනත් වැඩසටහන් | 287 | 89.0 |
| කෘෂිකාර්මික වැඩසටහන් | 242 | 75.0 |
| ආගමික වැඩසටහන් | 153 | 48.0 |
| විශේෂාංග වැඩසටහන් | 54 | 17.0 |
| අධ්‍යාපනික වැඩසටහන් | 41 | 13.0 |
| ක්‍රීඩා වැඩසටහන් | 08 | 2.5 |
| දේශපාලනික වැඩසටහන් | 07 | 2.2 |
| ව්‍යාපාරික වැඩසටහන් | 06 | 1.8 |
| විදෙස් වැඩසටහන් | 05 | 1.5 |

* ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාව මත ප්‍රතිශතය ගණනය කළ බැවින් ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

ජාතික රූපවාහිනිය නාලිකාව නරඹන ගොවීන් නැරඹීමට වඩාත් කැමැත්ත පළ කර ඇත්තේ, ප්‍රවෘත්ති විකාශයට වේ. ඊට වඩාත් කැමැති බව පවසමින් 97%ක් ප්‍රතිචාර දක්වා ඇත. දෙවනුව ටෙලිනාට්‍ය සහ විනෝදාස්වාදය සපයන වැඩසටහන්වලටත්, තෙවනුව කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමටත් ඉහළ ප්‍රතිචාර දක්වා ඇත. ඒ අනුව, ගොවීන් වැඩි ප්‍රතිශතයක් ප්‍රවෘත්ති විකාශය නැරඹීම සඳහා කැමැත්තක් තිබෙන බව අනාවරණය වන අතර, ප්‍රවෘත්ති විකාශය සමග කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ඉතා සුළු වශයෙන් හෝ ලබාදීමේ හැකියාව පවතින බව පෙනී යයි. අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයකට එවිට එය ග්‍රහණය කර ගැනීමේ හැකියාව පවතී.

ඉතා හදිසියේ හට ගන්නා වගා හානිකාරකයක් පිළිබඳව හෝ එදිනට අදාළ මිල තොරතුරු පිළිබඳව හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් ප්‍රවෘත්ති විකාශය අතරතුර දී තිරයේ දර්ශනය කිරීම හරහා මෙය සිදු කළ හැකි ය. එසේ ම කෘෂිකාර්මික වැඩසටහන් විකාශය වන වේලාවන් පිළිබඳව ද මේ හරහා දැනුවත් කළ හැකි ය.

පස්වැනි පරිච්ඡේදය

# කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ ස්වභාවය, ඉදිරිපත් කරන ආකාරය, ප්‍රයෝජනවත්භාවය හා බාධාවන් පිළිබඳ ගොවි ප්‍රතිචාර

## 5.1 හැඳින්වීම

ජාතික රූපවාහිනී නාලිකාව හරහා විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් ගොවීන් නරඹන ස්වභාවය පිළිබඳවත්, වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව ගොවීන් දක්වන ප්‍රතිචාර පිළිබඳවත්, ඔවුන් එම වැඩසටහන් නැරඹීමෙන් ලද දැනුම උපයෝගී කරගෙන ඇති ආකාරය පිළිබඳවත්, මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡාවට ලක් කෙරේ. එසේ ම, වැඩසටහන් නැරඹීමේ දී ගොවීන්ට පවතින බාධාවන් හා වැඩසටහන් තවදුරටත් ඵලදායකවීම සඳහා ගොවීන්ගේ යෝජනා පිළිබඳවත් සාකච්ඡා කෙරේ.

## 5.2 ගොවීන්ගේ කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ ස්වභාවය

මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත ජාතික රූපවාහිනී නාලිකාව හරහා විකාශය වන ගොවි බිමට අරුණළු සහ මිහිකත දිනුවෝ යන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර විමර්ශනය කිරීමටය.

නමුත් ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී අනාවරණය වු තොරතුරුවලට අනුව යට කී කෘෂිකාර්මික වැඩසටහන් දෙකට අමතරව ජාතික රූපවාහිනී නාලිකාව හරහා වීකාශය වන"රිච්දින අරුණැල්ල" සහ "සැඟවුණු කහවනු" නම් වූ කෘෂි වැඩසටහන් දෙක සඳහා ද ගොවීන්ගේ නැඹුරුවක් පවතින බව පෙනී යයි. මෙම වැඩසටහන් දෙකට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දායකත්වයක් නොමැති බැවින් අධ්‍යයනයේ ප්‍රස්තුතයට ද අදාළ නොවේ.එසේ වුවත් ගොවීන්ගේ නැඹුරුවක් පවතින බැවින් එම අදහස් ද අධ්‍යයනයේ දී සැලකිල්ලට ලක් කරන ලදි.

ඒ අනුව ගොවීන් මෙම කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ කුමන ආකාරයට ද යන්න පිළිබඳ විමසා බැලීමේ දී ලද ප්‍රතිචාර පහත 5.1 සංඛ්‍යා සටහනින් පැහැදිලි කෙරේ.

මෙහි දී, ගොවීන් වැඩසටහන් නරඹන ආකාර 3ක් සඳහා ප්‍රතිචාර දක්වන ලදි. "නිතරම"."ඉඳහිට" සහ"කලාතුරකින්" යනු එම ආකාර තුනයි.




පුස්තකාලය
LIBRARY
හෙ.ෆො. ගො.ජ.ප.පු.ආ
HARTI

වගු අංක 5.1: ගොවීන් වැඩසටහන් නැරඹීමේ ස්වභාවය

| | ගොවි බිමට අරුනළු | | මිහිකත දිනුවෝ | | සැගවුණු කහවනු | | ඊවිදින අරුණෑල්ල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| නිතරම | 27 | 33% | 18 | 29% | 15 | 33% | 21 | 41% | 81 | 33% |
| ඉදහිට | 34 | 41% | 28 | 44% | 18 | 40% | 18 | 35% | 98 | 41% |
| කලාතුරකින් | 22 | 26% | 17 | 27% | 12 | 27% | 12 | 24% | 63 | 26% |
| ප්‍රතිචාර එකතුව | 83 | 100.0 | 63 | 100.0 | 45 | 100 | 51 | 100.0 | 242 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

ප්‍රස්තාර අංක 5.1 ගොවීන්ගේ වැඩසටහන් නැරඹීමේ ස්වභාවය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

5.1 වගුවට සහ 5.1 ප්‍රස්තාර සටහන්වලට අනුව ඉහත වැඩසටහන් සියල්ල "නිතරම" සහ "කලාතුරකින්" නරඹන ගොවීන්ට සාපේක්ෂව "ඉදහිට" නරඹන ගොවීන් සංඛ්‍යාව වැඩි ය. එය කෘෂිකාර්මික වැඩසටහන් නරඹන සමස්ත ගොවීන් සංඛ්‍යාවෙන් 41%කි.

වැඩසටහන් නැරඹීමේ ස්වභාවය වෙන් වෙන් වශයෙන් සලකා බලන විට අනෙකුත් වැඩසටහන්වලට වඩා "ගොවිබිමට අරුණළු" වැඩසටහන පමණක් නරඹන ගොවීන් සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතී(83). "ගොවිබිමට අරුණළු" නරඹන ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් "ඉදහිට" නරඹන බවට ප්‍රතිචාර දක්වා ඇත. එය 41%කි. නිතරම නරඹන ගොවීන් ද සැලකිය යුතු පිරිසක් සිටින අතර එය 33%කි. ඊළඟට

ගොවීන් වැඩි වශයෙන් නරඹන බවට සඳහන් කර ඇත්තේ "මිහිකත දිනුවෝ"(63) වැඩසටහන වේ. එම වැඩසටහන ද "නිතරම" සහ "කලාතුරකින්" නරඹන ගොවීන්ට වඩා "ඉඳහිට" නරඹන ගොවීන් ප්‍රතිශතය ඉහළ ය(44%). ඒ අනුව කෘෂිකාර්මික වැඩසටහන් නිතරම, එනම් අඛණ්ඩ ව සතිපතා නැරඹීමට ගොවීන්ට නොහැකි වී ඇති බවත් "ඉඳහිට" එනම් සතිපතා අඛණ්ඩ නොවුවත් අවස්ථාව ලද විට කෙසේ හෝ නැරඹීමට පුරුදුව සිටින සංඛ්‍යාව වැඩි බවක් පෙනී යයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් තොරව විකාශනය වන වැඩසටහන් දෙක වූ "රිවිදින අරුණැල්ල" හා "සැඟවුනු කඟවනු" පිළිබඳ සැලකිලිමත්වීමේ දී පෙනී යන්නේ රිවිදින අරුණැල්ල "නිතරම" නරඹන සංඛ්‍යාව සාපේක්ෂව වැඩි බවයි. එය 41%කි. එසේ වුවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත විකාශය වන වැඩසටහන් දෙකම "නිතරම" "ඉඳහිට" සහ "කලාතුරකින්" යන ආකාර තුනටම නරඹන ගොවීන් සංඛ්‍යාවට සාපේක්ෂව "රිවිදින අරුණැල්ල" සහ "සැඟවුනු කඟවනු" නරඹන ගොවීන් සංඛ්‍යාව අඩු බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

## 5.3 රූපවාහිනී කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට පුරුදුව සිටින කාල වකවානුව

මෙහි දී ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත විකාශනය වන වැඩසටහන් දෙකට අමතරව ජාතික නාලිකාව හරහා විකාශය කෙරෙන අනෙක් වැඩසටහන් දෙක ද ඇතුළත් ව ගොවීන්ගේ ප්‍රතිචාරය විමසා බලන ලදී. "ගොවි බිමට අරුණළු" සහ "මිහිකත දිනුවෝ" වැඩසටහන් විකාශනය වීම ආරම්භ වී වසර දහයකට වඩා වැඩි කාලයක් ගත වී ඇත. ඒ අනුව, ගොවීන් කෙතරම් කාලයක සිට මෙම වැඩසටහන් නරඹන්නේ ද යන්න අධ්‍යයනයේ දී විමසීමට ලක් කරන ලදී. 5.2 සංඛ්‍යා සටහනේ දී එය පැහැදිලි කෙරේ.

වගු අංක 5.2: කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට පුරුදුව සිටින කාල වකවානුව

| කාලය | ගොවිබිමට අරුණළු | | මිහිකත දිනුවෝ | | සැඟවුණු කඟවනු | | රිවිදින අරුණැල්ල | | සමස්ත එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| වසරක පමණ සිට | 05 | 6.0% | 04 | 6.0% | 03 | 7.0% | 05 | 10.0% | 17 | 7.0% |
| වසර 2 ක පමණ සිට | 24 | 29.0% | 20 | 32.0% | 18 | 40.0% | 12 | 24.0% | 74 | 30.0% |
| වසර 3 ක පමණ සිට | 30 | 36.0% | 22 | 35.0% | 12 | 27.0% | 15 | 29.0% | 79 | 33.0% |
| වසර 3 ට වැඩි | 23 | 28.0% | 15 | 24.0% | 11 | 24.0% | 16 | 31.0% | 65 | 28.0% |
| නිශ්චිතව කිව නොහැක | 01 | 1.0% | 02 | 3.0% | 01 | 2.04% | 03 | 6.0% | 07 | 2.0% |
| එකතුව | 83 | 100.0 | 63 | 100.0 | 45 | 100.0 | 51 | 100.0 | 242 | 100.0 |

මූලාශ්‍රය ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

5.2 වගු සටහන අනුව, කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් එම වැඩසටහන් සියල්ල වසර 2 ට වැඩි කාලයක සිට නැරඹීමට පුරුදුව සිටින බව පෙනී යයි. සෑම වැඩසටහනක් ම වසර 3ක පමණ සිට නැරඹීමට පුරුදුව සිටින පිරිස 33%ක් වන අතර වසර 30 වඩා වැඩි කාලයක සිට නරඹන ගොවීන් ද 28%කි. මේ සම්බන්ධයෙන් නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී අනාවරණය වූයේ, පසුගිය වසර 3-4ක (2008,2010) කාලය තුළ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ඇති කළ ආහාර ප්‍රවර්ධන වැඩසටහන් වූ "අපි වවමු – රට නගමු" වැනි වැඩසටහන් හා සමගාමීව කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමට ගොවීන්ගේ වැඩි නැඹුරුවක් ඇති වූ බවත් එම තත්වය එයට හේතු වී ඇති බවත් ය.

## 5.4 කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර

ජාතික රූපවාහිනිය හරහා විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ එම එක් එක් වැඩසටහන නරඹන ගොවීන්ගෙන් කරන ලද විමසීමේ දී ඔවුන් ඊට දැක් වූ ප්‍රතිචාර තුළින් කෘෂිකාර්මික වැඩසටහන් විකාශය විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත පැහැදිලි විය. පෙර පරිච්ඡේදයන් හි පරිදි ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය යටතේ විකාශනය වන වැඩසටහන් දෙකට අමතරව විවිදින අරුණැල්ල සහ සැගවුණු කහවනු පිළිබඳව ද ගොවීන්ගේ ප්‍රතිචාරයන් විමසන ලදී.

කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය, එනම් එක් එක් වැඩසටහන හරහා ඉදිරිපත් කරන තොරතුරුවල කාලීනභාවය, වැඩසටහන් ඉදිරිපත් කිරීමට භාවිතා කරන භාෂා ශෛලිය, වැඩසටහන් විකාශය වන කාල පරාසය, ඉදිරිපත් කිරීමේ විලාසය හා ඉදිරිපත් කරන්නාගේ විලාසය, මෙම සියලු කරුණු ගොවීන්ට වඩාත් අදාළවීම තුළින් එම වැඩසටහන් හි ඵලදායකත්වය තීරණය වේ.

ඒ අනුව, කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ එක් එක් වැඩසටහන නරඹන්නා වූ ගොවීන් දැක් වූ ප්‍රතිචාර වෙන් වෙන් වශයෙන් පහත සංඛ්‍යා සටහන් මඟින් විස්තර කෙරේ.

### 5.4.1 ගොවිබිමට අරුණළු වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර

ගොවිබිමට අරුණළු කෘෂිකාර්මික වැඩසටහන ඉරිදා උදෑසන 6.25 සිට විනාඩි 15ක් තුළ කෘෂිකර්මාන්තයට අදාළ නව තාක්ෂණික දැනුම, කාලීනව වැදගත් වන කෘෂිකාර්මික තොරතුරු හා කෘෂිකාර්මික පර්යේෂණ තොරතුරු පිළිබඳ ව ගොවීන්ට දැනුම ලබාදීම සිදු කරයි. මෙම වැඩසටහන සෘජුව ම "ගොවි සහන සරණ" සේවය සමඟ සම්බන්ධතා පවත්වන බැවින් වඩාත් කාලීන තොරතුරු හා දැනුම ගොවියා වෙත ලබා දීම සිදු කෙරේ. විශේෂයෙන් මෙහි දී සඳහන් කළ යුතු කරුණක් වන්නේ, සෑම මසක් පුරාවට "ගොවි සහන සරණ සේවය" වෙත ලැබෙන කෘෂිකාර්මික ගැටලු පිළිබඳ සලකා බලා ගොවීන්ට වඩාත් ගැටලු සහගත වූ ක්ෂේත්‍රයන් තීරණය කර ඒ ආශ්‍රිතව තොරතුරු හා දැනුම ලබාදීමට වැඩසටහන් නිෂ්පාදනය කිරීම සිදු කිරීමයි. ඒ අනුව "ගොවි බිමට අරුණළු" හරහා වඩාත් කාලීන වූත්, ගොවීන්ට වඩාත් අත්‍යාවශ්‍යවන්නා වූත් දැනුම හා තොරතුරු ලැබෙන බව නිලධාරීන් විසින්

සඳහන් කරන ලදී. අධ්‍යයනයේ දී "ගොවි බිමට අරුණළු" නරඹන ගොවීන් එහි අන්තර්ගතය පිළිබඳ දැක් වූ ප්‍රතිචාර 5.3 සංඛ්‍යා සටහනෙන් පිළිබිඹු වේ.

වගු අංක 5.3: ගොවිබිමට අරුණළු වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර

| කැමැත්ත | කාලය n= 83 | | භාෂා ශෛලිය n= 83 | | ඉදිරිපත් කිරීමේ විලාසය n= 83 | | ඉදිරිපත් කරන්නාගේ විලාසය n= 83 | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| සුදුසුයි | 20 | 24% | 82 | 99% | 81 | 98% | 82 | 99% |
| වෙනස් කළ යුතුයි | 63 | 76% | 01 | 1.0% | 02 | 2% | 01 | 1.0% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

වැඩසටහන් හි එක් එක් අංගය වෙන වෙනම විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ වැඩසටහන් විකාශය වන කාලය වෙනයකට ලක් කළ යුතු බවයි. අනෙකුත් අංගවලට සාපේක්ෂව කාලය වෙනස් කළ යුතු බවට ගොවීන් 76%ක් සඳහන් කර ඇත. කාල පරාසය තවදුරටත් වැඩි කර එය ගොවියාට නැරඹිය හැකි පරිදි සුදුසු වේලාවක විකාශය කළ යුතු බව ගොවීන්ගේ අදහස විය. එනම් විනාඩි 15ක කාලය ප්‍රමාණවත් නොවන බවත් එසේ ම උදෑසන 6.15 යන වේලාව දෛනික රාජකාරී සමඟ ගැටෙන බවත් ගොවීහු සඳහන් කළ හ. අනෙකුත් අංග වූ ඉදිරිපත් කිරීමේ විලාසය, භාවිත භාෂාවත්, ඉදිරිපත් කරන්නාගේ විලාසයත් සුදුසු බව 80%ට වැඩි පිරිසක් සඳහන් කර ඇත.

### 5.4.2 "මිහිකත දිනුවෝ" වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර

සතිපතා සිකුරාදා යවස 6.45 සිට විනාඩි 15ක් තුළ සාර්ථක ගොවියෙකු හෝ ගොවි පවුලක් පාදක කොට ගනිමින් කෘෂි අංශය හරහා ඔහු/ඔවුන් සාර්ථක වූ ආකාරය රටට හඳුන්වා දී ඒ හරහා ගොවීන් තුළ කෘෂිකර්මාන්තය කෙරෙහි ඇල්මක්, පෙළඹුමක් ඇති කරනු ලබයි. මිහිකත දිනුවෝ වැඩසටහනෙ හි භාෂා ශෛලිය, කාල පරාසය, ඉදිරිපත් කිරීමේ විලාසය හා ඉදිරිපත් කරන්නාගේ විලාසය සුදුසු ද වෙනස් කළ යුතු ද යන්න පිළිබඳ එම වැඩසටහන් නරඹන ගොවීන් දැක් වූ ප්‍රතිචාර 5.4 සංඛ්‍යා සටහනින් පැහැදිලි කෙරේ.

වගු අංක 5.4: "මිහිකත දිනුවෝ" වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර

| කැමැත්ත | කාලය n= 63 | | භාෂා ශෛලිය n= 63 | | ඉදිරිපත් කිරීමේ විලාසය n= 63 | | ඉදිරිපත් කරන්නාගේ විලාසය n= 63 | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| සුදුසුයි | 10 | 16% | 62 | 98% | 63 | 100% | 63 | 100% |
| වෙනස් කළ යුතුයි | 53 | 84% | 01 | 02% | 0 | 0.0 | 0 | 0.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

"මිහිකත දිනුවෝ" වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව එම වැඩසටහන් නරඹන ගොවීන්ගේ කැමැත්ත විමසීමේ දී භාෂා ශෛලිය, ඉදිරිපත් කරන ආකාරය හා ඉදිරිපත් කරන්නාගේ විලාසය සුදුසු බවට ඉහළ ප්‍රතිචාර ලැබී ඇත. එසේ වුව මෙම වැඩසටහනෙ හි ද විකාශන කාලය සුදුසු නොවන බවට 84%ක් ප්‍රතිචාර දක්වා තිබීමෙන් පෙනී යන්නේ වැඩසටහන විකාශය වන ප.ව. 6.45-7.00 අතර කාලය ද උචිත නොවන බවයි. ගොවීන් සඳහන් කළ අන්දමට මෙම කාල පරාසය ද නිවෙස්වල ඉතාමත් කාර්ය බහුල වේලාවක් බව සඳහන් විය. දෛනික රාජකාරී අවසන් කර එක් තැනකට වී සිටීමට මෙම වේලාව ද නුසුදුසු බව ගොවීන්ගේ හැඟීමයි. ප්‍රායෝගිකව එහි සත්‍යතාවයක් පවතින බව පෙනී යන්නේ, විශේෂයෙන් ඕනෑම නිවෙසක වඩාත් කාර්ය බහුල වේලාවක් ලෙස මෙම වේලාව හඳුනාගත හැකි බව නිවෙස්වල මිනිසුන්ගේ කාර්යයන් සිදු කරන ආකාරය විමසා බැලීමේ දී පෙනී යන බැවිනි.

### 5.4.3 "රිවිදින අරුණැල්ල" වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර

මෙම වැඩසටහන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය නොමැති වුවත් ජාතික නාලිකාව හරහා විකාශය වන බැවින් ගොවීන්ගේ ප්‍රතිචාර විමසන ලදී. මෙය ඉරිදා උදෑසන 7.20 – 8.00 දක්වා අතර කාලය තුළ විකාශය වේ.

මෙය ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව එය නරඹන(51) ගොවීන්ගේ ප්‍රතිචාර විමසීමේ දී පෙනී ගියේ මෙම වැඩසටහන විකාශය වන කාලය හා කාල පරාසය ද වෙනස් කළ යුතු බවයි. ඒ සඳහා 69%ක් ප්‍රතිචාර දක්වා තිබිණි. භාෂා ශෛලිය, ඉදිරිපත් කරන විලාසය හා ඉදිරිපත් කරන්නාගේ විලාසය සුදුසු බවට 80%ක් ම ප්‍රතිචාර දක්වා ඇත.

### 5.4.4 "සැඟවුණු කහවනු" වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවි ප්‍රතිචාර

"සැඟවුණු කහවනු" අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත, අපනයන කෘෂිකාර්මික බෝග වගා කරන ගොවීන් ඉලක්ක කොට ගනිමින් සිකුරාදා සවස 6.00-6.15 දක්වා විකාශය වේ. අධ්‍යයන ප්‍රදේශ තුළ කුලියාපිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයත් අලව්ව,පොතුහැර වැනි තෙත් කලාපයට අයත් ගොවිජන සේවා බල ප්‍රදේශයන් හි ත් අපනයනය සඳහා බුලත් හා ගම්මිරිස් වගාව බහුල ලෙස පැවති අතර එම ප්‍රදේශයන් හි ගොවීන් විසින් මෙම වැඩසටහන සඳහා වැඩි ප්‍රතිචාර දක්වන ලදී. මෙම වැඩසටහන කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 45 දෙනෙකු නරඹන අතර වැඩසටහන ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව එම ගොවීන් දැක් වූ ප්‍රතිචාරවලට අනුව පෙනී ගියේ මෙම වැඩසටහනෙ හි ද විකාශන කාලය වෙනස් කළ යුතු බවයි. මෙහි විකාශන කාලය වෙනස් කළ යුතු බවට 71%ක් ප්‍රතිචාර දක්වා තිබිණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත විකාශය වන වැඩසටහන් දෙකත් අනෙකුත් වැඩසටහන් දෙකත් පිළිබඳව ගොවීන් දක්වා ඇති ප්‍රතිචාරයන් පොදුවේ විමසුමට ලක් කිරීමේ දී පෙනී ගියේ, මෙම සියලු වැඩසටහන්වල විකාශය වන කාලය හා කාල පරාසය පිළිබඳ ගොවීන්ගේ යහපත් ප්‍රතිචාර නොමැති බවයි. ගොවීන්ගෙන් බහුතරයකගේ ප්‍රතිචාරය වූයේ, ජාතික රූපවාහිනී නාලිකාව හරහා දැනට විකාශය

වන කෘෂිකාර්මික වැඩසටහන්වල විකාශන කාලය දෛනික ජීවිතයේ කාර්යයන් හා සැසඳීමේ දී උචිත කාල පරාසයක් නොවන බවයි. වැඩසටහන් හරහා ලබා දෙන දැනුම හා තොරතුරු වඩාත් කාලීනභාවයෙන් යුක්ත බවත් නරඹන්නාට එය ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කරනු ලබන බවත් ගොවි ප්‍රතිචාර අනුව පැහැදිලි වන නමුත් ඒ සඳහා දැනට වෙන් කර ඇති කාලය සුදුසු නොවන බැවින් වැඩසටහන් හි ඵලදායකත්වයට එය සෘජුව ම බලපාන බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

## 5.5 කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ප්‍රයෝජනවත්භාවයෙ හි ස්වභාවය


අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් කිසිවෙකු රූපවාහිනී කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමෙන් ප්‍රයෝජනයක් නැතැයි යනුවෙන් ප්‍රතිචාර දක්වා නොමැත. ප්‍රයෝජනවත්භාවය පිළිබඳ කළ විමසුමේ දී පෙනී ගියේ, වැඩසටහන් නැරඹීමෙන් ලද දැනුම ප්‍රයෝජනවත් වූ හා වඩාත් ප්‍රයෝජනවත් වී ඇති බවකි. මේ පිළිබඳ වගු අංක 5.5 සහ ප්‍රස්තාර අංක 5.2 න් ඉදිරිපත් කෙරේ.

**වගු අංක 5.5: ප්‍රයෝජනවත් භාවයෙ හි ස්වභාවය පිළිබඳ ප්‍රතිචාර**

| ප්‍රයෝජනවත් භාවය | ගොවි බිමට අරුණළු | | මිහිකත දිනුවෝ | | සැඟවුණු කතවනු | | රිවිදින අරුනැල්ල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| වඩා ප්‍රයෝජනවත් | 30 | 36% | 18 | 29% | 13 | 29% | 24 | 47% | 85 | 35% |
| ප්‍රයෝජනවත් | 53 | 64% | 45 | 71% | 32 | 71% | 27 | 53% | 157 | 65% |
| එකතුව | 83 | 100.0 | 63 | 100.0 | 45 | 100.0 | 51 | 100.0 | 242 | 100.0 |

මූලාශ්‍රය ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

**ප්‍රස්තාර අංක 5.2 : ප්‍රයෝජනවත් භාවයෙහි ස්වභාවය පිළිබඳ ප්‍රතිචාර**




මූලාශ්‍රය ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

ප්‍රයෝජනවත් භාවය පිළිබඳ දත්ත රැස් කිරීමේ දී අරමුණු කොටගත් වැඩසටහන් දෙකට අමතරව අනෙකුත් කෘෂිකාර්මික වැඩසටහන් දෙක පිළිබඳව ද තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව, ගොවීන්ගේ ප්‍රතිචාර විමසීමේ දී ඔවුන් විසින් නරඹන ලද කෘෂිකාර්මික වැඩසටහන් සියල්ලෙන් ම ලබා ගත් දැනුම ප්‍රයෝජනවත් බවට ඉහළ ම ප්‍රතිචාර ලැබී ඇත. එය සමස්ත ගොවීන්ගෙන් 65%කි. එක් එක් වැඩසටහන් පිළිබඳව සැලකීමේ දී වඩාත් ප්‍රයෝජනවත් වූ බවට සාපේක්ෂව ඉහළ ප්‍රතිචාර රිවිදින අරුණෑල්ල ලබා ඇති නමුත් එය නරඹන සංඛ්‍යාව ගොවිබිමට අරුණළු වැඩසටහන නරඹන සංඛ්‍යාවට වඩා අඩුය. ගොවි බිමට අරුණළු නරඹන සංඛ්‍යාවෙන් 36%ක් එය වඩාත් ප්‍රයෝජනවත් වූ බව සඳහන් කර ඇත.

## 5.6 කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමෙන් ලැබූ ප්‍රයෝජන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත ජාතික රූපවාහිනී නාලිකාව හරහා විකාශය වන කෘෂි කාර්මික වැඩසටහන් මෙන් ම ඊට අමතරව විකාශනය වන කෘෂි වැඩසටහන් ද ගොවීන්ට වඩාත් ප්‍රයෝජනවත් වී ඇති බව ඉහත දී පැහැදිළි විය. ඒ අනුව, ගොවීන් වැඩසටහන් නරඹා ලබාගත් දැනුම පිළිබඳ කරන ලද විමසීමේ දී ගොවීහු ලබාදුන් ප්‍රතිචාර පහත පරිදි වේ.

වගු අංක 5.6: වැඩසටහන් නැරඹීමෙන් ලැබූ ප්‍රයෝජන

| ප්‍රයෝජන | ප්‍රතිචාර සංඛ්‍යාව n= 242 | |
|---|---|---|
| | සංඛ්‍යාව | % |
| විවිධ වගා ක්‍රම පිළිබඳ දැනුවත්වීම | 212 | 88% |
| කාබනික පොහොර නිෂ්පාදනය හා යෙදීම පිළිබඳ දැනුවත් වීම | 181 | 75% |
| පළිබෝධ පාලනය හා පොහොර යෙදීම පිළිබඳ දැනුවත් වීම | 167 | 69% |
| නව බීජ ප්‍රභේද භාවිතය පිළිබඳ දැනුවත් වීම | 93 | 38% |
| ජල කළමනාකරණය පිළිබඳ දැනුම ලැබීම | 60 | 25% |
| මිල තොරතුරු හා අලෙවි මාර්ග පිළිබඳ දැනුම හා තොරතුරු ලැබීම | 52 | 21% |
| ගොවිපොළ උපකරණ භාවිතය පිළිබඳ දැනුවත්වීම | 40 | 17% |
| මල් වගාව හා විසිතුරු පත්‍ර වගාව පිළිබඳ දැනුම ලැබීම | 33 | 14% |
| සත්ත්ව පාලනය හා ඒ ආශ්‍රිත ස්වයං රැකියාවන් හි යෙදීම පිළිබඳ දැනුම ලැබීම | 20 | 8% |
| මී මැසි පාලනය පිළිබඳ දැනුම ලැබීම | 12 | 5% |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

* ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාවට අනුව ප්‍රතිශතය ගණනය කර ඇති බැවින් ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.

අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කළ කුරුණෑගල දිස්ත්‍රික්කය විවිධ දේශගුණික කලාපයන්ගෙන් යුක්ත වන බැවින් විවිධ බෝග වගා කරන ගොවීන් අධ්‍යයන නියැදිය තුළ නියෝජනය විය. ඒ අනුව, ඉහත සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි විවිධ බෝග වගා කිරීමේ දී අවශ්‍ය වන දැනුම ගොවීන් කෘෂි වැඩසටහන් හරහා ලබා ගෙන ඇති ආකාරය විවිධ බව පෙනී යයි. ඒ අනුව වී වගාව, එළවළු හා පලතුරු වගාවන්, මිරිස්, ධාන්‍ය, ලොකු ළූණු, අල බෝග සහ බිම්මල් වගාවන් සඳහා අවශ්‍ය වන්නා වූ ජල සම්පාදන ක්‍රම, පොහොර භාවිතය හා කොම්පෝස්ට් නිෂ්පාදනය, රෝග හා පළිබෝධ පාලනය හා පළිබෝධනාශක යෙදීම එසේම ගොවිපොළ යන්ත්‍ර සූත්‍ර භාවිතය පිළිබඳ දැනුම හා සත්ත්ව පාලනය මෙන් ම ඒ ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීම වැනි ක්ෂේත්‍රයන්ට අදාළව ද දැනුම රැස් කරගෙන ඇති බව අනාවරණය විය.

ප්‍රතිචාර දැක් වූ ගොවීන්ගේ ඉහළ ම ප්‍රතිචාරය ලැබී ඇත්තේ (88%) බෝග වගා කිරීමේ දී විවිධ වූ වගා ක්‍රමයන් අත්හදා බැලීම සඳහා මෙම වැඩසටහන් හරහා දැනුවත් වූ බවයි. විශේෂයෙන්, අධ්‍යයන ප්‍රදේශයේ දොඩන්ගස්ලන්ද, මහව ගොවිජන සේවා බල ප්‍රදේශයේ යද්දිගම කෘ.ප.නි.ස. වසම වැනි ප්‍රදේශයන් හි ගොවීන් සඳහන් කළ පරිදි වී වගාව සම්බන්ධ වූ "පැරශූට් වගා ක්‍රමය" වැනි නව වගා ක්‍රමයන් පිළිබඳ "ගොවි බිමට අරුණළු" වැඩසටහන හා "රිවිදින අරුණැල්ල" හරහා දැනුත් වූ බවයි. මෙයට අමතරව කෙසෙල් වගාව, අන්නාසි වගාව, ආශ්‍රිතව පැළ බද්ධ කිරීම, කෙසෙල් අලයෙන් වැඩි පැළ ප්‍රමාණයක් ලබා ගැනීම, කෙසෙල් වගාව සඳහා වන ත්‍රිකෝණාකාර ක්‍රමය වැනි වගා ක්‍රම ගැනත්, අන්නාසි සඳහා වසුන් යොදන ආකාරය පිළිබඳවත් ගොවීන් මෙම වැසටහන් හරහා දැනුවත් වී ඇත. එළවළු වගාවේ දී විශේෂයෙන් "මැසි භෝග" වගාවට පඬුවස්නුවර ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවීන් බෝංචි මැයි ක්‍රමය සඳහා දැනුම මෙම වැඩසටහන් හරහා ලබා ගෙන ඇත. මඤ්ඤොක්කා, බතල, කිරි අල වැනි අල බෝග වගා ක්‍රමයන් පිළිබඳවත් අධ්‍යයන ප්‍රදේශය තුළ ගොවීන් දැනුම ලබාගෙන ඒවා අත්හදා බලා ඇත. එසේ ම, මැල්සිරිපුර ගොවිජන සේවා බල ප්‍රදේශයේ තෙල්ලිය කෘ.ප.නි.ස. වසම තුළ ඉගුරු වගාවට යොමු වූ ගොවීන් වැඩසටහන් හරහා දැනුම ලබාගෙන ඇත. ඊට අමතරව, මහව ගොවිජන සේවා බල ප්‍රදේශයේ පවතින වල් අලි උවදුරින් පීඩා විඳින බොහෝ ගොවියන් වී වගාවට අමතරව වෙනත් නව වගා සඳහා යොමු වී ඇති බව පෙනුණි. පැඟිරි හා ළූණු වගාව යද්දිගම කෘ.ප.නි.ස. වසම තුළ සිදු කෙරේ. මේ සඳහා අවශ්‍ය දැනුම මෙම වැඩසටහන් හරහා ලබාගෙන ඇත.

ගොවීන් 75%ක් පමණ කාබනික පොහොර නිෂ්පාදනය හා යෙදීම පිළිබඳ දැනුම ලබාගත් බවට ප්‍රතිචාර දක්වා ඇත. කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ විවිධ ක්‍රමවේදයන් මෙම වැඩසටහන් හරහා ප්‍රායෝගිකව සිදු කර පෙන්වා දීමෙන් ගොවීන්ට දැනුම ලබාදුන් බව මෙහි දී සඳහන් විය. කාබනික පොහොර වගාවන් සඳහා යොදන ආකාරය පිළිබඳවත් ඔවුහු දැනුවත් වී සිටියහ. ජපන් තාක්ෂණයට අනුව කොම්පෝස්ට් නිෂ්පාදනය, වර්මි කොම්පෝස්ට් නිෂ්පාදනය, හා ගැඩිවිලි දියර පොහොර නිෂ්පාදනය වැනි ක්ෂේත්‍ර ගණනාවක දැනුවත්වීම් ගොවීන් ලබා ඇති බව පැහැදිළි විය.

වගාවන් සඳහා වැළඳෙන පළිබෝධ හා රෝග පාලනය පිළිබඳ නිරන්තරයෙන් වැඩසටහන් හරහා දැනුවත් කිරීම ගොවීන්ට ප්‍රයෝජනවත් වූ බවට 69%ක් ප්‍රතිචාර දැක්වූහ. බෝග සඳහා කාලීනව පැතිරී යන විවිධ රෝග සඳහා විශේෂ දැනුවත් කිරීම් "ගොවි බිමට අරුණළු" හා "රිවිදින අරුනැල්ල" හරහා විකාශනය වන බව ගොවීහු සඳහන් කළහ. ගොයම් සඳහා බෝ වන "පැළ මැක්කා", "වෙල් මීයන්" මර්දනය සඳහා ක්‍රමවේදයන් පිළිබඳ දැනුම ලැබීම හරහා තම ගොයම ආරක්ෂා කරගත් බව ඒ ගොවීහු සඳහන් කළහ. එසේ ම එළවළු වගාවේ ඒකාබද්ධ පළිබෝධ පාලනය, සැල්වීනියා පරපෝෂිත උවදුර මර්දනය කර ගැනීම වැනි දැනුම වැඩසටහන් හරහා ලැබී තිබේ.

එසේ ම නිර්දේශිත නව බීජ ප්‍රභේද හඳුනා ගැනීම හා භාවිතා කිරීම සඳහා දැනුම ලැබුණු බව 38%ක් ප්‍රතිචාර දක්වා ඇත.

ජල කළමනාකරණයේ දී ජල සම්පාදන ක්‍රම පිළිබඳව ද දැනුවත් වූ බව 25% ප්‍රතිචාර දක්වා ඇත. "බිංදු ජල සම්පාදනය", "ජල බෙත්ම කළමනාකරණය" වැනි ක්ෂේත්‍ර පිළිබඳ ගොවීන් දැනුවත් වී එම දැනුම ප්‍රයෝජනයට රැගෙන ඇති බව අධ්‍යයනයේ දී පැහැදිළි විය.

"මිහිකත දිනුවෝ" වැනි වැඩසටහන් හරහා නිෂ්පාදන අලෙවි මාර්ග පිළිබඳවත්, මිල තොරතුරු පිළිබඳවත්, ගොවීන් දැනුවත් වූ බව සඳහන් විය. මේ සඳහා 21%ක් ප්‍රතිචාර දක්වා තිබුණි.

විශේෂයෙන්, ගොවිපොළ උපකරණ භාවිතා කරන ආකාරය පිළිබඳව ද වැඩසටහන් හරහා දැනුවත් කිරීම් සිදු කර ඇත. බහු කාර්ය වී අස්වනු නෙළනය, ගොඩ බෝග සඳහා වූ උපකරණය, දියර ඉසින යන්ත්‍ර පිළිබඳව දැනුම ලබාගත් බව 17%ක් ප්‍රතිචාර දැක්වූහ.

මල් වගාව පිළිබඳ දැනුම ලැබුණු බව 14%ක් ප්‍රතිචාර දැක් වූ අතර, සත්ත්ව පාලනයත්, ඒ ආශ්‍රිත ස්වයං රැකියා හා වෙනත් අංශයන්ට අදාළ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පෙළඹවීමක් ඇති කිරීමටත්, ඒ සඳහා කැමැත්තක් ඇති කිරීමටත් කෘෂිකාර්මික වැඩසටහන් මූලික වූ බව 8%ක් ප්‍රතිචාර දැක්වූහ.

මල් වගාවේ දී ඇන්තූරියම් සහ ඕකිඩ් වගා කිරීමට නිවෙස්වල කාන්තාවෝ පෙළඹී සිටිති. ස්වයං රැකියා ලෙස කිරි ගව පාලනය, යුරතල් මසුන් ඇති කිරීම, ධාන්‍ය වර්ග පැකට් කර අලෙවි කිරීම, මුදවන ලද කිරි හට්ටි අලෙවිය, බිම්මල් වගා කර විකිණීම සඳහා ගොවීන් පෙළඹී ඇති බව අනාවරණය විය.

මී මැසි පාලනය සඳහා ද දැනුම ලබා ගත් බව 5%ක් ප්‍රතිචාර දක්වා තිබුණි.

**මෙසේ ලබාගත් දැනුම නිසා ගොවීන්ගේ ආදායමට යම් බලපෑමක් සිදු වී ඇත් ද යන්න අධ්‍යයනයේ දී විමසා බැලිණි. එහි දී බහුතරයක් (82%) එය තම ආදායම් තත්ත්වයට බලපෑමක් කළ බවට ප්‍රතිචාර දැක් වූ අතර අනෙක් පිරිස (18%) සඳහන් කළේ, එය නිශ්චිතවම සඳහන් කළ නො හැකි බවයි. ආදායමට බලපෑමක් සිදු කළේ කෙසේ ද යන්න විමසීමේ දී ගොවීන් සඳහන් කළේ, බොහෝ විට ගොවීන්**

ගෙවත්තේ යම් වගාවක් සිදු කළ විට එය නව වගා ක්‍රම යටතේ කොම්පෝස්ට් පොහොර යෙදීම මගින් හොඳ අස්වැන්නක් ලබා ගැනීම හරහා අවම වශයෙන් පරිභෝජනයට අමතරව වැඩි කොටසක් පවතී නම් එය විකුණා ආදායමක් ලබන බවයි. මෙය තම ආදායමට නො දැනුවත් ව හෝ ධනාත්මක තත්ත්වයක් ලබා දෙන බව ගොවීන්ගේ අදහස විය. එසේ ම, විශේෂයෙන් අන්නාසි, කෙසෙල්, දොඩම්, පැෂන් ෆෲට් වැනි පලතුරු වගාවන් සහ අල බෝග වගාවන් මෙන් ම බුලත්, ඉඟුරු වැනි වගාවන්ගෙන් එලදායී මට්ටමේ අස්වැන්නක් ලබා ගැනීමට මෙම දැනුම උපයෝගී වන බවත්, එයින් තම ආදායම් අවාසි සහගත තත්ත්වයෙන් මුදා ගැනීමටත් හැකි වූ බව ගොවීන් සඳහන් කරන ලදී. මෙම ආදායම් වර්ධනය මහා පරිමාණ නො වුවත්, යම් කිසි වාසිදායක මට්ටමක් වෙත ළඟාවීමට වැඩසටහන් නො බලන ගොවීන්ට වඩා වැඩසටහන් නරඹා දැනුම ලබාගත් ගොවීන්ට හැකි වී ඇති බව මෙතුළින් පැහැදිළි විය.

## 5.7 කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී ගොවීන්ට පවතින බාධාවන්

කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමෙන් ලැබූ ප්‍රයෝජන පිළිබඳ ගොවි ප්‍රතිචාර විමසා බැලීමට අමතරව, ඔවුන් එම වැඩසටහන් නැරඹීමේ දී යම් බාධාවකට මුහුණ දෙන්නේ ද යන්න අධ්‍යයනයේ දී සොයා බලන ලදී.

ගොවිජන සමාජය යනු විවිධාකාර ක්‍රියාකාරකම් රාශියක් හා බැඳී පවතින ජීවිත ගත කරන සාමාජිකයන්ගෙන් යුත් සමාජයීය කේන්ද්‍රයකි. එහි විධිමත් වේලාවන් සහ වැඩ කොටස් නැත. ගොවිජන සමාජයක ජනයාට එක් දිනක නිදහස් වේලාව තවත් දිනක නිදහස් වේලාව නොවේ. එම නිසා නිදහසේ වැඩකටයුතු කළ හැකි වේලාවන් ලෙස කාලපරාස වෙන් කර දැක්වීම අපහසු කාර්යයකි. රූපවාහිනී යන්ත්‍රයක වැඩසටහනක් නරඹමින් සිටින අවස්ථාවක දී පවා අවශ්‍ය කටයුත්තක් සඳහා බලමින් සිටි වැඩසටහන අතරමග නවතා දමා යාමට සිදුවන අවස්ථා ද පවතී. එසේ ම, විවිධ පෞද්ගලික හා බාහිර ගැටලුවලට මුහුණ පෑමට සිදුවන නිසා වැඩසටහන් නැරඹීමට බාධා පැමිණේ.

ඒ අනුව රූපවාහිනී වැඩසටහන් නැරඹීමේ දී ද විවිධාකාර බාධාවලට මුහුණ දීමට සිදු වේ. හේතුව මෙම විෂය ක්ෂේත්‍රය සංගීත වැඩසටහනක්, නාට්‍යයක් හෝ ගායන හෝ රඟපෑමේ තරඟයක් නොව කෘෂිකර්මය හා සම්බන්ධ වුවක් බැවිණි. මෙහි දී ගොවි පවුල් පිළිබඳව සාකච්ඡා කළ ද පවුලේ රූපවාහිනී වැඩසටහන් නැරඹීමේ රුචි අරුචිකම් විවිධ වීමට ඉඩ ඇත. කුඩා දරුවන් නැරඹීමට අපේක්ෂා කරන අංග, තරුණ වියේ දරුවන් නැරඹීමට අපේක්ෂා කරන අංග, කාන්තාවන් නැරඹීමට අපේක්ෂා කරන අංග, වයස්ගත වැඩිහිටියන් නැරඹීමට අපේක්ෂා කරන අංග වශයෙන් ඒවා විවිධාකාර ය. එය රුචි අරුචිකම මත තීරණය වන්නකි.


රූපවාහිනී වැඩසටහන් නැරඹීමට යාමේ දී ඉහත සඳහන් රුචි අරුචිකම් සහ තවත් වෙනත් සාධකවල බලපෑම මත යම් වැඩසටහනක් නැරඹීමේ දී බාධා පැමිණීමට පුළුවන. වගු අංක 5.7න් පැහැදිලි වන ආකාරයට කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් හට බාධාවන්ට මුහුණදීමට සිදු වන බව පෙනේ.

**වගු අංක 5.7: කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී බාධකයන්ට මුහුණ දීමේ තත්ත්වය**

| තත්ත්වය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| බාධකයන්ට මුහුණදීමට සිදු වේ | 178 | 74% |
| බාධකයන්ට මුහුණදීමට සිදු නොවේ | 64 | 26% |
| එකතුව | 242 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

**ප්‍රස්තාර අංක 5.3: වැඩසටහන් නැරඹීමේ දී බාධාවන්ට මුහුණදීමේ තත්ත්වය**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

ඉහත සංඛ්‍යා සටහන හා ප්‍රස්තාරයට අනුව කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී කිසිදු බාධාවක් නැති බව 26%ක් සඳහන් කර ඇත. අධ්‍යයනට ලක් වූ ගොවීන් අතර රජයේ රැකියා කර විශ්‍රාම ගෙන අනතුරුව නිදහසේ තම කාලයෙන් ප්‍රයෝජනයක් ගැනීම සඳහා ගොවිතැනෙහි නියැළී සිටින පුද්ගලයින් බොහෝමයකට දෛනික කාර්ය බහුල බවක් නොමැති වීමෙන් ඔවුහු කෘෂිකාර්මික වැඩසටහන් බාධාවකින් තොරව නරඹනු ලබන බව පෙනුණි. ඔවුන්ට බොහෝ විට කාලය පිළිබඳව හෝ වෙනයම් වූ පෞද්ගලික ගැටලුවක් නොමැති බැවින් කිසිදු බාධාවක් නැති බව ඔවුන්ගේ ප්‍රතිචාරය විය. එසේ ම, බොහෝ විට නිවසේ හුදකලාව සිටින පුද්ගලයින් එනම්, දූ දරුවන්ගෙන් වෙන් ව ජීවත් වන පවුල් ද මෙම කාණ්ඩයට අයත් වන බව පෙනී ගියේ ය. සංඛ්‍යා සටහන් අංක 5.7 සහ ප්‍රස්තාර සටහන් අංක 5.3න් දැක්වෙන පරිදි කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 74%ක් ප්‍රකාශ කර ඇත්තේ කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී යම් යම් බාධකවලට මුහුණපාන බවයි. එලෙස ඔවුන් මුහුණ දෙන බාධාවන් වගු අංක 5.8න් විස්තර කෙරේ.



පුස්තකාලය
LIBRARY
හෙ.ගො.ගො.ප.පු.ආ
HARTI

වගු අංක 5.8: කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී ගොවීන් මුහුණ දෙන බාධාවන්

| හඳුනාගත් බාධක | ගොවීන් සංඛ්‍යාව n= 178 | |
|---|---|---|
| | ප්‍රතිචාර සංඛ්‍යාව | % |
| විකාශන වේලාවේ නිවසේ කාර්ය බහුලභාවය වැඩිවීම | 171 | 96% |
| දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවලට බාධාවීම | 162 | 91% |
| වෙළෙඳ දැන්වීම් වැඩි ලෙස ප්‍රචාරය වීම | 132 | 74% |
| ගෘහස්ථ සාමාජිකයින්ගේ රුචි අරුචිකම් | 96 | 53% |
| විදුලිය ඇණ හිටීම | 16 | 9% |

* ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාවට අනුව ප්‍රතිශතය ගණනය කර ඇති බැවින් ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

ඉහත සංඛ්‍යා සටහනට අනුව, ගොවීන්ගෙන් වැඩි ම ප්‍රමාණයක්(96%) ප්‍රතිචාර දැක්වූයේ විකාශන වේලාවේ නිවසේ කාර්ය බහුලභාවය වැඩි බව සඳහන් කරමිනි. එනම්, උදෑසන 6-7 අතර කාලයත් සවස 6-7 අතර කාලයත් ගෘහනියන්ට නිවසේ රාජකාරී පැවතීමත්, ගොවීන්ට වෙනත් බාහිර වැඩකටයුතු, හා තම පෞද්ගලික වැඩකටයුතු ආදී සියල්ල සිදු කර නිම කෙරෙන වේලාවන් මේ අතරතුර කාලය වීමත්, එබැවින් මෙම කාලසීමාව තුළ රූපවාහිනිය ඉදිරිපිට වාඩි වී සිටීමට ඔවුන්ට අවකාශයක් නොමැති බව ගොවීන් සඳහන් කරන ලදී. මෙය කෘෂිකාර්මික වැඩසටහන් බැලීම සඳහා පවතින ප්‍රධාන බාධාවක් බව ඔවුන්ගේ අදහස විය.

අධ්‍යාපනය ලබන වයසේ පසුවන දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවලට බාධා වීම නිසා තමන් කැමති වුවත් රූපවාහිනිය හා එහි වැඩසටහන් නැරඹීම සීමා කර ඇති බව 91%ක් ගොවීහු ප්‍රතිචාර දැක්වූ හ. නිවසේ වැඩිහිටියන් දෙදෙනා විසින් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැඩි කාලයක් යොමු කිරීමේ අදහස ඇතිව රූපවාහිනී නැරඹීම සීමා කිරීම තමන්ගේ කැමැත්තට බාධාවක් බව ගොවීහු විසින් සඳහන් කළ හ.

ගොවීන් මුහුණ දෙන ප්‍රධාන බාධාවක් ලෙසින් සඳහන් කළේ, රූපවාහිනියට ආවේණික වූ බාධාවක් වූ වැඩසටහන් විකාශය වන විනාඩි 15ක කාලය තුළ වෙළෙඳ දැන්වීම් සඳහා ද සැලකිය යුතු කාලයක් වැයවීමෙන් කෘෂිකාර්මික වැඩසටහන් ග්‍රහණය කර ගැනීමේ බාධාවක් පවතින බවයි. ප්‍රතිචාර දැක් වූ ගොවීන්ගෙන් 74%ක් මෙම තත්ත්වය සඳහන් කළ හ. මෙම වැඩසටහන් නැරඹීමේ දී ගෘහස්ත සාමජිකයින්ගේ රුචි අරුචිකම් බාධාවක් වන බවට 53%ක් ප්‍රතිචාර දක්වා ඇත. මෙහි දී, ගෘහස්ත සාමාජිකයින්ගේ රුචි අරුචිකම් යනු බොහෝ විට මෙම විකාශන කාලය තුළ දී වෙනත් නාලිකාවල යන වැඩසටහන් බැලීමට නිවසේ තරුණ දරුවන් පෙළැඹීමයි.

විවිධාකාර වූ විනෝදාත්මක තරංග වැඩසටහන් මෙන් ම ආකර්ශනීය සංගීත වැඩසටහන් වෙත තරුණ දරුවන්ගේ නැඹුරුව වැඩි වීම නිවසේ සිටින වැඩිහිටියන්ගේ කැමැත්තට බාධාවක් ව පවතින බව ගොවීන් මෙන් ම ක්ෂේත්‍රයට අයත් නිලධාරීන් ද පැවසූ හ. ඉතා සුළු පිරිසක් සඳහන් කළේ විදුලි සම්බන්ධතාවය එක්වර ම ඇන හිටීම වැනි ප්‍රාදේශීය හේතු නිසා ද හරියාකාරව වැඩසටහන් නැරඹීමට බාධා වන බවයි. කෙසේ වුව ද, කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී ගොවීන්ට පවතින මෙම බාධාවන් නිසා තමන්ට අවශ්‍ය වුව ද එම වැඩසටහන් නැරඹීමේ අවකාශය ගිලිහී ගොස් බව පැහැදිළි විය.

## 5.8 කෘෂිකාර්මික වැඩසටහන් ඵලදායකවීම සඳහා ගොවීන්ගේ අදහස් හා යෝජනා

ඉහත දී සාකච්ඡා කළ පරිදි වැඩසටහන් නැරඹීමේ දී ගොවීන්ට පවතින බාධාවන්ට මෙන්ම කෘෂිකාර්මික වැඩසටහන් ඵලදායකවීමට කුමන පිළියම් යෙදිය යුතුදැයි යන්න පිළිබඳ ගොවීන්ගෙන් ම අදහස් හා යෝජනා ලබා ගැනීම අධ්‍යයනයේ එක් අරමුණක් විය. ඒ අනුව කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන් විසින් මේ සඳහා විවිධ වූ අදහස් හා යෝජනා එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරන ලදී. එම අදහස් ප්‍රතිශත විශ්ලේෂණයක් ලෙසින් වගු අංක 5.9 න් පැහැදිලි කර තිබේ.

**වගු අංක 5.9: කෘෂිකාර්මික වැඩසටහන් ඵලදායක වීම සඳහා ගොවීන්ගේ අදහස් හා යෝජනා**

| ප්‍රයෝජන | ගොවීන් සංඛ්‍යාව **n=242** | |
|---|---|---|
| | ප්‍රතිචාර සංඛ්‍යාව | % |
| විකාශන කාලය සඳහා රාත්‍රී 9-10 අතර කාලයක් තෝරා ගැනීම | 238 | 98% |
| වැඩසටහන් විකාශන කාල පරාසය විනාඩි 15ට වඩා දීර්ඝ කිරීම | 230 | 95% |
| වැඩසටහන් අතරතුර කාලයේ අනවශ්‍ය ලෙස වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය වීම අඩු කිරීම | 208 | 85% |
| තරුණ පරපුර ආකර්ශනය කරගත හැකි අයුරින් වැඩසටහන් සකස් කිරීම | 201 | 83% |
| වැඩසටහන් විකාශය වන වේලාවන් පිළිබඳ නිසි පරිදි පූර්ව ප්‍රචාරණයක් අවශ්‍ය වීම සහ වැඩසටහන් ගැන ගොවීන් දැනුවත් කිරීම | 198 | 82% |
| නිෂ්පාදන අලෙවිය හා අලෙවි මාර්ග පිළිබඳ තොරතුරු වැඩි වශයෙන් ඉදිරිපත් කිරීම | 178 | 74% |
| දුෂ්කර ගොවි ගම්මානවල ඒකරාශීව පවතින අත්දැකීම් වැඩසටහන්වලට යොදා ගැනීම | 160 | 66% |
| යම් එක් බෝගයක් රෝපණ අවස්ථාවේ සිට අස්වනු නෙළන අවස්ථාව දක්වා වූ කාලයේ විවිධ අවස්ථා ගැන දැනුම වැඩසටහන් හරහා ලබා දීම | 140 | 58% |
| වැඩසටහනකින් විකාශය වන දැනුම හා තොරතුරු පුවත්පත්, සඟරා හෝ සී.ඩී. තැටි මඟින් නැවත ලබා ගත හැකි ලෙස සකස් කිරීම | 122 | 50% |

* ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාවට අනුව ප්‍රතිශතය ගණනය කර ඇති බැවින් එකතුව 100 ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2011

ගොවීන්ගේ ප්‍රතිචාරයන් අනුව කෘෂිකාර්මික වැඩසටහන් ඵලදායක වීම සඳහා ප්‍රධාන නිර්ණායකයන් 3ක් යටතේ ගොවීන් තම අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඇති බව පෙනේ. ඒ අනුව, විශේෂයෙන් ම විකාශන වේලාව හා කාල පරාසයත්, වැඩසටහන් හි අන්තර්ගතයත්, වැඩසටහන් නැරඹීමේ දී පවතින බාධාවන් පිළිබඳවත් සැලකිලිමත් වෙමින් ඔවුන් තම අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඇත.

කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් බහුතර පිරිසක් විකාශන කාලය හා කාල පරාසය පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඇත. මෙම පිරිසෙන් 98%ක් ප්‍රතිචාර දක්වා ඇත්තේ, වැඩසටහන් විකාශය වන වේලාව රාත්‍රී 9.00-10.00 අතර වන්නේ නම් වඩාත් සුදුසු බවයි. උදෑසන 6.00-7.00 හෝ සන්ධ්‍යා කාලයේ 6.00-7.00 හෝ කාල පරාසයක් මේ සඳහා යොදා ගත හොත් කෘෂිකාර්මික වැඩසටහන් නිතර ම නැරඹීම සිදු කළ නො හැකි බව ඔවුන්ගේ අදහස විය. විශේෂයෙන් රාත්‍රී 9.00-10.00 අතර කාලය වඩාත් සුදුසු බව ගොවීන් වැඩි දෙනෙකුගේ අදහස විය. මෙම කාලය පුංචි දරුවන් සිටින නිවසක වුවත් නිදහස් කාලයක් බවත් නිවසේ සාමාජිකයින්ගෙන් වුව ද බාධාවක් නොවන වේලාවක් බවත්, ගොවීන් සඳහන් කළහ. එසේ ම, නිවසේ කාර්ය බහුලභාවයෙන් තොර වූ කාලය ද මෙය බැව් සඳහන් විය. එසේ ම තමන්ට රුචි පරිදි වැඩසටහන් නැරඹීමේ අවස්ථාව ද මෙම කාලය තුළ දී පවතින බව ඔවුහු සඳහන් කළහ.

කාල පරාසය විනාඩි 15ක් ප්‍රමාණවත් නොවන බවට 95%ක් ප්‍රතිචාර ලැබී තිබිණි. විනාඩි 15 තුළ වෙළෙඳ දැන්වීම් ද ප්‍රචාරය වන බැවින් දැනුමක් හරියාකාරව ලබා ගැනීමට කාලය ප්‍රමාණවත් නොවන බව ගොවීන් සඳහන් කළහ. "ගොවිබිමට අරුණළු" වැඩසටහනට වෙන් කර ඇති කාලය කොහෙත් ම ප්‍රමාණවත් නොවන බව ගොවීන් සඳහන් කළහ. ඊට හේතුව වන්නේ එම වැඩසටහනෙ හි නව තාක්ෂණික දැනුම මෙන් ම සියලු වගාවන්ට අදාළ වූ දැනුම ලබා දීම සිදු කෙරෙන බැවින් පූර්ණ ලෙස එම දැනුම ලබා දීමේ කාර්යය සඳහා කාලය හරස් වන බව ගොවීන්ගේ හැඟීම වීමයි. එම වැඩසටහනට මෙන්ම අනෙකුත් වැඩසටහන් සඳහා ද වෙන් කර ඇති කාල පරාසය ප්‍රමාණවත් නොවන බව ගොවීන්ගේ අදහස විය. ඒ අනුව, ගොවීන්ට පහසු වේලාවක් හා ඔවුන් අපේක්ෂා කරන කාල පරාසයක් සහිතව මෙම වැඩසටහන් සැලසුම් කර විකාශය වන්නේ නම් පවතින තත්ත්වයට වඩා උසස් ලෙස වැඩසටහන් ඵලදායක වන බව අධ්‍යයනයේ දී තහවුරු විය.

වැඩසටහන්වලට බාධාවන අයුරින් අතරතුර කාලයේ ප්‍රචාරය වන වෙළෙඳ දැන්වීම් අඩු කළ යුතු බව 85%ක් යෝජනා කර ඇත.

එසේ ම වර්තමානයේ තරුණ පරපුර ගොවිතැනින් වඩාත් දුරස්වීමේ ප්‍රවණතාවයක් පවතින බැවින් මාධ්‍ය හරහා ඔවුන්ව කෘෂිකර්මාන්තය වෙත පොළඹවා ගැනීමට මෙය සුදුසු ක්‍රමයක් බැවින් ඔවුන් ආකර්ෂණය කරගත හැකි ආකාරයෙන් කෘෂිකාර්මික වැඩසටහන් සකස්වීම සුදුසු බවට 83%ක් සඳහන් කළහ.

කෘෂිකාර්මික වැඩසටහන් විකාශය වන වේලාවන් පිළිබඳව විධිමත් පූර්ව ප්‍රචාරණයක් අවශ්‍ය බවත්, පූර්ව ප්‍රචාරණයක් මගින් මෙම වැඩසටහන් නැරඹීමට ගොවියාට පෙළඹුමක් ඇති වන බවත්, එසේම වැඩසටහන් ගැන ගොවීන් දැනුවත් කිරීමද සිදු විය යුතු බවත්, 82%ක් ප්‍රතිචාර දැක්වූහ.

නිෂ්පාදන අලෙවිය හා අලෙවි මාර්ග පිළිබඳව දැනට පවතින දැනුවත් කිරීම්වලට අමතරව තව වැඩි වශයෙන් නව මාර්ගයන් පිළිබඳ තොරතුරු හා දැනුම ලබාදීම සුදුසු බව 74%ක් සඳහන් කළහ.

ඉහත ප්‍රධාන කරුණුවලට අමතරව, දුෂ්කර ගොවි ගම්මානයන් හි ගොවීන් හා කේන්ද්‍රගතව පවතින පරිසර හිතකාමී කෘෂිකාර්මික අත්දැකීම් නව ගොවීන් වෙත ලබාදීම සඳහා මෙම වැඩසටහන් ප්‍රයෝජනයට ගත හැකි බවත්, එසේ ම යම් බෝගයක් රෝපණ අවස්ථාවේ සිට අස්වනු නෙළන අවස්ථාව දක්වා වූ කාලයේ විවිධ අවස්ථා ගැන දැනුම ලබාදීමෙන් ප්‍රායෝගිකවම ගොවියාට සමීප වැඩසටහන් ලෙස මේවා සකස් කරගත හැකි බවත් ගොවීන්ගේ අදහස් හා යෝජනා අතර විය.

හයවැනි පරිච්ඡේදය

# සොයා ගැනීම්, නිගමන හා යෝජනා

## 6.1 හැඳින්වීම

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ අභිලාෂයෙන් ජනමාධ්‍ය ක්‍රමෝපායයන් භාවිතා කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ජාතික රූපවාහිනී නාලිකාව හරහා විකාශය කෙරෙන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන් දක්වන්නා වූ ප්‍රතිචාර පිළිබඳ සිදු කෙරුණු අධ්‍යයනයෙන් ලද සොයා ගැනීම් හා එම සොයා ගැනීම් ආශ්‍රිතව එළැඹුණු නිගමන හා යෝජනා පිළිබඳ මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ.

## 6.2 සොයා ගැනීම්

- අධ්‍යයනය සඳහා මුහුණ දුන් සමස්ත ගොවීන්ගෙන්(330) ජාතික රූපවාහිනී නාලිකාව 97%ක් නරඹනු ලබයි. එයින්(321) 75%ක් ම එහි විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් නරඹති.

- කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැති ගොවීන් සංඛ්‍යාව 25%කි. එම ගොවීන් කෘෂිකාර්මික වැඩසටහන් නරඹන්නේ නැති වීමට දැක් වූ හේතු අතර ප්‍රධාන වූයේ, නිවසේ සහ දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවලට බාධා වන බැවින් රූපවාහිනී වැඩසටහන් නැරඹීමෙන් බැහැරව සිටීම(78%), දෛනික කාර්යබහුලත්වය නිසා කෘෂිකාර්මික වැඩසටහන් විකාශය වන වේලාව වෙන් කරගැනීමේ අපහසුව(53%), සහ කෘෂිකාර්මික වැඩසටහන් විකාශය වන වේලාව පිළිබඳ දැනුවත්භාවයක් නොමැති වීම(48%) යනාදියයි.

- කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 86%ක් ඒ පිළිබඳ දැනුවත් වී ඇත්තේ අහම්බෙනි. එයට අමතරව සුළු පිරිසක් කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර මාර්ගයෙන්, අසල්වැසියන් හා ගොවි සංවිධාන නිලධාරීන් මාර්ගයෙන් හා කෘෂිකාර්මික පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමෙන් දැනුවත් වී ඇත.

- කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 57%ක් අයත් වන්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) දක්වා උගත් පිරිසට වේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) සමත්, උසස් පෙළ දක්වා, සහ උසස් පෙළ සමත් යන කාණ්ඩයන්ට අයත් වූ ගොවීන් පිළිවෙළින් 10%, 16%, සහ 12%ක් විය.

- කෘෂිකාර්මික වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් අවු. 45-60 අතර සහ 60 ට වැඩි වයස් කාණ්ඩයට අයත් වූවන් (32%+36%) 68%කි. අවු. 30 ට අඩු තරුණ කාණ්ඩයට අයත් වූ ගොවීන් 9%කි.

- අධ්‍යයනය සඳහා යොමු වූ සමස්ත ගොවීන්ගෙන් බහුතරයකගේ (92%) වගා කටයුතුවල නියැළීමේ ප්‍රධාන පරමාර්ථය වී තිබුණේ අලෙවිය හා පරිභෝජනය යන අරමුණු දෙකය. මහා පරිමාන වශයෙන්



පුස්තකාලය
LIBR...
පු අා

නොවන, පරිභෝජනය සඳහා පමණක් අරමුණු කොට ගෙන වගාවෙහි නියැළෙන ගොවීන් ද සමස්ත නියැදියෙන් 7%ක් විය.

- අධ්‍යයනයට ලක් වූ සමස්ත ගොවීන්ගෙන් 52.4%ට ම අවශ්‍ය වී තිබුණේ වගාවන්ට වැළඳෙන රෝග හා පළිබෝධ පාලනය කිරීම පිළිබඳ දැනුම හා තොරතුරු ය. විවිධ වගා ක්‍රම පිළිබඳ දැනුම අවශ්‍ය බව 50%ක් ප්‍රතිචාර දැක් වූ අතර කාබනික පොහොර නිෂ්පාදනය හා යෙදීම පිළිබඳ වූ දැනුම 45%ට අවශ්‍ය බැව් ප්‍රතිචාර දක්වන ලදී.

- ජාතික රූපවාහිනී නාලිකාව නරඹන ගොවීන් රූපවාහිනී වැඩසටහන් අතරින් ප්‍රවෘත්ති විකාශයට කැමති බවට 97%ක් ප්‍රතිචාර දක්වා ඇත. දෙ වනුව කැමැත්ත ප්‍රකාශ කර ඇත්තේ ටෙලිනාට්‍ය හා විනෝදාස්වාදය සපයන වැඩසටහනවලට(89%)වන අතර තෙ වනුව කැමති කෘෂිකාර්මික වැඩසටහන්වලට(75%) යනුවෙන් ප්‍රතිචාර දක්වා ඇත.

- කෘෂිකර්ම වැඩසටහන් "නිතරම" (33%) හා "කලාතුරකින්" (26%) නරඹන ගොවීන් සංඛ්‍යාවට සාපේක්ෂව "ඉඳහිට" නරඹන සංඛ්‍යාව (41%) ඉහළ ය. වැඩසටහන් 4ම නරඹන ගොවීන් පිළිබඳ සැලකීමේ දී "ගොවි බිමට අරුණළු" නරඹන සංඛ්‍යාව වැඩි ය. එය වැඩසටහන් නරඹන සමස්ත ගොවීන්ගෙන් (242) 34%කි.

- විකාශය වන වැඩසටහන් හතරෙහි ම භාෂා ශෛලීය, ඉදිරිපත් කරන දැනුම හා තොරතුරුවල කාලීනභාවය, ඉදිරිපත් කිරීමේ විලාසය හා ඉදිරිපත් කරන්නාගේ ශෛලීය වඩාත් සුදුසු බවට සමස්ත ගොවීන්ගෙන් 80%ට වැඩි පිරිසක් ප්‍රතිචාර දැක්වූ හ. එසේ වුව ද වැඩසටහන් තුළ සංශෝධනය කළ යුතු අංගයක් බවට ගොවීන් වැඩි ප්‍රතිචාරයක් දැක්වූයේ වැඩසටහන් හි වේලාව හා කාල පරාසය යි. එනම් පිළිවෙළින් "ගොවිබිමට අරුණළු" සඳහා 76%ක් ද "මිහිකත දිනුවෝ" සඳහා 84%ක් ද "රිවිදින අරුණැල්ල" සඳහා 69%ක් ද, "සැගවුණු කතවනු" සඳහා 71%ක් ද, වශයෙන් වැඩසටහන් හි වේලාව හා කාල පරාසය වෙනස් කළ යුතු බවට ප්‍රතිචාර දැක්වූ හ.

- අධ්‍යයන ප්‍රදේශය තුළ වැඩසටහන් නැරඹූ සියලු දෙනාට ම ඒවා ප්‍රයෝජනවත් හා වඩාත් ප්‍රයෝජනවත් වී ඇති අතර වඩාත් ප්‍රයෝජනවත් යැයි කියූ පිරිස 35%ක් වන අතර ප්‍රයෝජනවත් වූ බව සඳහන් කළ පිරිස 65%කි.

- බෝග වගා කිරීමේ දී විවිධ වූ වගා ක්‍රමයන් අත්හදා බැලීමත්, ක්‍රියාත්මක කිරීමත් සඳහා ලබාගත් දැනුම ප්‍රයෝජනවත් වූ බවට ගොවීන් 88%ක් ම ප්‍රතිචාර දැක්වූ හ. එසේ ම, කාබනික පොහොර නිෂ්පාදනය හා යෙදීම පිළිබඳ දැනුම ලැබුණු බව 75%ක් ප්‍රතිචාර දක්වා ඇති අතර වගාවන්ට වැළඳෙන පළිබෝධ හා රෝග පාලනය සඳහා දැනුම ලැබුණු බවට 69%ක් ප්‍රතිචාර දැක්වූ හ.

- කෘෂිකාර්මික වැඩසටහන් නැරඹීමේ දී යම් යම් බාධාවන් පවතින බව ගොවීන්ගෙන් 74%ක් ප්‍රතිචාර දැක්වූ හ. වැඩසටහන් විකාශය වන වේලාව නිවසේ කාර්ය බහුලභාවය වැඩිවීමෙන් එය නැරඹීමට අවකාශය නො ලැබීම 96%ක් ද දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා වීම 91%ක් ද අතරතුර කාලයේ වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය වීම බාධාවක් බව 74%ක් ද ගෘහස්ත සාමාජිකයින්ගේ රුචි අරුචිකම් බාධාවක් වීම 53%ක් ද වශයෙන් බාධා පවතින බව සඳහන් කරමින් ගොවීහු ප්‍රතිචාර දැක්වූ හ.
- කෘෂිකාර්මික වැඩසටහන් ඵලදායක වීම සඳහා අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන් කළ යෝජනා පිළිබඳ සැලකිල්ලමත් වීමේ දී 98%ක් ප්‍රතිචාර දැක්වූයේ විකාශන කාලය රාත්‍රී 9.00-10.00 අතර කාලය විය යුතු බවයි. කාල පරාසය ද විනාඩි 15 ට වඩා දීර්ඝ කළ යුතු බවට 95%ක් ප්‍රතිචාර දැක්වූ හ. එසේ ම, අතරතුර කාලයේ වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය අඩු කළ යුතු බවටත් (85%), තරුණ පරපුර ආකර්ෂණය කරගත හැකි පරිදි වැඩසටහන් සකස් විය යුතු බවටත් (83%), වැඩසටහන් විකාශනය වන වේලාවන් පිළිබඳ නිසි පරිදි පූර්ව ප්‍රචාරණයක් සිදු කිරීම සහ වැඩසටහන් ගැන ගොවීන් දැනුවත් කිරීමත් කළ යුතු බවට (82%) ගොවීන් විසින් අදහස් දක්වන ලදී,

### 6.3 නිගමන

අධ්‍යයන ප්‍රදේශය තුළ රූපවාහිනිය නරඹන ගොවීන්ගෙන් 75%ක් ම කෘෂිකාර්මික වැඩසටහන් නරඹා තම ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා ගෙන, එම දැනුම ප්‍රායෝගිකව අත්හදා බලා ප්‍රයෝජන ලබා ගෙන ඇත. වර්තමානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ජාතික නාලිකාව හරහා විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් විකාශය වන වේලාව සහ කාල පරාසය හැර ඒ හරහා ලබා දෙන තොරතුරු හා දැනුම, භාවිත භාෂාව, ඉදිරිපත් කරන විලාසය, ඉදිරිපත් කරන්නාගේ ශෛලිය පිළිබඳ ගොවීන් තෘප්තිමත් බව නිගමනය කළ හැකි ය. එසේ වුවත්, කෘෂිකර්මාන්තය වෙත ගොවීන්ගේ ආකර්ෂණය තව දුරටත් වැඩි කර ගත හැකි පරිදි මෙම වැඩසටහන් හි අන්තර්ගතය සඳහා නවාංග ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව අධ්‍යයනය පෙන්වා දෙයි. ගොවීන් සඳහා මෙම වැඩසටහන් හි ඵලදායකත්වය වඩාත් තීව්‍ර කිරීමට නම් ගොවියාගේ පාර්ශවයෙන් ඔවුන්ට නැරඹීමට හැකි සුදුසු ම කාලයක වැඩසටහන් විකාශය විය යුතුය. ජනමාධ්‍යයක් ලෙසින් රූපවාහිනී මාධ්‍ය පිරිසක් ඉලක්ක කොටගත් (Mass Media) මාධ්‍යයකි. එවැනි තත්ත්වයක දී පුද්ගලයින්ව වැඩසටහන් සඳහා අවනත කර ගැනීම හා ආකර්ෂණය කර ගැනීම ඉතා වැදගත් බැවින් පුද්ගලයාගේ පහසුව අභිරුචිය හා විචිත්‍රභාවය පිළිබඳ වඩාත් සැලකිලිමත් විය යුතු ය. කෘෂිකාර්මික වැඩසටහන් තවදුරටත් ඵලදායක වීමට නම් රාත්‍රී 9.00 - 10.00 අතර මෙම වැඩසටහන් විකාශය විය යුතු බව ගොවීන්ගෙන් 98%ක් යෝජනා කරන අතර එයින් ගම්‍ය වන්නේ, ටෙලිනාට්‍ය හා වෙනත් විනෝදාත්මක වැඩසටහන් ද නැරඹීමේ අවකාශය ඔවුන් හට අවශ්‍ය බවත්, ඒ අතරට කෘෂිකාර්මික වැඩසටහන් ද විකාශය වන්නේ නම් වඩාත් උචිත බවත් ය. ඒ අනුව ගොවීන්ගේ පහසුව හා අභිරුචිය පරිදි කෘෂිකාර්මික වැඩසටහන් හි විකාශන වේලාවත් විකාශන කාල පරාසයත් සංශෝධනය කළ යුතු ය. එසේ ම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

කෘෂි වැඩසටහන් හි විකාශන වේලාවන් පිළිබඳ පූර්ව ප්‍රචාරණයක් සිදුකිරීමත්, වැඩසටහන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමත්, නවාංග ඇතුළත් කිරීමත් මගින් කෘෂි වැඩසටහන්, ගොවීන් අතර වඩාත් ප්‍රචලිත කළ හැකි බවට නිගමනය කළ හැකි ය.

## 6.4 යෝජනා

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත රූපවාහිනියේ ජාතික නාලිකාව හරහා විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් සහ එම නාලිකාව හරහා විකාශය වන අනෙකුත් කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳව ද සැලකිල්ලමත් වෙමින් සිදු කෙරුණු අධ්‍යයනයෙන් ලද මූලික සොයා ගැනීම් හරහා ලද නිගමනයන්ට අනුව මෙම කෘෂිකාර්මික වැඩසටහන් හි ඵලදායකත්වය තවදුරටත් වර්ධනය කර ගැනීමට පහත සඳහන් මූලික යෝජනා ඉවහල් වනු ඇත.

01. ගොවීන්ට සුදුසු හා ඔවුන් අපේක්ෂා කරන වේලාවක කෘෂිකාර්මික වැඩසටහන් විකාශය කිරීම. මේ සඳහා,

- වැඩි ඉල්ලුමක් සහිත විකාශන වේලාවක් (රාත්‍රී 9.00 – 10.00 අතර) රූපවාහිනියේ ජාතික නාලිකාවෙන් වෙන් කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කිරීම.

02. වැඩසටහන විකාශය වන කාල පරාසය දීර්ඝ කිරීම.

- සුදුසු වේලාව සකස් කිරීමෙන් අනතුරුව වැඩසටහන ක්‍රියාත්මක වන කාල පරාසය ද විනාඩි 15 ට වඩා දීර්ඝ කිරීමෙන් වැඩි දැනුමක් ගොවියාට ලබා දිය හැකිය. වැඩසටහන ආරම්භය සමග ම ඉතා ඉක්මණින් අවසන් වීමෙන් අපේක්ෂිත යම් දැනුමක් සවිස්තරාත්මකව ගොවියාට ප්‍රවේශ කිරීම අපහසු වේ. ඊට හේතුව වන්නේ සන්නිවේදනයේ දී අදාළ දැනුම මනසට උසස් ලෙස ගෝචර කර ගැනීමට අවශ්‍ය පරිදි මනස සකස් කර ගැනීමට ද යම් කාල සීමාවක් ගත වන නිසාය.

03. කෘෂිකාර්මික වැඩසටහන් විකාශය වන කාල පරාසය තුළ වෙළෙඳ දැන්වීම් සඳහා කාලය වෙන් කිරීම අවම කිරීම.

- සන්නිවේදනයේ දී ග්‍රාහක අවධානය හා ආකර්ශනය ඉතා වැදගත් වේ. විශේෂයෙන් දැනුම ලබාදීමේ ක්‍රියාවලියේ දී මෙම තත්ත්වය වඩා වැදගත් වේ. එබැවින්, ගොවියාගේ අඛණ්ඩ අවධානය හා ආකර්ශනය බිඳෙන අවස්ථා අවම කිරීමෙන් වැඩසටහන වඩාත් ඵලදායී වේ.

04. ජාතික නාලිකාවේ කෘෂිකාර්මික වැඩසටහන් විකාශය වීම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කරීම. මේ සඳහා,

- නියැදියෙන් 97%ක් ම ඔවුන් විසින් නරඹන වැඩසටහන් අතරින් වඩාත් කැමති වැඩසටහන ලෙස සඳහන් කර ඇත්තේ ප්‍රවෘත්ති විකාශයට බැවින් ප්‍රවෘත්ති විකාශය කෙරෙන අවස්ථාවේ කෘෂිකාර්මික වැඩසටහන් ගැන තිරයේ ප්‍රදර්ශනය කිරීම.

- ගොවිජන සේවා මධ්‍යස්ථානවල කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම
- වර්තමානයේ ක්‍රියාත්මක "දිවිනැගුම" වැඩසටහන සමග කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හරහා ගොවීන් දැනුවත් කිරීම.

05. අන්තර්ගතය සඳහා නවාංග ඇතුළත් කිරීම

- විශේෂයෙන්, තරුණ පරපුර ගොවිතැනට ආකර්ශනය කර ගත හැකි පරිදි වැඩසටහන් සඳහා නව විශේෂාංග එක් කිරීම.
- ගොවිතැනින් දිවි සරු කර ගත් තරුණ පිරිස් සොයා ඔවුන්ගේ අත්දැකීම් වැඩ වශයෙන් ඇතුළත් කර වැඩසටහන් සකස් කිරීම සහ විරැකියාවෙන් පෙළෙන තරුණ පරපුරට ඔවුන් හා සම්බන්ධ විය හැකි මාර්ග සකස් කිරීම.
- නව තාක්ෂණය හා බද්ධ වූ සන්නිවේදන ක්‍රමවේදයන් හරහා නව වෙළෙඳ රටාවන් හා ප්‍රවේශයන් අනුගමනය කරන තරුණ ගොවීන්ගේ අත්දැකීම් සොයා බලා. එම ක්‍රමවේදයන් ක්‍රමයෙන් ග්‍රාහක තරුණ ගොවීන්ගේ අත්දැකීම් බවට පත් කිරීම.

"24092

## ආශ්‍රිත ග්‍රන්ථ


අත්තනායක, බන්දුල. (1999). සංවර්ධන සන්නිවේදනය හා සන්නිවේදන ව්‍යාප්ති සැලසුම්කරණය. ආර්ය ප්‍රකාශකයෝ. බෞද්ධ විද්‍යාල මාවත. වරකාපොල.

කරුණානායක. නන්දන. (2003). මානව සන්නිවේදනය. සරස්වතී ප්‍රකාශන. 2/60. රවුම් පාර. දිවුලපිටිය.

ලියනගේ. චමිල. 2010. කෘෂිකාර්මික සංවර්ධනය හා ප්‍රාදේශීය ගුවන් විදුලිය. පළමු මුද්‍රණය. සඳකඩ පහන ප්‍රකාශන. ඇඹරළුව දකුණ. වැලිවේරිය.

Abbas Mazher, Shikh A.D, Muhammad Sher and Ashfaq Muhammad, (2001),

Role of Electronic Media in the Adoption of Agricultural technologies by Farmers in the Central Punjab, Pakistan.

Adams, M.E (1982), Agriculrural Extension in Developing Countries, Intermediate Tropical Agriculture Series, Singapore.

CARE International Sri Lanka, (2006), Dry zone, Agricultural Development Project, Project outline.

Desai M. V, (1976), Communicating With Rural India.

Egbule E. Patrick, and Mathews Edna Njoku C, (2003), Mass Media Support for Adult Education in Sothern Nigeria.

Gunerathne A. Shelton, (1976), Modenisation and Knowledge; A Study of Four Ceylonese Villages, Asian Mass Communication Research and Information Center.

Household Income and Expenditure Survey Final report 2009/2010 Report of Census and Statistics- Sri Lanka




පුස්තකාලය
LIBRARY
HARTI

Mahaliyanarachchi, Rohana, (2003), Basics of Agricultural Extension, Chathura Printers, Wellampitiya.

Mahendra, Sunanda, (1986). Memory and Message (Notes on Communication; Development and Growth of Mass Communication in Sri Lanka).

Mohammad Nazari Reza, Hassan Md Salleh, Bin Hj, (2011), The Role of Television in the Enhancement of Farmers Agricultural knowledge, http://www.academicjournals.org/ajar/PDF/pdf2011/18%20Feb/Nazari%20and%20Hassan.pdf.

Singh and Harque, (1970), Distortion of Agricultural Information Occurring from District to Village Level, Intensive Agricultural Development Program.

Umeh G.N, (2008), Assessment of Mass Media Usage for Farm Information by Farmers in AFIKPO LGA of EBONYI State: Implication for Information and Communication Technology Application to Agricultural Technology Transfer.

Wanigarathne R. D, (1978), The Study of Communication Flow in Selected Villages in Sri Lanka, joint publication of the Agrarian Research and Training Institute and The Communication Statergy Project of Ministry of Information and Broadcasting.

Wickramasinghe Lakshman, (1979), The Diffusion of Information in Agricultural Innovations in the Paddy Sector of Sri Lanka; Implications for a Communication Strategy.

http://en. wikipedia.org/wiki/kurunegala District (verified 12th March 2011)

24092

තැ.පෙ. 1522
කොළඹ,
ශ්‍රී ලංකාව.

දු.අ. 94112696981
94112696437
ෆැක්ස්: 94112692423.

විද්‍යුත් තැපැල්:library@harti.lk
වෙබ් : www.harti.gov.lk

ISBN 978-955-612-140-7
9789556121407

Rs. 320/-

National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara
2. Date Scanned : 02/06/2017
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K. P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*